# බෞද්ධාලෝකය

වෙසක් - පොසොන්

## ලිපි සරණීය


| | | | |
|---|---|---|---|
| • ධම්මපදය | - | | 2 |
| • වෙසක් පුන් සඳ උදාවෙද්දී | - | චන්ද්‍රසිරි වැලිගමගේ | 3 |
| • අපේ ජාතක පොත් වහන්සේ | - | ලොකුබණ්ඩාර මුණසිංහ | 6 |
| • බුදුරජාණන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කිරීම... | - | ඩබ්ලිව්. දිසානායක හේරත් | 9 |
| • මිනිසත් බව | - | පූජ්‍ය පියදස්සී හිමි | 13 |
| • බුදු සමයෙන් ඉගැන්වෙන සාමයේ පණිවුඩය | - | ගීතිකා සෙනෙවිරත්න | 19 |
| • අනුරාධපුර නගරය දෙව් පුරයක් ලෙස... | - | ආචාර්ය සෙනරත් දිසානායක | 22 |
| • නිවන් දකින තුරුම නැවත නැවතත් උපදින... | - | පූජ්‍ය දුණුකේවල ධම්මවීර හිමි | 26 |
| • සාරිපුත්‍ර ස්ථවිර මාතෘ ප්‍රේත වස්තුව | - | පූජ්‍ය මිල්ලෑවේ උපසේන හිමි | 31 |
| • මතක භක්ත ජාතකය | - | පූජ්‍ය මකුල්දල උපරතන හිමි | 33 |
| • වෙසක් පහන් කූඩුවේ ඉතිහාසය.... | - | ඉන්දික රුවන් හේවගේ | 35 |
| • වෙසක් පෝය දින සිදුවූ ත්‍රිවිධ මංගල්‍ය | - | එන්.එල්. මාතෘදාස ලියනගේ | 37 |
| • වෙසක් (කාව්‍ය) | - | ජයසිරි අල්විස් | 41 |
| • බෞද්ධාලෝක පුවත් | | | 42 |



**සංස්කාරක මණ්ඩල උපදේශකත්වය**
ආචාර්ය කලාසූරි ප්‍රණීත් අභයසුන්දර

**සංස්කාරක මණ්ඩලය**
සිරිල් ගුණසේකර
ඉෂාන් එදිරිසූරිය
ආචාර්ය ප්‍රේමසිරි ගමගේ
දම්සිරි අජිත්

**කවරයේ චිත්‍රය**
එච්.ඩී. සසන්ක සිතුරුවන් ශිෂ්‍යයා



**ප්‍රකාශනය**
ප්‍රචාරක කටයුතු පිළිබඳ ජාතික මණ්ඩලය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

**පිටු සැකසුම**
ෆාස්ට් ඇඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

**මුද්‍රණය**
ෆාස්ට් ප්‍රින්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10.



**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
දුරකථන : 011 2691695 / 011 2688517 / 011 2667017
ෆැක්ස් : 011 2688517 web : www.acbc.lk
E-mail: acbc380@gmail.com

# "ධම්ම පදය" ජීවිතයට සම්බන්ධ කර ගනිමු

**යමක වග්ගය - භයවන ගාථාව**

**පරෙ ච න විජානන්ති - මයමෙත්ථ යමා මසෙ**
**යෙ ච තත්ථ විජානන්ති - තතො සම්මන්ති මෙධගා**

**අර්ථය :**

කලහකාරී මෝඩ පිරිස් අපි මැරෙමු යි කියා නොදනිති. යමෙක් මේ ටික දනිත් නම් ඒ හේතුවෙන් ඔවුන්ගේ කලහ සංසිඳේ.

**නිධාන කථාව :**

කොසඹෑ නුවර ඝෝසිත නම් ඉසුරුමත් නොමසුරු මහ සිටුතුමෙක් වෙසේ. තුනුරුවන් කෙරෙහි මහත් ශ්‍රද්ධා ඇති ඒ සිටුහු දැකුම් කටයුතු ඉතා මනරම් විහාරයක් කරවා බුදුරදුන්ට පිදූහ. ඒ විහාරය සිටුහුගේ නම මුල් කරගෙන ඝෝෂිතාරාමය යැයි හැඳුණුවේය.

ඒ වෙහෙර පන්සියයක් භික්ෂූන් වහන්සේලා හා පන්සිය සිසු සඟනට ගුරු වූ තෙර නමක්ද වෙසෙති. උන් වහන්සේලා සිල්වත්හුය. බොහෝ වියත්හුය. විනයධර හා ධර්මධර යැයි පසිඳු වූහ. විනයධරයෝ විනයෙහි මහා දැනුම් ඇත්තෝය. ධර්ම කථිකයෝ ධර්මයෙහි එසේම දැනුම් ඇත්තෝය.

ධර්මකථික ගුරු තෙරුන්ගේ නොසැලකීම නිසා වැසිකිළි බඳුනේ ඉතිරි වූ වතුර ටික ඉවත නොදමා තබා වැඩි නිසා, විනය රෙගුලාසියක් කඩ විය. විනය ධර තෙර එයට දොස් නැඟීය.

ඒ දොස පතළ විය. ඒ දෙනමගේ අසමගියට එය මුල්විය. සිසුහු ද දායකයෝ ද එයින් දෙකට බෙදුණෝය. බුදුරදුහු තෙවන වර දක්වා ඔවුන් සමගි කරන්නට අවවාද කළ සේක. මැදහත් දායකවරු ද බොහෝ වෙහෙසුණහ. ඒ කිසිවෙකුට දෙපිරිස අවනත නොවූයෙන් අසමගිය තහවුරු විය.

ඔවුන්ගේ කලහය නොසන්සිඳෙන බව දුටු බුදුරදුන් හුදෙකලාවම පාරාලෙය්‍ය වනයට වැඩිසේක. ඒ මහ වැසි ඇත් රජෙකුගේ උපස්ථානයෙන් බුදුරදුන් එහි තෙමසක් විසූ සේක. ඇත් රජ සුදුසු කලට සිසිල් හා උණු පැන් පිළිගන්වයි. දානය පිණිස පලතුරු ද පුදයි. සැප විහරණය ද සැලසීය. බුදුරදුහු නුදුරුගම ඇසුරු කොට වැඩ සිටිසේක. සඟුන් අතුරෙන් පැන නැගි මේ විවාදය හා භේදය රජයෙන් කෙරෙන දඬුවමකින් හෝ වැසියන්ගෙන් කෙරෙන තරවටුවකින් හෝ විසඳීමට පිළිවෙළක් නොමැති විය.

එහෙත්, එයට උපායක් වශයෙන් දායකවරු දන්දීමේ හා පද සිරිත් පැවැත්වීම නොකළහ. බුදුරදුන් වනයට වැඩි නිසා ඇනුම් බැණුම් දෙඩුම් රහිතව කළ දඬුවමකි. එය කලහකරුනට නොඉවසිය හැකිවිය. වරද වැටහිණි. සියලු දෙනාම අවවාදයට නැමී වහා සමගි වූහ. බුදුරදුන් කමා කරවා ගත්හ. කලහය සංසිඳිණි.

බුදුරජාණන් වහන්සේ ඒ සන්සුන් වූ පිරිස අමතා දහම් දෙසා කලහ නොකිරීමේ අනුසස් වදාළ සේක.



# වෙසක් පුන් සඳ උදාවෙද්දී...

මෙයට වසර 2607 කට පෙර අද වැනි දවසක සිදුහත් බෝසතාණන් වහන්සේ විසින් පසක් කර ගන්නා ලද සම්බුද්ධත්වය මේ මහා විශ්ව සාගරය තුළත්, මේ විශ්ව සාගරයට ඔබ්බෙන් තවත් විශ්වයන් ඇතොත් ඒවායෙහිත් පහළ වූ දර්ශනිකයකු විසින් සාක්ෂාත් කරගන්නා ලද පරම සත්‍යයයි.

සසර කෙටි කර ගැනීම සඳහා ව්‍යවහාර කළ හැකි මේ උත්තම සත්‍යයේ සාරය පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යන ථෙරවාදී බුදු දහම පවත්වන එකම රට ශ්‍රී ලංකාව ලෙස හඳුන්වනු ලැබේ. දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යන චතුරාර්ය සත්‍යය ඔස්සේ නිවන් මග සාක්ෂාත් කර ගත් බුදුන්වහන්සේ තමන් පසක් කරගත් ඒ ධර්මය නිර්ලෝභීවත් සරලවත් බෙදා දී මනුෂ්‍යයන් සංසාරයෙන් එතෙර කළහ.

ලෝකයෙහි දීර්ඝ ඉතිහාසයක් ඇති නාමය සමගින් වූ සිදුවීම ලෙසට පැහැදිලිව දැක්විය හැකිවන්නේ ශ්‍රී දීපංකර බුදුරජාණන් වහන්සේගේ බුදු පාමුල දී, තමන්ට ලොව්තුරා බුද්ධත්වයට පත්වීමට කළා වූ ප්‍රාර්ථනාව අනුව, “සුමේධ තාපසතුමන්ට” දීපංකර බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛ දේශනාවෙන් නියත විවරණ ලබා දීමයි. එම අවස්ථාවේදී සසර භවදුක නතර කර ගැනීමට නිවන්මඟ පසක් කරගැනීමට තිබූ නිර්මල අවස්ථාව අතහැර දමා සකල ලෝක සත්වයා භව කතරින් මුදාගැනීමට තම සිත පරාර්ථකාමිත්වය පුරවාගෙන නැවත සුමේධ තාපසතුමාණන් භව ගමනට එක්විය.

සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරාම දස පාරමී ධර්ම සපුරා ගැනීමට අතිමහත් දීර්ඝ කාලයක් භව ගමනෙහි මැරි මැරී ඉපැද ඉපැදී අනන්ත අප්‍රමාණ වූ දුක්ගැහැට විඳ දරා ඇත්තේය. ලොව සිටින්නා වූ සියලුම සත්ව කොට්ඨාසයන් වල ඉපැදී මැරී ගොස් ඇත.

සිද්ධාර්ථ ගෞතම බෝසතාණන් වහන්සේ එක් ආත්ම භවයක දී වටු කුරුල්ලෙක්ව ඉපැදී සිටි ආත්ම භවයේහිදි වටු කුරුලු කූඩුව තිබුණා වූ ගන වනාන්තරය ලැව් ගින්නක් නිසා ගිනි ජාලාවක් බවට පත් වෙනවා දුටු වටු කුරුළු තෙමේ “සත්‍ය ක්‍රියාවකින් අධිෂ්ඨානයක් කළා. ලොව පහළ වූ සියලු බුදුවරුන්ගේ අනන්ත වූ බුදුගුණ බලයෙන් මෙමෙ ගිනි ජාලාව නිවී යත්වා මාගේ ජීවිතයත් අන්



සතුන්ගේ ජීවිතත් සුරැකෙත්වා කළා වූ ප්‍රාර්ථනාව අනුව, බුර බුරා නැගී ආ ගිනි ජාලාව නිවී ගොස් සියලු සත්වයන්ගේ ජීවිත බේරීමට එම සත්‍ය ක්‍රියා අධිෂ්ඨානය හේතු වී ඇත. වට්ඨක ජාතකය හා බැඳී ගියා වූ එම සිදුවීම අනුව පරිත්‍රාණ පොත් වහන්සේගේ අඩංගු වී ඇති වට්ඨක පිරිත, සියලු රෝග භය තුරන් කිරීමට සජ්ඣායනා කරන්නේ අප මහ බෝසතාණන් වහන්සේගේ එම අධිෂ්ඨාන බලය මුල්කර ගෙනය.

පරක් තෙරක් නොපෙනෙන සංසාර භව ගමනේ ඉතිහාසය පුරාම තමන් වහන්සේ සම්මා සම්බුද්ධත්වය ලැබීමේ ඒකායන අරමුණ පෙරදැරි කරගෙන ඇස්, ඉස්, මස්, ලේ, අඹු දරුවන්, සියලු දේපළ, රජ සැප, රජ මාළිගා දන් දී ඇත. සියලු දස පාරමී ධර්මයන් සපුරාගෙන තුසිත දෙව් ලොව ඉපැදී, තුසිත දෙව්ලොව සිට මනුලොව දඹදිව් තලයේ ලුම්බිනී සල් උයනේදී මහාමායා දේවියගේ කුසයෙන් ශක්‍ර දේවේන්ද්‍රයාගේ සුරතට සතර වරම් දෙවි රජවරු පිරිවරාගෙන සිද්ධාර්ථ කුමාර උප්පත්තිය සිදු වූ සේක. ශුද්ධෝදන මහ රජතුමා පියාණන් වූයේය.

විසිනව වසරක් පුරා සියලු රජ සැප විඳිමින් සිටි සිද්ධාර්ථ කුමාරයාණන්ගේ නෙත ගැටුණ රජ මාළිගයෙන් පිට සංචාර ගමන් හතරකදී මහලු වූ රෝගී වූ වේදනා විඳිනා මනුෂ්‍යයෙක් මහලු වූ විරූපී වී ඇති දුබල මනුෂ්‍යයාගේ, මියයන ලද මනුෂ්‍යයෙකුගේ මළ මිනියක්, හිස මුඩුකර කසාවත පොරවා ගත සන්සුන් ඉරියව්වෙන් ගමන් කරනා පරිදි පැවිදි තාපසයෙක්. මෙම දැකීම් මුල්කර ගෙන සිද්ධාර්ථ කුමාරයාගේ සිත සියලු රජ සැප අත්හැර දැමීමට සංසාර භවයේ ඇති නිස්සාර බව, නිත්‍ය නොවූ සැප සම්පත් අතහැර දැමීමට සියලු දුකට හේතුවන ඉපැදීම නතර කිරීමට තමන් වහන්සේගේ සිතට සිතුවිලි ආවර්ජනා වන්නට විය. මෙසේ දැඩි ලෙසට සිතට භව ගමනේ නිස්සාර වග, මෙනෙහි වන්නට විය. සියල්ල අත්හැර දැමීමට සිත් පහළ විය.

“රම්‍ය, සුරම්‍ය, සුභ” රජ මාළිගා තුනත්, සියලු රජ සැපත් , තම දේවිය යශෝධරා කුමරිය සහ එදිනම උපන් රාහුල කුමාරයාද අත්හැර දමා කන්ථක අසු පිටින් නික්ම ගොස් නේරංජනා නදියෙන් එතෙරව මහා වනාන්තරයට එක්ව සය වසරක් අතිමහත් දුෂ්කර ජීවිතයක් ගත කළහ.

රජ සැප විසිනව වසරක් විඳි සිද්ධාර්ථ රජ කුමාරයා සිද්ධාර්ථ තාපස තෙමේ ලෙසින් තම සිත එක් අරමුණකට ගැනීමට ආශාව හා බැඳීම සිතින් අත්හැරීමට මානසික උත්සාහයක නිරත විය. මේ නිසා ශරීරයට ශරීරයේ පැවැත්මට ඉමහත් දුෂ්කරතාවන්ට පත්වීමට සිදුවිය. මැසි මදුරු, උවදුරු, ශීත සුළං, වර්ෂාව, ආහාර, ජලය, මේ සියලු දෙයින් තම ශරීරයට අවැසි සියලු දේ ඉමහත් දුෂ්කර තත්වයකට මුහුණ දීමට සිදු විය.

ආශාව හා බැඳීම සිතින් අත්හැරීමට මානසික ශක්තිය උපදවා ගැනීමට ශරීර සන්තාපනයෙන් වැළකී සිටියහ. එනිසා තම ශරීරය මස් දියවී කෘශ තත්ත්වයට පත් වී ඇටසැකිල්ලක තත්වයට පත් විය. එසේ කළත් සිතට උපදින්නා වූ ආශාවන් හා බැඳීමේ ක්ලේශයන් සිතුවිලි සමුදාය ඉපැදීම, නිමක්

නොවන්නට විය. මෙසේ තවදුරටත් ක්‍රියා කිරීමෙන් මිය යෑම මිස සිතුවිලි සමුදාය නොනවතින බව අවබෝධ වන්නට ඇත. කයට දුක් දීමෙන් පලක් නොවන බව වටහාගත් සිද්ධාර්ථ තාපස තෙමේ තම ශරීරය පවත්වාගෙන යෑමට ආහාර පාන ගැනීමෙන් මධ්‍යම ප්‍රතිපදාව සුදුසු බව වටහා ගත් සේක. සිතින් ආශාව හා බැඳීමේ සිතුවිලි නතර කිරීමේ දැඩි අධිෂ්ඨානය පෙරදැරි කරගෙන සිතිවිලි අත්හැරීමට ගත් උත්සාහය කෙතරම් බලවත් ද? තම හිසට දස බිම්බරක් මාර ක්ලේශයන්ගේ සිතුවිලිවලින් තෙරපීමට පත්වූ තරම් මානසික පීඩනය බලවත්විය. දස බිම්බරක් යනු පෘථිවිය වගේ දහයක බරක් හිසට තෙරපීම වැනිය.

**"රම්‍ය, සුරම්‍ය, සුභ" රජ මාළිගා තුනත්, සියලු රජ සැපත්, තම දේවිය යශෝධරා කුමරිය සහ එදිනම උපන් රාහුල කුමාරයාද අත්හැර දමා කන්ථක අසු පිටින් නික්ම ගොස් නේරංජනා නදියෙන් එතෙරව මහා වනාන්තරයට එක්ව සය වසරක් අතිමහත් දුෂ්කර ජීවිතයක් ගත කළහ.**

මෙයට වසර දෙදහස් හයසිය හතකට පෙර වෙසක් පුන් පෝය සඳ උදාවකදී, දඹදිව, බුද්ධගයා මණ්ඩලයෙහි වර්තමාන බුද්ධගයා චෛත්‍ය සමාගම ලෙසින් ඇති ජයශ්‍රී මහා බෝ සමිඳුන්ට පිටදී සියලු ක්ලේශයන් පරදා සියලු සත්‍ය අවබෝධයන් අවබෝධ කර ගනිමින් තුන් ලොවටම අග්‍ර වූ සම්මා සම්බුද්ධත්වය පසක් කරගත් සේක. සම්මා සම්බුද්ධත්වයට පත් වී වසර හතළිස් පහක් ලෝක සත්වයාගේ හිතසුව පිණිස සුවාසූ දහසක් ධර්මය දේශනා කළ සේක.

පිළිවෙතින් පෙළ ගැසීමට අප කුමක් කළ යුතු වන්නේද? මේ මොහොතේ සිට ප්‍රාණඝාතයෙන් වළකිමු. ඒ සඳහා නිර්මාංස ආහාර පමණක් ගනිමු. අන්සතු දේ වංචාවෙන්, සොරකමින්, බලෙන්, මුළා කිරීමෙන් නොගැනීමට ධාරණය කරගනිමු. අසත්‍යයෙන් බොරුවෙන්, තොරව සත්‍යවාදීව කටයුතු කරමු. මරණය අදද, හෙටද ස්ථිර නොවූ අවිනිශ්චිතව ජීවත් වන ඔබ අපි සැවොම ආශාවන් නිසා ඇති කර ගන්නා වූ සියලු වරදෙන් මිදෙමු. සියලු පරිහානියට මුල්වන්නා වූ ද නීරෝගී සුවය නැති කරන්නා වූ ද, දුම්පානය, සියලු මත්වතුර , මත්කුඩු ගැනීමෙන් වළකිමු.


අපේකම, ශ්‍රී ලංකාවේ අනන්‍යතාව තහවුරු වීමට, පරගැති චින්තනයෙන් මිදී, "ආයුබෝවන්" දීර්ඝායු පතා සෑම අවස්ථාවකදී ම කතාව ආරම්භ කරමු. දුරකථන ඇමතුමේදී ද එසේ "ආයුබෝවන්"කියා ආමන්ත්‍රණය කරමු. සැමට ගරු කරමින් විනය ගරුකව කටයුතු කරමු. අනවශ්‍ය ඉක්මන් කලබලය අත්හරිම. තිලෝගුරු බුදුරජාණන් වහන්සේ, සාරාසංඛ්‍ය කල්ප ලක්ෂ්‍යක් දස පාරමී දම් සපුරාගන සම්මා සම්බුද්ධත්වයට පත් වී සත් සතියක් දින 49 ක් ගෙවූ ආකාරය සිහියට නඟා ගනිමු.

වසර දෙදහස් හයසියහතක් පැවැති ශ්‍රී සම්බුදු දහම දේශනා කිරීමට, වසර හතළිස් පහක් බුදුරජාණන් වහන්සේ වැඩම කළේ පාගමනින්ම බව සිහියට නඟා ගනිමු. ඔබගේ අපගේ කලබල වූ සිතට සැනසිල්ල ලැබීමට ඉවසීමෙන් කටයුතු කරමු. ඇඳුම, පැලඳුම, කතාව පැවැත්ම සියල්ල යහපත්ව කිරීමට, සත්‍යවාදීවම ජීවත් වීමට මෙතැන් සිට පිළිවෙතින් පෙළ ගැසෙමු. මෙම සරල වූ පිළිවෙත් අනුගමනය කරමු. සියලු මනුෂ්‍යයන් එසේ නම් "ලෝකයම යහපත්වනු නිසැකය."

සැමට තෙරුවන් සරණයි!

**ශාස්ත්‍රවේදී චන්ද්‍රසිරි වැලිගමගේ**
(සාමවිනිසුරු)

# අපේ ජාතක පොත් වහන්සේ




ජාතක පොත් වහන්සේ අප සියලු දෙනා අතර ඉතා ප්‍රසිද්ධත්වයට පත් පොතකි. පන්සිය පනස් ජාතක කතා පොත් වහන්සේ කියා බුදුදහම ගැන දන්නා බොහෝ අය සූත්‍ර පිටකය යන්න අසා ඇත. එයට අයත් එක් කොටසකි ඛුද්දක නිකාය. මෙහි හතරවන කොටස වනුයේ ජාතක පාළියයි. මෙයට පාලි ගාථා 7000 කට වඩා අයත්ය.

බුද්ධඝෝෂ අටුවාචාරීන් වහන්සේ මේ ගාථාවලට අර්ථ පැහැදිලි කොට ලියා හැඳින්වෙන්නේ "ජාතකට්ඨ කතා" යන නාමයෙනි. එකී අටුවා කතාව සිංහලයට සකස් කරලීවීම පන්සිය පනස් ජාතක පොත ලෙස සැලකේ. ජාතක යන්න යොදාගෙන ඇත්තේ බෝධිසත්වයන්ගේ පෙර භවයන්හි උප්පත්ති කතා මෙයට අයත් වන හෙයිනි. මේ පොත ඔබට වැදගත්වන්නේ ඒ චරිත කතාවල ආදර්ශය අනුග මනය කර තමන් ළඟ නැති යහපත් ගුණ සමුදායක් ඇති කර ගැනීමට මනා ලෙස උපකාරී වන හෙයිනි.

සිංහල ජාතක කතා පොත සකස් වුණේ කුරුණෑගල අවධියේදීය. මේ පොත බිහිවීමට පෙර ජාතක කතා ගැන එකල ජනතාව අසා තිබුණි. දඹදෙණි "කව්සිළුමිණ" කුස ජාතකය පිළිබිඹු කරමින් ලියවී තිබිණි. එයට පෙර "අමාවතුර", "කව්සිළුමිණ", "බුත්සරණ" "මුවදෙව්දාවත" ආදී කෘතිවල ජාතක කතා ගැන සඳහන් වී තිබුණා. මේ ජාතක කතා සියල්ලම විධිමත් ලෙස කියවීමට අවස්ථාව ලැබුණේ මේ පොත බිහිවීමෙන් පසුව බව කිව හැකිය.

ජාතක කතා පොතට මාතෘකා වූ ජාතක කතා 550 ට ආසන්න වූ සංඛ්‍යාවක් ඇත යයි සඳහන් කළත් එහි ඇත්තේ පන්සිය හතළිස් හතක් (547) තිබෙන බව සනිටුහන් වේ. ජාතක පොතෙහි කතෘ නිශ්චිත ලෙස දක්වා නැත. එය කතෘ මණ්ඩලයක්

විසින් (කරවන) සිදු කරන්නට ඇතැයි සිතිය හැකිය. ඒ ඒ කතාවල විවිධ ශෛලීන් වලින් ඒ බව තහවුරු වේ.

ජාතක කතාවක ආකෘතියේ මූලික අංග තුනක් ඇත. ඒවානම්,

1. වර්තමාන කතාව

2. අතීත කතාව

3. පූර්වාපර සන්ධි ගැළපීමේ කතාවයි. යන මෙලෙස දැක්විය හැකිය. පෙර සඳහන් වූ ආකාරයට ජාතක කතාවක දකින්නට ලැබෙන්නේ බෝධි සත්වයන් වහන්සේගේ පෙර ආත්මවල ජීවන තොරතුරු වෙයි. මෙහි ප්‍රධාන රටාව වන්නේ ශ්‍රව්‍ය ගෝචර රටාවෙන් ලිවීමයි. මෙ මගින් බණ දහම් කතා කියාදීම මෙලොව ජීවිත ගැන සැබෑ ස්වරූපය, ගැඹුරින් විවරණය මෙයින් සිදු කිරීම සිදු වේ.

ජාතක කතා මෙරටට ද හඳුන්වා දීමේ ගෞරවය හිමි වන්නේ කුරුණෑගල යුගයටයි. එය සාමූහික ප්‍රයත්නයක් ලෙස කලඑළි දුටුවකි. අද අප පරිශීලනය කරන ජාතක පොත් වහන්සේ කුරුණෑගල යුගයේ දී සිහසුන දැරූ හතරවන පණ්ඩිත පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1302-1333) රාජ්‍ය සමයේ ද සිදු වූ උසස්ම සාහිත්‍ය සේවාව නම් මේ ජාතකට්ඨ කතා සිංහලයෙන් සකස්වීමයි. මේ රජතුමන් ජාතක පොත සැකසීමට ගත් උත්සාහය මහාවංශයේ සඳහන් වන පරිදි මෙසේ සරල බසින් ඉදිරිපත් කරමු.

"අනතුරුව ඒ රජතුමා නොයෙක් භාෂා පිළිබඳ විශාරද වූ තර්කයෙහි ප්‍රවීණ වූ මනාව හික්මුණු සොලී රටින් වැඩි උසස් තෙර නමක් මුල් තැන තබමින් එතුමාගේ සියලු ජාතක කතා අසමින් - උගනිමින් - අරුත් වටහා ගනිමින් එම ජාතක කතාව මනාව ප්‍රගුණ කරමින් අනතුරුව ඒවා හෙළට පෙරළා නිවැරැදිව ලියවා මුළු සිරිලකම ව්‍යාප්ත කරවීය.

මේ ජාතක කතා ව්‍යාප්ත වීමට කාර්යභාරයට නැණවත්වූ මේධංකර නමැති හිමි නමකට රජතුමා පැවරූ බව ද මහාවංශය සඳහන් කරනවා. පණ්සිය පනස් ජාතක පොත එළුවෙන් (හෙළ බසින්) දැක්විය යුතුයැයි පරාක්‍රම නමැති සත් පුරුෂ ඇමැතිතුමාගේ ආරාධනාවෙන් හා වීරසිංහ පතිරාජ ඇමැතිතුමාගේ උත්සාහයෙන් අටුවාචාරීන් විසින් ලියන ලද ජාතක කතා සත් පුරුෂයන් කන්යොමා සිත් එළා ඇසිය යුතුය... යන ජාතක කතා පොතෙහි ආරම්භයෙහි එන ප්‍රකාශනය ද සලකා බලන විට රජතුමාගේ ඇමැතිවරු දෙදෙනාත් ජාතක කතා පොත සම්බන්ධයෙන් මුල් වූ බව පැහැදිලිවම පෙනේ.

ජාතක පොත පරිච්ඡේද 22 කින් සමන්විතය. ඒ පරිච්ඡේද "නිපාත" යනුවෙන් හැඳින්වේ. සෑම ජාතක කතාවක්ම බෝසතුන් පුරුදු පුහුණු කළ පාරමිතාවකින් විස්තර වෙයි. අද වර්ෂ ව්‍යහාරය ගැන සලකන විට සිංහල ජාතක පොත් වහන්සේ අවුරුදු 700 ක් තරම් පැරැණි වෙයි. "ජාතක පෙරළිය" - "ජාතක ගාථා සන්නසය," "ජාතක අටුවා ගැට පදය" -"ජාතක මාලා" ආදිය ජාතක සාහිත්‍යයට අයත් ග්‍රන්ථයෝ වෙති.

සාමාන්‍ය ජනයාට වටහා ගත හැකි පරිදි එකල පැවැති ශිෂ්ට ව්‍යවහාරය ද පදනම් කරගනිමින් මේ ජාතක කතා රචනා කර තිබේ. ද්‍රවිඩ ජන සමාගම ද බලපෑ බැවින් දෙමළ වචන ද බොහෝ සෙයින් දකින්නට ඇත.

පාරමිතා දහම් පමණක් නොව, තවත් බොහෝ ශිෂ්ට ගුණ ධර්ම ඉගැන්වීමට ජාතක කතා පොත දරා ඇත්තේ මහත් උත්සාහයකි. අලියා, වඳුරා, වටුවා, එක්ව නුග ගසේ වාසය සෙවීම කතාව අප කාටත් පළ පුරුදු කතාවකි. වැඩිහිටියන්ට සැලකීමේ අගය කියන ඒ ගුණ දම දැක්වෙන්නේ "තිත්තර" ජාතකයෙනි.

මී කුණක් විකුණා පෝසතකු වීමේ පුවතින් "උත්සාහවන්තයා ජයගනී" යන කියමන පසක් කළ චුල්ලන්තේ වාසික ජාතකය අපට හමුවන්නේ චුල්ල සෙට්ඨි ජාතකයෙනි. මහලු ගිරා මවු පියන්ට වී කරල් ගෙන ගිය තොරතුරු ඇතුළත් සාලිකේදර ජාතකයෙහි මවුපිය උපස්ථානයෙහි අගය පෙන්වයි. පුෂ්පික - සත්තිගුම්භ ජාතක කතා පුවතින් බාල - පණ්ඩිත ආශ්‍රයෙහි ගුණා-ගුණ දක්වයි.

අපණ්ණක ජාතකයෙන් ඇරඹී වෙස්සන්තර ජාතකයෙන් නිමාව දකින ජාතක පොතේ දිගම කතාව උම්මග්ග ජාතකයයි. ඇතැම් ජාතක කතා ඉතා කුඩා ලෙසින් දැක්වේ. මෙකී සෑම ජාතක කතාවක් ම සාමාන්‍යයෙන් කොටස් තුනකින් යුක්ත වන බව ඉහත දක්වා ඇත. එය වර්තමාන කතාව,



අතීත කතාව, සම්මෝදන කථාව පූර්වාපර සන්ධි ගැළපීම යනුවෙන් දැක්වෙයි.

තිත්තර ජාතකයේ වර්තමාන කතාව නම් සැරියුත් තෙරුන්ට රැය ගත කිරීමට පන්සලේ ඉඩක් නොලැබීමෙන් එළිමහනේ විසීමට සිදුවීමේ පුවතයි. නුගසෙවණේ (නුග පැළයේ) වයස සෙවූ සතුන් තිදෙනාගේ තොරතුරු එහි අතීත කතාවයි. එදා ඇතා මුගලන්ය. වඳුරා සැරියුත් හිමිය. තිත්තර වටුවා නම් තමා යැයි බුදුහිමියෝ පැවසූහ. ඒ ප්‍රකාශයේ සමෝධානය හෙවත් පූර්වාපර සන්ධි ගැළපීම වෙයි.

ජාතක පොතට අනුව බුදු හිමියන්ගේ අතීත කතා 547 කදී බෝධි සත්වයෝ විවිධ සත්ව වර්ග 40 ක් යටතේ උපත ලබා තිබේ. ඇතෙකුට වඩා විශාල වුව ද, වටුවෙකුට වඩා කුඩා වුව ද සතෙකුව නොඉපදුණ බව කියවේ. මිනිසෙකුව උපන් වාර ගණන 354 කි. ඇතෙකුව වාර 7 කි. ගිරවෙක්ව වාර 7 කි. ලේනකුව එක් වාරයකි.

ජාතක කතා පොත ලියැවී ඇත්තේ ශ්‍රැති ගෝචර රටාවෙනි. බණ දහම් උගත් වැඩිහිටි ගිහි පැවිදි අයකු බ්‍රහ්ම ස්වර (උස් හඬින්) විහිදුවා කියන විට අකුරු සතර නොදන්නෝ එය අසා රස විඳිති. වටහා ගනිති. පුරාණයේ විහාරස්ථානවල මෙලෙසින් ජාතක කතා දම් දෙසුම් නොකඩවා පැවැත්විණි.

ජාතක කතා නිසාම අපේ ශිෂ්ටාචාරය හැම විටකම උසස් මට්ටමක පැවැතිණි. ජාතක කතා නිසා අපේ සාහිත්‍යය ද වඩාත් පෝෂණය විය. සාහිත්‍ය කරුවෝ සිය නිර්මාණ සඳහා ජාතක කතා යොදා ගත් අයුරු මෙසේ ය:

කව් සිළුමිණ - කුස ජාතකය
ගුත්තිල දා කව - ගුත්තිල ජාතකය
මුවදෙව් දාවත - මඛාදේව ජාතකය
කාව්‍යශේඛර - සත්තු භත්ත ජාතකය
කුස දා කව - කුස ජාතකය
සස දා වත - සස ජාතකය ....

යනාදී ජාතක කතා මෙයට උදාහරණ වෙයි. ජාතක කතා සාහිත්‍යය අපේ ජන හදවත්වලින් කිසිදා දුරස් කළ නොහැකිය. බුදු රජුන් කෙරෙහි අපේ බැති සිත යම්තාක් ද ඒ තාක් ජාතක පොත කෙරෙහි ඇති බැති සිත ද නොවෙනස්ව පවතී.

ධර්මාචාර්ය
**ලොකුබණ්ඩාර මුණසිංහ** (B.A.)
බෞද්ධ අධ්‍යයනය හා පාලි (පේරාදෙණිය)
අධ්‍යාපන/සමාජ විද්‍යා (බුද්ධ ශ්‍රාවක-අනුරපුර)
ජනමාධ්‍ය ඩිප්ලෝමා (කොළඹ)
සාමවිනිසුරු (මුළුදිවයිනටම)



# බුදුරජාණන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කිරීම සහ ශ්‍රී ලංකාවේ බුදු සසුන පිහිටුවීම

මහාවංශයේ සඳහන් වන පරිදි ලංකාවේ මුල්ම ආගමික සිදුවීම බුදුන් වහන්සේගේ ලංකාවට වැඩම කිරීමයි. ඒ අනුව තෙවරක් ශ්‍රී ලංකාවට බුදුන් වහන්සේ වැඩම කොට ඇත. පළමුවෙන්ම වැඩම කරන ලද්දේ බුද්ධත්වයෙන් නව වන මස උරුවෙල් දනව්වේ සිට මහියංගණයටයි. මෙය දුරුතු පුරපසළොස්වක පොහෝ දිනක සිදු වී ඇත. මෙම ගමනේදී යක්ෂයන් පලවා හැරීමත්, සුමන සමන් දෙවියන් විසින් බුදුරජාණන් වහන්සේගෙන් කේශධාතු මිටක් ලබාගෙන මහියංගණ චෛත්‍යය ආරම්භ කිරීමත් සිදුවිය.

බුදුරජාණන් වහන්සේ දෙවනවරට ලංකාවට වැඩම කළේ නාග දීපයටයි. මෙසේ වැඩම කළේ බුද්ධත්වයෙන් 5 වන වර්ෂයේදීය. මෙම වැඩම කිරීමේ අරමුණ වූයේ චූලෝදර මහෝදර නා රජුන්ගේ කලහයක් සංසිඳුවීමයි. මෙසේ වැඩම කරන ලද්දේ බක් පොහෝ දිනයකය.

බුදුරජාණන් වහන්සේ තුන්වන වරට ශ්‍රී ලංකාවට වැඩම කරන ලද්දේ ලංකාවේ කැලණියටයි. බුද්ධත්වයෙන් 8 වන වර්ෂයේ දී මෙය සිදු විය. මණි අක්ඛිත නාරජුගේ ආරාධනය මෙම වැඩම කිරීමට හේතු විය. වෙසක් පොහෝ දින මෙය සිදු විය. මෙම ගමනේදී බුදුරජාණන් වහන්සේ අනුරාධපුරයට සහ මිහින්තලයට වැඩම කළ බව ද සඳහන් වේ.

බුදු රජාණන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කළ ඉහත අවස්ථා 3 දීම ලංකාවේ බුදුදහම දියුණු කිරීමට

කටයුතු කළහ. කෙසේ වෙතත් එකල ලංකාවේ බෞද්ධයන් සිටියේ ස්වල්ප දෙනෙකි. එසේම බුද්ධ ශාසනයක් ද නොවීය. එනිසාම බුදු දහම විධිමත් ලෙස ව්‍යාප්ත නොවීය. ස්වල්ප දෙනෙකු හෝ බෞද්ධයන් බුදුන් වහන්සේ ලංකාවට වැඩම කිරීමට පෙර සිටි බවට නිදර්ශනයක් ලෙස තපස්සු-භල්ලුක වෙළෙඳ දෙබෑයෝ බුදුන් වහන්සේගෙන් කේශ ධාතු ලබාගෙන ලංකාවට ගෙනැවිත් ලංකාවේ ගිරිහඬු සෑය කරවීම පෙන්වාදීමට පුළුවන. මේ අනුව බුදුරජාණන් වහන්සේ ලංකාවට වැඩම කිරීමට පෙරත් ලංකාවේ වැසියන් බුදු දහම දැන සිටි බව පෙනී යයි. වෙළෙඳුන්, දේශ ගවේෂකයන් මගින් එසේ බුදුදහම පිළිබඳ අවබෝධය ලැබී ඇත.

මොග්ගලී පුත්ත තිස්ස මහරහතන් වහන්සේගේ සහ ධර්මාශෝක රජතුමාගේ ධර්මදූත සේවාවේ ප්‍රතිඵලයක් ලෙස ධර්මාශෝක රජුගේ පුත් මිහිඳු හිමි ඇතුළු පිරිස බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා අවුරුදු 236 කට පසු ලංකාවේ මිහින්තලයට වැඩම කිරීමෙන් පසු ලංකාවේ බුද්ධ ධර්මය විධිමත් ලෙස ව්‍යාප්ත විය. මිහිඳු හිමි ලංකාවේ භික්ෂු ශාසනය ඇති කිරීම ඊට හේතු විය.

මිහිඳු හිමි ඇතුළු ඉත්තිය, උත්තිය, සම්බල, භද්දසාල, සුමනසාමණේර, භණ්ඩුක උපාසක ඇතුළු පිරිස ලංකාවට වැඩම කරන අවස්ථාවේ ලංකාවේ රජු වූයේ දේවානම්පියතිස්ස මහරජතුමාය. මෙය පොසොන් පුර පසළොස්වක පොහෝ දිනක සිදු විය. දෙවන පෑ තිස් රජු මෙවේලේ මුව දඩයමේ යෙදී සිට ඇත. මිහිඳු හිමි දේවානම්පියතිස්ස රජුට "තිස්ස තිස්ස" යනුවෙන් ඇමතීය. රජු පුදුමයට පත් වී මිහිඳු හිමි දෙස බලන ලද්දේ තමාගේ නම කියා කථා කිරීමට සමත් කවරෙක් සිටී ද යන අදහසිනි. රජුහට දේවානම්පියතිස්ස යන නම ලැබුණේද දෙවියනට ප්‍රිය වූ යන අදහසිනි. රජුට මිහිඳු හිමි මෙම ගාථාව දේශනා කළහ.

"සමණා මයං මහා රාජ - ධම්ම රාජස්ස සාවකා
තමේව අනුකම්පාය - ජම්බුදීපා ඉධා ගතා"

එහි තේරුම වූයේ මහරජ අපි බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ වෙමු. තොපට අනුකම්පා පිණිස දඹදිව සිට මෙහි පැමිණියෙමු, යන්නයි.



**මොග්ගලී පුත්ත තිස්ස මහරහතන් වහන්සේගේ සහ ධර්මාශෝක රජතුමාගේ ධර්මදූත සේවාවේ ප්‍රතිඵලයක් ලෙස ධර්මාශෝක රජුගේ පුත් මිහිඳු හිමි ඇතුළු පිරිස බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා අවුරුදු 236 කට පසු ලංකාවේ මිහින්තලයට වැඩම කිරීමෙන් පසු ලංකාවේ බුද්ධ ධර්මය විධිමත් ලෙස ව්‍යාප්ත විය. මිහිඳු හිමි ලංකාවේ භික්ෂු ශාසනය ඇති කිරීම ඊට හේතු විය.**

මෙවිට රජු දුනු හී පසෙක දමා මිහිඳු මහ රහතන් වහන්සේ වෙත පැමිණ කරුණු විමසන ලදී. මිහිඳු හිමි දේවානම්පියතිස්ස රජතුමා ගේ බුද්ධිය පරීක්ෂා කර බැලීම සඳහා නෑයන් පිළිබඳව සහ අඹ මුල්කරගෙන ප්‍රශ්න විචාරීය.

මහරජ ඔබට නෑයන් සිටීද? එසේය ස්වාමීනි යනුවෙන් මිහිඳු හිමිගේ මුල්ම ප්‍රශ්නයට රජතුමා

පිළිතුරු දෙන ලදි. නෑයොත් හැර නොනෑයොත් හැර තවත් අයත් සිටීද? යන පැනයට රජතුමා පිළිතුරු දෙන ලද්දේ ඒ නොනෑයන් වන්නේ මම බවයි.

මහරජ මේ ගස කුමක්ද? ස්වාමීනි අඹ ගසකි. මහරජ මේ ගස හැර වෙනත් ගස් තිබේද? එසේය ස්වාමීනි, ඒ ගසුත් හැර තවත් අඹ ගස් තිබේද? ස්වාමීනී මේ අඹ ගසය. මේ ප්‍රකාශවලින් රජුගේ බුද්ධිය මිහිඳු මහ හිමි තේරුම් ගත්හ.

මිහිඳු මහ රහතන් වහන්සේට දෙවන පෑතිස් රජු හට ධර්මාවබෝධය ලබා දීමට පහසුවීමට බලපෑ හේතු ද බොහෝ වෙති. එහි එක් කාරණයක් ලෙස තුන්වරක් ලංකාවට වැඩම කළ බුදුරජාණන් වහන්සේගේ ධර්මය ලක්දිව ස්වල්ප ලෙස හෝ පැතිරී යාමයි. අනෙක් කාරණය වන්නේ සරඹු තෙරණුවෝ බුදුන්වහන්සේගේ හකු ධාතුව රැගෙන ලංකාවට වැඩම කොට මහියංගණ චෛත්‍යය තවත් රියන් දොළොසක් උස්කොට එහි තැන්පත් කිරීමයි. මේ කාරණය තුළින් ද ලංකා වැසියෝ බුදු දහම දැන සිටි බව පෙන්වයි.

විජය කුමරුගේ ලංකා ගමනයේ සිට නොකඩවාම වාගේ ආර්ය කණ්ඩායම් ලංකාවට පැමිණ ඇත. මෙසේ පැමිණි බොහෝ දෙනෙක් බුදුරජාණන් වහන්සේගේ වංශයට අයත් ශාක්‍යයෝ වූහ. පණ්ඩු වාසදේවගේ අගමෙහෙසිය වන බද්ධකච්චානා කුමරිය සහ ඇගේ පිරිවර බොහෝ දෙනෙක් බෞද්ධයෝ වූහ. මෙම කාරණය තුළින් ද පෙනීයන්නේ ලංකාවේ බොහෝ දෙනෙක් බුදු දහම දැන සිටි බවයි.

ක්‍රි.පූ. 6 වන සියවසේ ඉන්දියාවේ ඇති වූ ආගමික ප්‍රබෝධයේ ආභාසය ලංකාවට ද ලැබී ඇත. එකල ලංකාවට පැමිණි වෙළෙඳුන්ගෙන් ද ලක්වැසියන්ට බුදුදහම පිළිබඳව තොරතුරු ලැබී ඇත. එසේම ලංකාවේ දේවානම්පියතිස්ස රජතුමා ද ධර්මාශෝක රජු පිළිබඳවත් ඔහු බුදු දහම තුළින් රට පාලනය කරන බවත් හොඳින් දැනගෙන තිබේ. මෙම කරුණු නිසාම දේවානම්පියතිස්ස රජුට මිහිඳු මහරහතන් වහන්සේ දේශනා කළ බුදු දහම අවබෝධ කර ගැනීමට ඉතා පහසු විය.

මිහිඳු මහ රහතන් වහන්සේ නෑයන් සහ අඹ ප්‍රශ්නය දේවානම්පියතිස්ස රජුට යොමු කොට ඉන් ලැබුණු පිළිතුරු පිළිබඳව සතුටු වී රජුගේ බුද්ධිමත් භාවය හඳුනාගෙන රජු ඇතුළු පිරිසට චුල්ල හත්ථිපදෝපම සූත්‍රය දේශනා කරන ලදී. පසුව ලංකාවෙ බුදු දහම ව්‍යාප්ත කිරීමට කටයුතු කරන ලදී.

පසුව අනුරාධපුර නගරයට මිහිඳු හිමි ඇතුළු පිරිස වැඩම කොට විනය කර්ම සඳහා මහා විහාර සීමාව සහ මහමෙවුනා උයන පිහිටුවන ලදි. මෙම කාලයේ දීම සංඝමිත්තා මෙහෙණිය විසින් ශ්‍රී බෝධින් වහන්සේ ද ලංකාවට වැඩම කොට ඇත. ඒ සමඟම ලංකාවේ මෙහෙණි සසුන ද ඇරඹී ඇත.

මිහිඳු හිමි දින 26 ක් (විසිහයක්) අනුරාධපුර වැඩ සිටි බව මහාවංශයේ සඳහන් වේ. වස් කාලය ආරම්භ වීම නිසා නැවත මිහිඳු හිමි මිහින්තලයට වැඩම කොට ඇත. මිහිඳු මහරහතන් වහන්සේ සමඟ 60 (හැට) නමක් වස් විසීම සිදු කර ඇත. වස් කාලය අවසන් වීමත් සමඟ මිහිඳු හිමි බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව ඉන්දියාවෙන් වැඩම කරවාගෙන දේවානම් පියතිස්ස රජු වෙත භාර දී දේවානම්පියතිස්ස රජු විසින් අනුරාධපුර ථූපාරාම චෛත්‍ය කරවා එහි අකු ධාතුව තැම්පත් කරවන ලදී. මෙය ලංකාවේ විධිමත් ලෙස බුදු දහම ව්‍යාප්ත වූ පසු කරවූ පළමු චෛත්‍යයි.

මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වැඩම කිරීමට පෙර ලංකාවේ ජනයා තුළ විවිධ ආගමික විශ්වාස විය. මිය ගිය අය යකුන් වී ජීවත්ව සිටිය අය ආරක්ෂා කරති යන විශ්වාසය එකකි. යකුන් දෙවියන් ඇදහීම නාගයන් ඇදහීම සහ නැකත් තරු පිළිබඳ විශ්වාසය ගස් වැල් ඇදහීම අනෙකුත් විශ්වාස වේ. මළවුන් පිදීම මුල් කාලයේදීම සිදු විය.

ඉහත විශ්වාස සහ ඇදහීම් ඵල රහිත ඒවා බවත්, ඒවාට නව අර්ථ කථන ලබා දීම බුදු දහමින් සිදු විය. ඒ අනුව මළවුන් පිදීම වෙනුවට මළවුන්ට දාන පින්කම්කොට පින් අනුමෝදන් කිරීම බුදු දහම අනුව සිදු විය. වෘක්ෂවන්දනාවට නව අරුතක් එකතු කොට ශ්‍රී මහා බෝධි වන්දනාව සිදු විය.

එසේම මිහිඳු හිමි ලංකාවට වැඩම කොට බුද්ධ ධර්මය අනුව කටයුතු කළහ. කෘෂි කර්මාන්තය දියුණු වීම වාරිකර්මාන්තය දියුණු වීම සිදු විය. සිංහල භාෂාවේ දියුණුව ලේඛන කලාව දියුණුවීම සහ මූර්ති චිත්‍ර කැටයම් ආදි කලාංග දියුණු විය. අක්ෂර කලාවේ දියුණුවත් සමඟ ලේඛන කලාව ද දියුණු විය. ගෘහ නිර්මාණය සහ සිංහල සාහිත්‍යයක්

ද බිහි විය. ගමක් නිර්මාණය වූයේ ද මිහිඳු හිමිගේ උපදෙස් පරිදිය. ඒ අනුව ගමට අයත් වූයේ ගම, පන්සල, වැව, දාගැබ වේ.

මිහිඳු හිමි ලංකාවේ බුද්ධ ධර්මය ව්‍යාප්ත කිරීමෙන් පසු බුදු දහමත් සමඟ නව සංස්කෘතියක් ද බිහි විය. සිරිලක කොයි කවුරුත් බුදු දහමට පැහැදුණහ. සිය දහස් ගණන් කුල දරුවෝ පැවිදි වූහ. ලංකාවේ සෑම පළාතකම පාහේ වෙහෙර විහාර ඉදිවිය.

ශ්‍රී ලංකාවට බුදු දහම ලැබීමත් සමඟ බුදු දහමේ ආභාසයෙන් සිංහල ජනතාවගේ පාලන ක්‍රමය නව මුහුණුවරකට පත් විය. දේවානම්පියතිස්ස රජු මුලින්ම සිටියේ සාමාන්‍ය තත්ත්වයෙන් බවත්, බුද දහමේ ආභාසයෙන් රාජාභිෂේකය ලැබූ බවත් කියැවේ. මහා විහාර සීමාව ලකුණු කිරීමේ දී එම සීමාවට ආසන්නයේම රාජ මාලිගාව තිබීමත්, රාජ්‍ය ආගම බුදු දහම ලෙස නම් කිරීමත් බුදු දහමේ ආභාසයෙන්ම සිදු වූ බව පැහැදිලිය.

ක්‍රි.පූ. 3 වන සියවස තුළ සිට රට පාලනය කරන අයෙකු බෞද්ධයකු වීම අනිවාර්ය විය. ඊට පසු කාලීන රට පාලනය කරන අයෙකු බෞද්ධයකු පමණක් නොව, බෝධි සත්වයකු ලෙස ක්‍රියා කිරීමක් අත්‍යවශ්‍ය විය. 4 වන මිහිඳු රජු අභයගිරි දෙවන ලිපියේ සඳහන් කරන්නේ ක්ෂත්‍රියකු රජ වන්නේ බුදුරජාණන් වහන්සේගේ පාත්‍රය සහ සිවුර ආරක්ෂා කිරීමට බවයි. රාජ්‍ය පාලනය කෙරෙහි බුදු දහම කෙතෙක් දුරට බද්ධ වී තිබුණේ ද යන්න මෙයින් ම පැහැදිලි වේ.

මිහිඳු මහ රහතන් වහන්සේගේ උදාර සේවාව ඉතා විශිෂ්ට අන්දමින් මහාවංශය සඳහන් කරයි. ඒ අනුව මිහිඳු මහ රහතන් වහන්සේ උත්තිය රජුගේ රාජ්‍ය කාලයේ දී, රජු රාජ්‍යත්වයට පත් වී අටවන වර්ෂයේ දී පිරිනිවන් පා ඇත.

මහාවංශ විස්තරය මෙසේය: ඒ මහා මහින්ද ස්ථවිරයන් වහන්සේ වනාහි පර්යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවේද යන උතුම් බුදු සස්න මොනවට ලක්දිව්හි බබුළුවා ලංකාවට ප්‍රදීපයක් බඳු වූයේ මහා සමූහ ඇත්තේ ලක්දිව බුදුන් වැනි වූයේ බොහෝ ලෝවැඩ කොට ඒ උත්තිය රජුගේ රාජාභිෂේකයෙන් අටවැනි ජයවර්ෂයෙහි හැටවස් පිරුණු සේක් වස්සාන මාසයන්හි සෑගිරියෙහි විසූ සේක. වෙසෙසින් වප්මස ශුක්ල පක්ෂයෙහි අටවස් ද්වීප වර්ධනයට හේතු වී මහේන්ද්‍ර ස්ථවිරයන් පිරිනිවී කරුණෙන් දවස අටවක් පෝයදායි සම්මත වී.

උන් වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කිරීමෙන් පසු එම ධාතු නිදහන් කොට මිහින්තලේ සෑගිරිය ද කරවීය. එසේම මිහින්තලේ ද ලංකාවේ විවිධ ප්‍රදේශවල ද සෑයන් කරවූ බව කියැවේ. මේ අනුව මිහිඳු හිමියන් පිරිනිවන් පා ඇත්තේ දේවානම්පියතිස්ස රජුට පසුව රජ වූ එතුමාගේ බාල සහෝදරයා වූ උත්තිය රජු ක්‍රි.පූ. 2007 - ක්‍රි.පූ. 197 රාජ්‍ය කාලයේ අට වන වර්ෂයේ දීය.

මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වැඩම කළ පුවත රජගල ගිරි ලිපියේ ඇත. එය මෙසේය: "යෙ ඉවදිප පටමය ඉදිය අගතන ඉඩික තෙර හිද තෙරහ තුබෙ" මේ දිවයිනට පැමිණි ඉට්ඨිය තෙරුන්ගේ හා මිහිඳු හිමිගේ ස්තූපයයි.

මිහිඳු හිමි ලංකාවට වැඩම කළ බව සඳහන් වන තවත් ශිලා ලේඛනයක් මිහින්තලේ ඇත. මිහින්තලේ කන්ද නගින විට මහ මළුවට නැගීමට පෙර දකුණු පැත්තට වන්නට මහා ගල් කුළක ඇත. එහි මිහිඳු හිමිගේ නාමය ඇත. එහි මිහිඳු පෙරහැරක් ගැන ද කියැවේ.


මිහිඳු මහ රහතන් වහන්සේ සමග මෙහි පැමිණි විවිධ ශිල්ප ශාස්ත්‍ර නිසා ලංකා සංස්කෘතිය බුදු දහමේ ආභාසයෙන්ම සකස් විය.

අමාවතුර, ධර්ම ප්‍රදීපිකාව, මුවදෙව්දාවත, විනය සන්නය, පිරිත් සන්නය, බුදු දහමේ ආභාසය තුළින් බිහිවිය. එසේම සිංහල අක්ෂර කලාව ක්‍රමවත් විය. මුලදී භාවිත කළ අක්ෂර කෙසේ දැයි නිශ්චිතවම කිව නොහැකිය. එහෙත්, බ්‍රාහ්මී අක්ෂර විකාශනය තුළින් සිංහල හෝඩිය බිහි වූ බව පෙනීයයි.

ඉහත කරුණු දෙස සැලකීමේ දී පෙනී යන්නේ බුදු දහම තුළ තිබෙන සාරවත් භාවය මිහිඳු හිමි ලක්වැසියාට බෙදාදීම තුළින් සිංහල සංස්කෘතිය දියුණු වී එය ධාර්මික පදනමක් යටතේ සංවර්ධනය වූ බවකි.

**ඩබ්ලිව්. දිසානායක හේරත්**

බෞද්ධාලෝකය



# මිනිසත් බව

මිනිසා යන මේ අකුරු තුනෙන් කුමක් අදහස් කරනු ලැබේද? 'මනුනො අපච්චාතිමනුස්සා' යනුවෙන් පැවත එන්නේ මිනිසා යයි ඇතැමෙක් තීරණය කළහ. සාමාන්‍ය ලෝකය එය පිළිගනියි. මනු ප්‍රථම කල්පික ආදිම අනුශාසකයා හෙවත් සත්වයන්ගේ පිතෘස්ථානයේ සිටි තැනැත්තා මෙන්ද ලෝකයාට හිත හිත දෑ කියා දෙමින් සදාචාරය පෙන්වා දුන් ස්වයම්භූ මුනිවරයකු මෙන් ද සලකනු ලැබේ. එහෙයින් සදාචාරයෙන් ශිෂ්ට වූයේ මිනිසා යැයි සිතාගත හැකිව තිබේ. බෞද්ධ ග්‍රන්ථයන්හි මනු 'මහා සම්මත රාජ' නාමයෙන් මහා සම්මත රජ ගොත් මන රජ කුලන් පැවැතෙන පිළිවෙළ නොසිඳ යන ආදීන් මනු මිනිසුන්ගේ ප්‍රමුඛයා බව කව් සමයෙහිදී ද දැක්වේ.

සමයානුකූලව හෙවත් ආගම අනුව විමසන කල 'මනස්ස උස්සන්නතාය මනුස්සා' යනු අටුවා හෙයින් උත්සන්න වූ මනසක් (සිතක්) ඇත්තේ හෙවත් ස්මෘති ශූරතා ශිල්ප ශාස්ත්‍ර ආගම ධර්ම නීති ආදී මිනිස්කමට උරුමවූ තිරිසනුන්ට අවිෂය වූ උත්කෘෂ්ට ගුණ ධර්මයන් කෙරෙහි උත්සන්න වූ සිතක් ඇත්තේ, මිනිහා යැයි සලකා ගත හැකිය. මේ පාළි 'මනුස්ස' සංස්කෘත 'මනුෂ්‍ය' ශබ්දයාගේ නිර්වචන අර්ථ හෙවත් අක්ෂර ද්වාරයෙන් ගෙනහැර පෑව යුතු අර්ථයයි. වචනයෙන් හැඳින්වෙන තේරුමයි. එහෙත් මිනිසාගේ ස්වභාවය දැක්වීම පිණිස ලක්ෂණාර්ථය කියතොත් මොහොතක් පාසා දියුණුවන නිසිමගට පිළියෙලවන හැඩ ගැසෙන නාම රූප සන්තතිය - ස්කන්ධ පංචකය මිනිසා යැයි කියයුතුව තිබේ.

කෙසේ හෝ වේවා! සකල සත්ත්ව ලෝකයෙහිම මිනිසා බඳු ආශ්චර්ය අද්භූත, උතුම්කොට සැලකිය යුතු වෙනත් එකද සතකු නැති බව නම් බුද්ධිමත් ලෝකයා අවිවාදයෙන් පිළිගනියි. ජීවතුන් අතර මුල්තැන දිය යුත්තේ මිනිසාටය.

මුළු ලොවම බඹයක් පමණ වූ මිනිසා තුළ ගැබ් වී තිබේ. ඒ ලොව ඉක්ම යෑමේ ශක්තියක් ඔහු ඊළඟ ම වේ. යා හැකි ඉහළම කොනට වුවද යෑමද අවශ්‍ය ගතිගුණ මිනිසා තුළ අන්තර්ලීනව ගිනිපෙට්ටියක ගිනි උපදවන ශක්තිය ඇත්තාක් මෙන් පවතී.

"ඇවැත්නි, මේ සිත් ඇති ශරීරයම විෂයකොට ලෝකයත්, ලෝක සමුදය නම් තෘෂ්ණාවත්, ලෝක නිරෝධ නම් වූ නිවණත්, ඒ නිවනට යායුතු පිළිවෙත වූ ආර්ය අෂ්ටාංගික මාර්ගයත් පණවමි"යි අංගුත්තර නිකායෙහි (iv. 45) දැක්වෙන්නේ බුද්ධ වචනයයි.

'දුල්ලභංච මනුස්සත්තං' යන්නෙන් කියැවෙන පරිදි මිනිසත් බව දුකසේ ලැබිය යුත්තකි. හතු පිපෙන්නාක් මෙන් පහසුවෙන් ලැබෙන දෙයක් නොවේ. එක කුම්භි ගුලකින් නික්වෙන කුහුඹුවන් ගැන බැලුවොත් ලක්දිව මිනිසුන්ගේ ගණනටත් වැඩිවිය හැකිය. මෙසේ විමසා බලතොත් තිරිසන් ලෝකයේ මහත්වයත්, මනුෂ්‍යලෝකයේ අල්පත්වයත් මැනගත හැකිය. ඒ එසේ මැයි 'කිච්ඡෝ මනුස්ස පටිලාභො' මනුෂ්‍යාත්මය ඉතා දුකසේ මහත් කුසල හේතුවකින් ලැබිය යතු හෙයින් ඉතා දුර්ලභ වේ මැයි.

ලෝකයෙහි කොහෙත් කවදත් හොඳ අඩු බවත් නරක වැඩි බවත් කවුරුනුත් පිළිගන්නා ඇත්තකි. කැලයට වන් අයකුට කළුවර, බුරුත, සඳුන් ඈ හරය වැඩි අගය ඇති වෘක්ෂලතාදිය දක්නට ලැබෙතොත් මේ ටිකකි. පොළොව සාරමින් රන් රුවන් ඈ වටිනා දේ සොයන්නකුට එබඳු සාර වස්තූන් ලැබෙතොත් නිතොර නොවේ. කලාතුරෙකිනි. එමෙන්ම ලොව පහළ වන සතුන් අතර මනුෂ්‍යයෝම දුර්ලභ වෙති. ඒ මිනිසුන් අතර ද ගුණදහමින් යුතු දුසිරිතින් මිදුණු සුසිරිතෙහි බැඳුණු උත්තමයන්, සත්පුරුෂයෝ, දුර්ලභයහ. "සාධවො න හි සබ්බත්‍ර" සැම තැනම සත්පුරුෂයෝ දකිනු නොලැබෙත්. ගුණ දහමින් හා බණදහමින් පිරිහුණ අසත්පුරුෂ පින්වත්හුම බොහෝ වෙති. දුශ්ශීලොහි බහුජ්ජනො. "වැඩි දෙනා දුශ්ශීල වෙති. අශිෂ්ට වෙති" යනු බුද්ධ වචනය පුදුමයක් නොවේ. මෙය කියවන ඔබට එහි රහස තේරුම් ගත හැකිය.

මිනිසත් බව ඉතා අගනේය. මනාව තැනුණු මනුෂ්‍ය ජීවිතයෙකින් කටහැකි මහඟු සේවය මිණිය නොහැකි තරම්ය. සත්පුරුෂ ගුණයෙන් යුක්ත වූ වීරෝදාර මිනිසුන්ගේ ලෝ පහළ වීම අතිශයින්ම භාග්‍යදායකය. කවර හෙයින්ද යත්, එබඳු උතුමෝ දුකසේ ලත් මිනිස් ජීවිතය සිස් නොකර නියම පෞරුෂයෙන් ක්‍රියා කොට ගුණ ධර්ම නමැති ශරීරය මෙහි තබා මෙලොව ජීවිතය හරනා බැවිනි. ලෝකයට ශාන්තියක් උදා වෙතොත් එබඳු මහනීය උතුමන්ගෙන්මය. මනුෂ්‍ය රූපයක් ගෙන මිනිස් ගතියෙන් තොරව අසත්පුරුෂව ගුණදහමට පිටුපා කල් ගෙවන අමනුෂ්‍යයන්ගෙන් නොවේ.

හැමදෙනා විසින් ම මහත් වෑයමෙන් නමුත් තමා වෙත ළඟාකර ගත යුතු ඉතාම වටිනා වස්තුව නම් පිරිසුදු චරිත බව ගුණ නුවණැති ලෝකයා අවිවාදයෙන් පිළිගනියි. චරිතය එක් එක් මිනිසා පිළිබඳවම පවත්නා ධර්මයක් මුත් කෙනෙකු විසින් කෙනකුට උරුම කර දිය හැකි, තෑගි කොට දිය හැකි දෙයක් නොවේ. දුම්තෙල් ආදියකින් ව්‍යංජනයක් සුවඳ කවන්නාක් මෙන් චරිතයෙන් කෙනකු සංස්කරණය කිරීම කිසිවකුට කළ නොහැකිය. සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤො අඤ්ඤං විසෝධයෙ - පිරිසුදු අපිරිසුදු බැව් තම තමා වෙතමය. අනෙකෙක් අනෙක් කෙනකුන් පිරිසුදු කළ නොහේමය යනු බුදුබණයි. එහෙත් චරිත ශෝධනයෙහි ලා කෙනකුට සහය වන්නට උපදෙස් දෙන්නට පිළිවන. බුදුරජාණන් වහන්සේ මුළු ලෝකයාගේම කල්‍යාණ මිත්‍රවන සේක. එහෙයින්ම බුදුරජුන්හට 'සර්වමිත්‍ර' යනු නමෙකි. මනුෂ්‍යයන්ගේ චරිත තේරුම්ගෙන, ඔවුන්ගේ චින්තාචාරයට අනුව අවවාදානුශාසන කරන පුරිසධම්ම සාරථී නම් වූ මාගේ අමා මෑණියන් වහන්සේ රෝග නිදානය තේරුම් ගෙන බේත් කරන අසහාය වෛද්‍යවරයෙකි. එක් බමුණකුගේ ප්‍රශ්නයට පිළිතුරු දෙන බුදුරජාණන් වහන්සේ "මම බ්‍රාහ්මණය සම්බුද්ධ වෙමි. අනුත්තර වූ ශල්‍ය වෛද්‍යයෙක් වෙමියි" වදාළේ එහෙයිනි.

බුද්ධ ධර්මානුකූලව බලතොත් කොටස් සතරෙක මිනිස්සු සිටිත්. මනුෂ්‍යප්‍රෙත, මනුෂ්‍ය තිරශ්චීන, මනුෂ්‍ය නාරකික, පරමාර්ථ මනුෂ්‍ය යනු ඒ කොටස් සතරයි. මනුෂ්‍ය ප්‍රේතයා කොතෙක් කෑම් පීම් ලැබුණත් ගිජුකම, නිසා සෑහීමකට නොපැමිණෙයි. සෑහෙන පමණ රෙදිපිළි ඇතත් විළිවැසෙන පරිදි රෙදි කඩක් වත් හඳින්නට නොසිතයි. සතර ඉරියව්වෙහිදීම විද්‍යමාන ප්‍රේතයකු මෙන් කල් ගෙවයි. හිස කෙහෙ හැඩ පලු ගෙතුනත් තෙල් ටිකක් ගල්වා පීරන්නට වත් කැමැත්තක් ඔහුට නැත. පුළුවන්කම් තිබුණත් තමන් අඳින ඇඳුමවත් සෝදා පිරිසුදු කර නොගනියි. ඔහුගේ ඇඳුම මැක්කන්ටත්, උකුණන්ටත් හොඳ නිවාසයෙකි. ඇළදොළවල ජලනළවල කොතෙක් දිය තිබුණත් එය නිමාවට යාදෝ යන බියෙන් අපවිත්‍රයනට ආකරයක් වූ සිය සිරුරවත් සෝදා නොගනියි. කම්මැළිකම ඔහු කෙරෙහි මුල් බැසගෙන සිටී. උපන්දා සිට මාරයාගේ සීනු හඬ ඇසෙන තෙක්ම නමින් මිනිසකු වුවද පැවැත්මෙන් ජීවමාන ප්‍රේතයකු මෙන් කල් ගෙවයි. ආත්මාර්ථයක් නම් සිදු නොවේ. පරාර්ථයක් ගැන කවර කථාද? විශේෂයෙන්ම මේ මනුෂ්‍ය ප්‍රේත කොටසට අයත්වන්නේ යට කියන ලද ප්‍රේත ලක්ෂණයන්ගෙන් යුත් යාචක පිරිසයි. මේ පිරිස පෙර කළ අකුසල කර්මයක් ප්‍රත්‍යය කොට ගෙන මෙලොවදී ඇති වන යම් බැරිකම් අපහසුකම් නිසාදෝ තමා විසින් හදාගත් අලසකමින් හෝ ඉදින් එබඳු ජීවිතයක් වුවත් ඉන් මිදෙන්නට ඉඩක් ලැබුණු විටකවත් ඉන් මිදී භාග්‍යවන්ත මනුෂ්‍යයන් වන්නට නොසිතයි. එය අගය කොට නොසලකයි. නොයෙකුත් බැරිකම් දුබලකම් පෙන්නා කුස්පපා හැකිනම් කූටෝපාක්‍රමත් යොදා අනුත්සාහයෙන්

මෙන් අනුන්ගෙන් ලත් දෙයකින් ජීවිකාව කරන්නට සැරසෙයි. යැදීමට උසස් රක්ෂාව ලෙස සිතයි. ඉදින් වත් පොහොසත්කම් නැති අංග විකල යමක් කර කියා ගන්නට බැරි අසරණයකු නම් අනුන්ගේ පිහිට ලබාගෙන ප්‍රේතගති ළං කර නොගෙන ජීවත්වීම ගැන දෝෂාරෝපණය කරන්නට ඉඩක් නැත. එහි වරදක් නැති හෙයිනි. එහෙත් යමකු අත්, පා කන්, නාසාදි අඟපසග අවිකලව තිබියදී යාචක ප්‍රතිරූපකයක් මෙන් පෙනී සිට අනුන් අයත් දේ කපටි කමින් වංක කමින් ගසාගෙන නගර කාකයකු මෙන් උදර පෝෂණය කරතොත් ඉණ බඩ වඩතොත් එය මහත්ම වරදෙකි. මිනිස් කමට නොගැළපෙන්නකි. එය අපරාධයන් බහුල වීමට හොඳම මඟකි. මිනිස්කම් දුර ගසා අලසයකු කරන කදිම උපායෙකි. අත් පා හොඳින් තිබේනම් සැඟවී තිබෙන වීරෝදාර ගති හෙළිකොට මනුෂ්‍ය ලීලාවෙන් තම කටයුතු පිරිමසා ගන්නට වෑයම් නොකිරීම කොතරම් ඒ අභාග්‍යයක් ද? ඇතැමුන්හට දියුණුවන්නට කිසිදු උනන්දුවක් නැත. අලසය, ඉඩක් ලැබුණත් මැළිකම නිසා ප්‍රේත ස්වභාවය අත් නොහරියි. දීනව බැගෑව කල් යැවීම, මහත්ම සැපතක් කොට සලකයි. අඳුරෙන් අඳුරටම ගන්නට සැරසෙයි. සියල්ල කර්මයට හෝ පෙර පවට බාරකොට උත්සාහ නොකොට උපන්නාට යද්දෙන් ජීවත්ව සිට ආයු කෙළවර මැරී යන්නට නම් අදහස එය සංවේගදායකය. "මම උපතින්ම පව්කාරයෙක්මි" "කාලකණ්ණියෙක්මි" යන මේ පහත් සිතිවිලි ඇතිතෙක් හෙතෙමේ ඒ දර්ගභාවයෙන් නොමිදෙයි. "බැරි තැන පුළුවන උත්සාහ දරමි" යන මේ උසස් අදහස මිනිසා කෙමෙන් හොඳ මඟට ගෙන යන නියමුවා මාර්ග දේශකයා බව සිතන්න.

මිනිසුන්ගේ යාචක ගති බැරිකම් දුර හරවා ඔවුන් සුඛිත මුදිත කිරීමට අපේ රජයද - මැති ඇමැතිවරුද තමන් අයත් යුතුකම් නොපිරිහෙළා සිදු කටයුතුය. නිදහස නිහස කියා රට පුරා ගාලගෝට්ටි කළත් මනුෂ්‍යයකුගේ ඉණට බඩට නිදහසක් නැත්නම් අහෝ කවර නම් නිදහසක්ද අප ලැබූයේ?

දෙවනුව කියැවුණු මනුෂ්‍ය තිරශ්චීන මිනිස් තිරිසන් කොටසට ඇතුළත් අයද අප අතර අඩු නැත. ආහරත්, නිද්‍රාවත්, භයත්, මෛථුනයත් යන මේ කරුණු සතර මිනිස් තිරිසන් දෙකොටසටම පොදුය. එහෙත් මිනිසා තිරිසනාගෙන් වෙසෙසනුයේ ශිෂ්ට මහාත්ම ගුණාංගයෙනි. ගුණ දහමින් හීනවූ සදාචාරයෙන් ඈත් වූ අය රූ සටහනින් හැඩයුරු කමින් මිනිසුන් වුව ද, ගති ගුණයෙන් තිරිසන් සත්නට දෙවැනි නොවන හෙයින් "මනුෂ්‍ය රූපෙන මෘගශ්චරන්ති" මනුෂ්‍ය රූපයක් ගෙන තිරිසනුන් මෙන් හැසිරෙතැයි කියති. උතුම් මිනිසත් බවක් ලැබූවකු සදාචාරයට පිටුපා ක්‍රියාකරතොත් එය බලවත් වරදකි. දුකසේ ලත් මිනිසත් බව තිරිසන් බවට පෙරළාම ගැනීම සංවේග දායකය. මිනිසකුගේ පරමාර්ථය හුදෙක් කෑම් පීම් ඇඳුම් පැලඳුම් ආදිය මේ ජීවිතයාගේ නිවැරැදි පැවැත්ම සඳහායි. අප ජීවත් වන්නේ කෑම් පීම් සඳහා නොව, කෑම්පීම් කරන්නේ ජීවත්වීම සඳහා බවත්, ජීවත්වන්නේ ආත්මාර්ථ පරාර්ථ සාධනය පිණිස බවත් සිතාගත යුතුය. කුස පුරා කා බී ඇඟපුරා ඇඳපැලඳ ශීඝ්‍රගාමී යානවාහන වලින් ගමන් බිමන් කරමින් භෞතික දෙයෙහි ම ආසක්තව විෂයරසානුභාවයෙහිම නිරතව කාම කෝප වර්ධනයට රුකුල් දෙන පැවතුම්හිම යෙදෙමින්, ඉන්ද්‍රියයන්හිම පිනවීය. ජීවිතයේ පරමාර්ථය කියාගන්නා මුළා වූ පින්වතුනට අනුකම්පා කටයුතුය. මෙය නම් මනුෂ්‍යයාගේ පරමාර්ථය හෙවත් උසස්ම බලා පොරොත්තුව අහෝ! ඛේදවාචකයකි. කොතැන්හිද දැක්ක හැක්කේ මිනිසාගේත් තිරිසනාගේත් වෙනස? කීයේ ද නොදැනුමතියන් විසින් මිනිසා තිරිසනාගෙන් වෙන්කොට දක්වන විශේෂ කාරණය නම් ධර්මයයි, ගුණධර්මයයි. ධර්මයේ හීනවූවාහු සිවුපාවුන්ට සමානයහ.

එහෙයින් ඔබගේ උතුම් මිනිස් සිතට ඒ සා හීනදීන දුබල අදහසක් කිසිකලෙක කිසිතැනෙකදී නොනැගේවා! තිරිසනකුගේ සිතෙහි ධර්ම චින්තාවක් දැහැමි සිතිවිල්ලක් පහළ වීම එතරම් පහසු නොවේ. එහෙත් ඔවුන්ගේම සිත් සතන්හි ආහාර චින්තා කාමුක චින්තා ව්‍යාපාද විහිංසා චින්තා ආදී නොයෙක් විතර්ක චින්තාවෝ - අකුසල් සිතිවිලි එමට පහළ වෙත්. ඒ තිරිසන් කම නිසායි හොඳ නොහෙද විමසා ගන්නට තරම් පෘථුල බුද්ධියක් නැති හෙයිනි.

මිනිසකුගේ පරමාර්ථය උසස් වැදගත් එකකි. එබැවින් යම්තම් යැපෙන පමණ කා බී, වැඩි වැඩ හැර දමා නියම වැඩෙහිම යෙදෙමින් විනීත වෘත්තියෙන් හෙවත් චාම් පැවැත්මෙන් යුක්තව අප උත්සාහ දැරිය යුත්තේ මනුෂ්‍යාත්මභාවය සාර්ථක කර ගැනීම පිණිසය.

මිනිස් තිරිසත්තු - තෙවනුව කියවුණු මනුෂ්‍ය නාරකික හෙවත් මිනිස් තිරිසතුන්ගේ කොටසට අයත් තැනැත්තේ දුටු හැටියෙහි ම මේ ජීවිතයේ දීම තම නිවෙස දුකින් හා මහත් කම්කටුල්ලෙන් පිරුණ නිරයක් කරගනී. ඒ නිවෙස දුක් උණන ඌලෙකි. (උල්පතකි) බැගෑ හඬ ඇසෙන, අඬදබර කෝලාහල උදාවෙන මෙලොව අපායකි. කොතරම් අභාග්‍ය අසරණ මනුෂ්‍යයෝ අද මෙලොව අපාය නමින් දැක්වෙන හිරගෙවල දුක් විඳිත්ද? මේ සියල්ලටම එක් ප්‍රධාන හේතුවක් නම් මනුෂ්‍යාත්මය වරදවා ගැනීමයි. මේ මිනිස් තිරිසන් කොටසට අයත් තැනැත්තේ තමාගේ හැම බලයක් ම පාහේ මිනිස් කමට නොගැලපෙන දෙයෙහි යොදමින් පරලොව පිළිබඳ හැඟීමක් වත් නැතිව කල්හරිති. අපරාධ විළිබිය බිඳක්වත් නැතිව කෙරෙයි. ආගම ධර්මයෙන් තොරව බාහිර ශිල්ප ශාස්ත්‍ර පමණක් උගත් ඇතමුන් ඇතැම්විට ශාස්ත්‍රානුකූලවම අපරාධ කරන බවත් දැන් රහසක් නොවේ. මෙම මිනිස් තිරිසතුන්ගේ ගණයට වැටෙන තැනැත්තාට හොඳින් ජීවත්වන තමා බඳු මිනිසකු සුළු වරදක් නිසා සැහැසිව පිහියකින් ඇන හෝ වෙන උපක්‍රමයකින් හෝ මරා දැමීම එතරම් අපහසු කාරණයක් නොවේ. එහෙත් එය කොතරම් සංවේගදායකද? කොතරම් බිහිසුණුද?

"විද්‍යා දදාති විනයං" - විද්‍යාව - උගත්කම, විනය හෙවත් සදාචාරය, සභ්‍යත්වය ළඟාකර දෙන්නී යයි පැරැණි දැනුමැතියන් කීවේ නියම ආගමානුකූල ඉගෙනීමෙන් එසේ සිදුවන නිසායි. එහෙත්, නවීන ලෝකයේ විද්‍යාව කොතෙක් දියුණු වුවද එය ආගමිකයන් - ආධ්‍යාත්මික දියුණුවෙන් අහසට පොළොව සේ දුරු වූ හෙයින් යහපතට වඩා අයහපත සිදුකරලන බව ලෝකය දෙස විචාරක්ෂියෙන් බලන්නාට වැටහෙනවා ඇත. "පරමාණු බෝම්බය උසස් භෞතික විද්‍යාඥානයක, මහා පර්යේෂණයක උසස් ප්‍රතිඵලයකි. මෙයින් වූයේ කවර යහපතක් දැයි සිතා බලන්න.

භෞතික විද්‍යායෙහි හසළ බුද්ධිමතෙකු වූ ශ්‍රීමත් වෙන්කටරාමන් මෙසේ කියයි. "අප බුදුරජාණන් වහන්සේ විසින් සර්ව සත්ත්වානුකම්පාවෙන් දේශනා කොට වදහළ ශ්‍රී සද්ධර්මය මුළු මනුෂ්‍යවර්ග යාටම අයත් වූ "මෙතෙක් වටී යැයි" අගය කළ නොහැකි ඉතා ගෞරවාදර දැක්විය යුතු දායාදයෙකි. තථාගතයන් වහන්සේ විසින් සියලු සැපතට කාරණා වූ මේ ධර්මය දේශනා කොට අවුරුදු දෙදහසකටත් වැඩි කලක් ගෙවී ගියේය. එහෙත්, අප බුදුරජාණන් වහන්සේගේ ධර්මය අදත් අතිශයින්ම අලුත්ය. බුද්ධධර්මය අදත් අවුරුදු දෙදහස් ගණනකට පෙර සේ ම බැබළේ. ප්‍රඥාව කැමැති සියල්ලෝ මේ ශ්‍රී සද්ධර්මයම සොයත්වා!

"බුදුරජාණන් වහන්සේගේ ධර්මයෙන් අපමණ මිනිස්සු ආලෝකය ලබා ගත්හ. මේ ධර්මය නිසා කෝටි ගණන් මිනිස්සු භාග්‍යසම්පන්න වූහ. ඒ පරම ශාන්තිකර සද්ධර්මය තවත් බොහෝ කලක් මනුෂ්‍යවර්ගයාට හොඳ මඟ පෙන්වන්නා වූ ප්‍රදීපයක්ව බැබළේවා!"

"උගුරට හොරා බෙහෙත් කන්නට බැරිය"යි කීවාක් මෙන් තමන්ගේ සිතට නො දැනෙන සේ කිසිවක් නොකට හැකිය. හොඳ දෙයක් හෝ නරක දෙයක් හෝ තමන්ගේ සිත දැනුවත්වම කළ යුතුය. තමන් සිතන කියන, කරන හැම සිතිවිල්ලකටම, හැම කීමකටම, හැම කැරුමකටම අවංක සාක්ෂ්‍යකරු වූ තමන්ගේ චිත්ත සන්තානයම දෙස් දෙයි. වරදකොට නිවැරදි කරු වන්නට කොතෙක් වෑයම් කළත් තමාගේ අවංක සාක්ෂිකරු එනම් සිත ඊට ඉඩ නො දෙයි. නින්දට පෙර තනිවම සිය සිතත් සමග අවංක සාකච්ඡාවක යෙදුණොත් ඒ සිත තමා කළ, දැනට කරන, මතු කරන්නට අදහස් කරන සියල්ල මේ මේ යැයි විභාග කොට වෙන්කොට දක්වනවා ඇත. ඇතැම්මු තමා කළ වරද සිතත් සිතත් ම ඉවසා දරා ගත නොහී වටිනා ජීවිතයට හානි පමුණුවා ගනිති. එය නිදසුන් මේ දිගු පුළුලු ලෝකයේ කොතෙකුත් ඇත්තාහ. පුවත්පතිනුත් ලෝක වාර්තායෙනුත් ඒ බව මනාව ඔප්පු වේ. පිරිසුදු වන්නට, අහිංසක වන්නට තැත් කළද වරද කරුගේ ඇතුළත දැවෙන්නේ මය. කල් ගොසින් නමුත් පසුතැවෙන්නට කනගාටුවන්නට සිදුවන්නේය.

**"න තං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති යස්ස අස්සු මුඛො රොදං - විපාකං පටි සෙවති"**

යමක් කොට පසුව තැවෙන්නට, කඳුළු මුහුණින් යුතුව විපාක විඳින්නට සිදුවේද, එබඳු ක්‍රියාවක් නොකරනු මැනැවැයි ධම්මපදයෙහි දැක්වෙන්නේ මේ නිසායි. එබැවින් තමා පිළිබඳ සියල්ලටම තෙමේම වගකියයුතු බව සලකා ගෙන මනුෂ්‍ය නාරකික කොටසට නොවැටෙන්නට උත්සාහ දරනු මැනැවි.

**පරමාර්ථ මනුෂ්‍යයෝ** - සතරවනුව කියවුණු පරමාර්ථ මනුෂ්‍ය වර්ගයට අයත් තැනැත්තේ කලෙකින් ලත් මේ අගනා අවස්ථාවෙන් නියම ප්‍රයෝජන ලබන්නට නිතොරම උත්සාහවත් වෙයි. විළිබිය දෙකින් යුතුව කම්ඵල අදහැගෙන හිතා'හිත දැ දැන, මඟ නොමඟ වටහාගෙන සංවේග බහුලව දුසිරිතින් මිදෙයි. සුසිරිතෙහි බැඳෙයි. **"චරෙයයාදිත්ත සිසෝ'ව"** යී කී පරිදි ඉසගිනි ගත්තකු එගිනි නිවන්න ඉක්මන් වන්නාක් මෙන් එකොළොස් කෙළෙස්ගින්නෙන් දැවෙන සසර නමැති ගිනිගෙන් නික්ම යන්නට වෑයම් කෙරෙයි. එබඳු කල්‍යාණ පෘථග්ජන තෙමේ

**"දුල්ලභං ච මනුස්සත්තං - බුද්ධුප්පාදො ච දුල්ලභො දුල්ලා ඛණසම්පත්ති - සද්ධම්මො පරම දුල්ලභො"**

යි වදහළ පරිදි මිනිසත්බව ලබාගැනීමේ අපහසුකමුත්, එය දුකසේ ලැබිය යුතු බවත්, බුද්ධොත්පාදයෙහි දුර්ලභතාවත්, චතුරාර්ය සත්‍යාවබෝධයට අවශ්‍ය කුසල් කළ හැකි ක්ෂණ සම්පත්තියගේ දුර්ලභභාවය හෙවත් නිර්වාණය සාදාදෙන පින්දහම් කරන්නට පොහොසත්වූ (ත්‍රිවිධ අපාය ආදි අෂ්ට දුෂ්ට ක්ෂණයන්ගෙන් තොරවූ) නවවැනි ඉෂ්ට වූ ක්ෂණය අමාරුවෙන් ලැබිය යුතු බවත් නුවණින් විමසා දැන ස්වසන්තානයෙහි පාපචිත්තාවන්ට ලගින්නට ඉඩ නොදෙයි. **දිට්ඨධම්මික, සම්පරායික, ලොකුත්තර** හෙවත් මෙලෝ දියුණුවය, පරලෝ දියුණුවය, ලොවුතුරා දියුණුවය යන මේ ත්‍රිවිධාර්ථයම - තුන් වැදෑරුම් දියුණුවම සලසාදෙන ධර්මචින්තාවන් කෙරෙහිම සිත යොමු කරන්නට උත්සාහ දරයි.

පරමාර්ථ මනුෂ්‍යතෙමේ මේ ජීවිතය වගකියයුතු වැදගත් එකක් බව ප්‍රත්‍යක්ෂයෙන් ම දැන, හැකි පමණ අධර්මය මඬිමින්, ධර්මය වඩමින් අපරාධයන්ගෙන් වැලකෙමින් ලොවට ආශීර්වාදයක්මුත් ශාපයක් නොවන ලෙස ජීවත්වන්නට වෑයම් කෙරෙයි. ඒ සඳහා මේ විවිධ විෂම ලෝකයෙහි කැරෙන ජීවිත සටනේ දී කොතෙක් බාධා පැමිණියත් , පසුබට නොවී **"මා නිවත්ත අභික්කම"යි** කී පරිදි නොනැවත පෙරමුණටම ය යි. සියලු ගැහැට ඉෂ්ටාර්ථය සලසාදීම්වස් පැමිණි සේවකයන් මෙන් සලකමින් සියල්ල කර්මයට භාර නොකොට අභිමතාර්ථය දෙපා ළඟට එතැයි සිතා නො හිඳ උත්ථානවීර්යයෙන් ක්‍රියා කරන්නට වෑයම් කෙරෙයි. සුළු ලාභයක් නිසාවත්, සදහටම නො පවත්නා කීර්තියක් නිසාවත්, වෙනයම් ආත්මාර්ථයක් නිසාවත් ඡන්දයෙන් හෝ ද්වේෂයෙන් හෝ භයෙන් හෝ මෝහයෙන් හෝ අගතියට නොයන්නට උත්සාහ දරයි. අයුත්තේදී ටැඹක් මෙන් නොනැමී සිටියි. යුතුකමට හිසනමයි. කිසිවකු සතුටු කරන්නටවත්, ඇත්තට පිටුපා පැත්තක්ගෙන අයුක්තියක් කරන්නට මැළිවෙයි., අවංක වෙයි. සිත කය දෙකෙන් ම අවංක වෙයි.

අවංකකම නිසා ඊර්ෂ්‍යාපරවශ අසත්පුරුෂ පින්වතුන්ගේ අපහාසයට ද ලක්වෙයි. ගැහැටත් විඳියි. එහෙත් ඒ සියල්ල ඉවසයි. අසත්පුරුෂ මෝඩ පින්වතුන්ගේ අකාරුණික කියුම් කැරුම් ඔවුන්ට බියෙන් මෙන් නොව අනුකම්පායෙන් ඉවසයි. අයුක්තිය නිර්දයව මඩියි. යුතුකමට දිවි වුවද පුදයි. ඇත්ත පහදා දුන්කල, යමක් කාරණානුකූලව ඔප්පු කළ හිස් තර්ක ගෙනහැර පා බොරුවෙන් දිනන්නට වෑයම් නොකෙරෙයි. සත්‍යය මුදුනින් පිළිගනියි. සත්‍යය උදෙසා යුතුකම උදෙසා දිවි වුවද පුදයි. එය ඔහුට නිවනෙන් මෙපිට නො නැසෙන සැපතෙකි.

හෙතෙමේ ආත්ම ගෞරවය රන්රුවන් සේ අගය කෙරෙයි. එහෙයින් පිදිය යුත්තාට පුදයි. ගරු කටයුත්තාට ගරු කෙරෙයි. නොමගින් නො නිසි ලෙස ලැබෙන ලාභයක් නිසා දත්, නිය නැති කොටියකු මෙන් දළබුන් සර්පයකු මෙන් දීනව, බැගෑව නො හැසිරෙයි. කෙනෙකුගේ ඇති අගුණ වසමින් නැති ගුණ කියා පාමිනි, මුව නො සෑහෙන තරම් පසසමින් චාටු කථායෙන් ඔවුන් සිත් ගනිමින් දාසයකු මෙන් නො හැසිරෙයි.

මෙබඳු විවිධ විෂම ලෝකයක යට කී අයුරු අවංකව ධාර්මිකව කල් ගෙවීම නම් ඉතා අමාරුයෙන් දහසක් බාධා අස්සේ කටයුත්තකි. එහෙයින් එබඳු පරමාර්ථ මනුෂ්‍යයෝ සුලබ නො වෙති. එහෙත් ඔවුන්ගේ ජීවිතය රන්රුවන් සේ වටී. **"රූපං ජීරති මච්චානං නාමගොත්තං නජීරති"**යි වදහළ පරිදි එබන්දන්ගේ රූපය නැසී වැනසී ගියත් ගුණ ධර්ම නමැති රූපය ඉර හඳ සේ පවතී. සදානුස්මරණීය වනුයේ ඒ ගුණධර්ම නැමැති ශරීරයයි.

පරමාර්ථ මනුෂ්‍යයා අනුන් හටත් සෙතක් යහපතක් කරන්නට වෑයම් කෙරෙයි. එහේ පරවැඩ (පරාර්ථචර්යාව) කරන්නට යයි ඉදිරිපත් ව ඒ

සියල්ලේ සාරය කුරුබිලියෙන් අත් වැඩට නො හරවයි. අනුන්හට උපකාරයක් කරන ගමනේ ඒ මගින් නිතොරම බලාපොරොත්තු වනුයේ ආත්මාර්ථය නම්, තමන්ගේ අඩුපාඩුවක් පිරිමසා ගැනීමම නම් එය දුබල කමෙකි. මහාත්මා ගති ඇති සත්පුරුෂයෝ එබඳු දේ පිළිකුල් කෙරෙති. පරාර්ථයෙහි යෙදෙන්නාගේ ආත්මාර්ථය ද එක්තරා පමණෙකින් සැලසෙන බව ද ඇත්තෙකි. එහෙත්, ආත්මාර්ථය සිදුකර ගන්නා අටියෙන්ම ඒ අධිෂ්ඨානයෙන් ම පරවැඩ කරන්නට ඉදිරිපත් වීම දීන කමෙකි.

තව ද දියුණුවේ මඟට පිළිපන් තැනැත්තා '**වායමෙථෙව පුරිසො න නිබ්බින්දෙයය පණ්ඩිතො**' පෞරුෂයක් ඇත්තේ වීර්යකරන්නේමය. නුවණැතියේ නොකළකිරෙන්නේය යන බුදු බණ සිහිකොට ඉදිරියටම යයි. නුවණට අනුව ගිය වීර්ය හැම දියුණුවම ලබා ගැනීමට උතුම් අතක් මෙනැ යි දනුමැතියන් කී වචන මෙනෙහි කොට අනුන් පිටම වරද නොතබා තමන්ගේ දුර්වලතැන් විමසා දැන බලාපොරොත්තු මුදුන් පමුණුවා ගන්නට උත්සාහ දරයි. **"අත්ථො අත්ථස්ස නක්ඛත්තං කිංකරිස්සන්ති තාරකා"** බලාපොරොත්තු වන තැනැත්තා බලාපොරොත්තු වන අර්යම දෙයම නැකතය. නැකත්කරු කුමක් කරන්නහු ද? එහෙයින් 'තමන් හිසට තමන්ගේ අතමය' කීවාක් මෙන් හෙතෙමේ ආත්මනාථ භාවයෙන් තමන්ගේ පිහිට සොයමින්, තමන් කෙරෙහි විශ්වාසය තබාගෙන වෑයම් කෙරෙයි.

"විරියවතො භික්ඛවෙ කිං නාම න සිජ්ඣති" මහණෙනි, වීරයාට කවරනම් දෙයක් ජය ලබා නොදෙයිද යනු බුද්ධ වචනයි පෞරුෂයෙන් යුක්තව යමක් ආරම්භකොට, අදහස් පමුණුවාගත නොහැකිව මගී බිඳ වැටුණත් එය කිසිසේත් නින්දාවට කරුණු නොවෙති. වැටී වැටී නමුත් නැඟිටින්නට පුරුදු විය යුතුය. **"උට්ඨහථ! කො අත්ථො සුපිපෙන වො"** නැඟිසිටිව් නිදිමෙන් තොපට කවර ප්‍රයෝජනද?

පරමාර්ථ මනුෂ්‍යයා පිළිබඳව ලිය යුතු දෑ බොහෝ වෙතත් මෙබඳු පොත් පොඩියකින් එබු දිග විවරණයක් නොකට හැකිය. එබැවින් මෙතෙක් ලියැවුණු දැයින් උගතහැකි යමක් ඇතොත් එය ඉගෙන එපමණකින් සෑහීමකට නොපැමිණ උගත් දෑ ක්‍රියායෙහි යොදවමින් ප්‍රතිපත්ති ගුරුකව, ගුණදම් සිය සිත්සතන්හි වවන්නටවත්, වැටුණු දේ මතුමත්තෙහි වඩන්නටත් එය අතරතුර නොනැසියදී රැකගන්නටත් තරයේ වැරවඩත්වා!

**"කලකිනි බුදු කෙනකුන් උපදි න්නේ**
**දුකකිනි මිනිසත් බව ලැබ ගන්නේ**
**මෙදෙකිනි මෙසසර දුක් දුර ල න්නේ**
**සුදනෙනි කිම වීරිය නොකර න්නේ"**

**"මෙතුන් ලොව සව් ස ත**
**මෙත් සිත් කර අනනු වෙ ත**
**වැඩෙමින් ඇති සැප ත**
**නිදුක් වෙත්වා ලැබ නිවන් සෙ ත**

**සදහම් පවතී වා**
**යෙහෙන් රජ රට රකී වා**
**කලට වැසි වසී වා**
**ලොවැසි සමඟිව දිගා වේ වා"**

**බම්බලපිටියේ වජිරාරාමවාසී**
**පූජ්‍ය පියදස්සී ස්වාමීන්වහන්සේ**

## ඔබගේ ලිපි අප වෙත යොමු කරන්න

බෞද්ධාලෝක සඟරාවේ පලකිරීම සඳහා ඔබ විසින් රචිත ධර්ම කරුණු ඇතුළත් ශාස්ත්‍රීය ලිපි හා නිර්මාණ අප වෙත යොමු කරන මෙන් ගරුතර මහා සංඝරත්නය ප්‍රමුඛ සියලුම පාඨකයන් වෙතින් ඉල්ලා සිටිමු.
ඔබගේ නිර්මාණ පැහැදිලිව ලියා හෝ පරිගණක ගත කර අදාළ ඡායාරූප (තිබේ නම්) ද සමඟ යොමු කරන්න.
දෙමසකට වරක් සඟරාව මුද්‍රණය වන බැවින් සඟරාව නිකුත්කල පොහෝ දිනට
පසු දින 15 ක් තුළ ඔබගේ ලිපි යොමුකිරීමට කාරුණික වන මෙන් ඉල්ලමු.

සංස්කාරක



# බුදු සමයෙන් ඉගැන්වෙන සාමයේ පණිවුඩය

සියලු ලෝකවාසී බෞද්ධයන්ට ඉතා වැදගත් ප්‍රධානතම බෞද්ධ උත්සවයක් වන්නේ වෙසක් උත්සවයයි. බුදුන් වහන්සේගේ ඉපදීම, බුද්ධත්වයට පත්වීම සහ පිරිනිවන් පෑම යන විශේෂ අවස්ථා තුන සිහිපත් කරමින් ශ්‍රී ලංකාව, ඉන්දියාව, මැලේසියාව, මියන්මාරය, තායිලන්තය, සිංගප්පූරුව, වියට්නාමය, ජපානය, ඉන්දුනීසියාව, හොං කොං සහ තායිවානය වැනි බොහෝ ආසියානු රටවල වෙසක් උත්සවය පැවැත්වෙන අතර, මේ බොහෝමයක් රටවල වෙසක් දිනය ප්‍රසිද්ධ නිවාඩු දිනයකි. වෙසක් දිනයේ සියලු සැදැහැවත් බෞද්ධයන් ආමිෂ සහ ප්‍රතිපත්ති පූජාවල යෙදෙති.

මහාවංශයේ දැක්වෙන පරිදි අනුරාධපුර යුගයේ සිට ලංකාවේ ක්‍රමවත් පිළිවෙළකට වෙසක් උත්සව පවත්වා ඇත. ශ්‍රී ලංකාවේ වෙසක් උත්සවයේ ආරම්භය වන්නේ ක්‍රි.පූ. 161 ත් 137 ත් අතර කාලයේ ලක්දිව පාලනය කළ දුටු ගැමුණු රජුගේ කාලයේ දී ය. වසර 24 ක් රාජ්‍ය පාලනය කළ දුටු ගැමුණු රජතුමා වෙසක් උත්සව විසි හතරක් පැවත් වූ බව එහි සඳහන් වේ. මහා වංශයේ 32 වන පරිච්ඡේදයේ 33 - 35 ගාථා පාඨවල එම තොරතුරු ඇතුළත් වේ. දුටු ගැමුණු රජතුමන්ගෙන් අනතුරුව ක්‍රි.ව. 38 - 67 අතර කාලයේ රාජ්‍ය පාලනය කළ භාතිය රජු වෙසක් උත්සව 28 ක් ද, ක්‍රි.ව. 67 ත් 106 ත් අතර කාලයේ රාජ්‍ය පාලනය කළ වසභ රජු වෙසක් උත්සව 44ක් පවත්වා ඇති බව සඳහන් වේ. වසභ රජුගේ එම පින්කම පිළිබඳව මහාවංශයේ 35 වන පරිච්ඡේදයේ 99 - 100 ගාථා පාඨවලින් විස්තර වේ. තව ද ක්‍රි.ව.215 - 337 අතර කාලයේ වසර 22 ක් රාජ්‍ය කළ වෝහාර තිස්ස රජතුමන් ද වෙසක් පූජා පැවැත්වූ බව මහාවංශයේ 36 වන පරිච්ඡේදයේ 38 - 39 වැනි ගාථා පාඨවල සඳහන් වේ. ක්‍රි.ව. 253 - 266 අතර කාලයේ රජකම් කළ ගෝඨාභය රජතුමන් විසින් සිදු කරන ලද වෙසක් පින්කම් පිළිබඳව 36 වැනි පරිච්ඡේදයේ 108 - 110 ගාථාවල සඳහන් වේ. ක්‍රි.ව. 332 - 340 ත් අතර කාලයේ රජකම් කළ

ජෙට්ඨතිස්ස හෙවත් දෙටු තිස් රජතුමා, ක්‍රි.ව. 608 - 614 ත් අතර කාලයේ රජ කළ මුගලන් රජතුමන්, ක්‍රි.ව. 866 - 901 ත් අතර කාලයේ රජකළ දෙවන සේන රජතුමන් පිළිබඳව මහා වංශයේ සඳහන් වේ.

ඒ අනුව ඉතා ඈත අතීතයේ දී රජු, රට වැසියන් සමඟ එක්ව වෙසක් උත්සව පවත්වමින් මහ සඟරුවනට දාන මාන පින්කම් සිදු කිරීම, දුගී මඟී යාචකයන්ට ආහාර පාන සහ ඇඳුම් බෙදා දී ඇත. වෙසක් මඟුල අති පුරාණ බෞද්ධ උත්සවයක් බවත්, ආදී කාලයේ පටන් පවත්වන බවට පාහියන් හිමියන්ගේ දේශාටන වාර්තා වලින් ද හෙළිදරව් වේ. එකල බෞද්ධයා වෙසක් උත්සවය ශ්‍රද්ධාවෙන් සහ ගෞරවයෙන් සැමරීම සඳහා වෙසක් පොහොයට මාස ගණනාවක සිට ලක ලෑස්ති වී ඇත.

වෙසක් සැමරීමේ දී සියලු මත්පැන් අලෙවි සල්, මස් පිණිස සතුන් මරණ ස්ථාන, මස් වෙළෙඳ සල් වසා දැමෙන අතර, නිදහස සංකේතවත් කරමින් ඇතැම් සිරකරුවන්ට සමාව ලබා දීම ද සිදු කෙරේ. මේ සියලු කටයුතුවලින් සාමය සංකේතවත් කෙරේ. එසේනම් එවැනි දෑ කිරීමට මිනිසුන් පෙළඹෙන්නේ බුදු දහම තුළ සාමය සහ සහජීවනය උතුම් කොට සලකන හෙයිනි. බුදු දහම සෑම වර්ග යකම බෙදීම්වලට විරුද්ධව වන අතර සාමකාමී ජීවිතයකට මඟ පෙන්වයි. එසේ නම් මේ වෙසක් පොහොය නිමිත්ත කර ගනිමින් හෝ බුදු රජාණන් වහන්සේ විසින් සාමය සහ සහජීවනය රැගගනිමින් ලෞකික ජීවිතය සාර්ථක කර ගැනීමට උපදෙස් විමසා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ යුතුය.

නහිවේරේන වේරානි
සම්මන්තිධ කුදාචනං
අවේරේන ද සම්මන්ති
ඒස ධම්මෝ සනත්තනෝ

- ධම්මපදය -

අර්ථය :

මෙලොව කිසිදු වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම සංසිඳෙත්, මෙය සනාතන දහමයි. යුද කෝලාහල, අවි ගැටුම් සහිත පරිසරයක කිසිවකුට සතුටින් ජීවත් වීමට නොහැකිය. බුදු රජාණන් වහන්සේ සාහසිකම්, අසමගිකම් යුද ගැටුම් පිළිකෙව් කළ සේක. ජාතීන් අතර සුහදතාව ඇති කිරීම සඳහා බුදු රජාණන් වහන්සේ හැකි සෑම විටම මැදිහත් වූ බව පෙන්වීමට උදාහරණ ඕනෑ තරම් තිබේ. භෞතික වශයෙන් පමණක් නොව, ආධ්‍යාත්මික සාමය ඇති කර ලීම සඳහා මිනිසුන් කෙරෙහි කරුණාවෙන් නිවන් මඟ පෙන්වා දුන් සේක.

චූලෝදර, මහෝදර නා රජුන් මැණික් පුටුවකට යුද වැදීමට සූදානම් වූ අවස්ථාවේ එය දිවසින් දුටු බුදුරජාණන් වහන්සේ මහා මිනිස් ඝාතනයක් වැළැක්වීම සඳහා නාගදීපයට වැඩම කළ සේක. මැණික් පුටුවේ වැඩ හිඳ චූලෝදර මහෝදර හා මණිඅක්ඛික නා රජු ඇතුළු නාගයන්ට සමගියේ අගය පිළිබඳව වටහා දෙමින් ධර්ම දේශනා කළ සේක. දේශනාව අවසානයේ සතුටට පත් වූ නාගයින් ගැටුමට මුල් වූ මැණික් පුටුව බුදුරජාණන් වහන්සේටම පූජා කළහ. එසේ තමන් වහන්සේට පූජා කළ මැණික් පුටව උන්වහන්ස් පෙරලා පවරා දී තමන් වහන්සේ සමඟ පැමිණි සමිද් සුමන නම් දෙවියන් රැගෙන ආ කිරිපලු නුග රුක ද පූජ්‍ය වස්තුවක් කොට දෙව්රම් වෙහෙරට වැඩම කළ සේක.

වජ්ජි දේශය ආක්‍රමණය කිරීමට අජාසත් රජුගේ සිතෙහි ඇති වූ අදහස බුදු රජාණන් වහන්සේ වෙනස් කළ ආකාරය පිළිබඳව මහා පරිනිබ්බාන සූත්‍රයෙහි දැක්වේ. රෝහිණී නදියේ ජලය බෙදා ගැනීම සම්බන්ධයෙන් ශාක්‍යවංශිකයන් සහ කෝලිය වංශිකයන් අතර දරුණු ගැටුමක් ඇතිවීමට ගිය අවස්ථාවේ දී ජීවිතයක වටිනාකම කියා දී එය සමථයකට පත් කිරීමට උන් වහන්සේට හැකි විය.

චක්කවත්ති සීහනාද සූත්‍රයහි ආයුධ භාවිතයෙහි ආදීනව විස්තර කොට ඇති අතර සාමයෙන් සහ සතුටින් සියලු සත්ත්වයන් එක්ව ජීවත් වීම සඳහා වැදගත් වන ප්‍රධාන කරුණු හයක් පෙන්වා ඇත.

1. මෛත්‍රී සහගත කායික ක්‍රියාවල නිරත වීම.
2. මෛත්‍රී සහගත වචන භාවිතය.
3. මෛත්‍රී සහගත සිතිවිලිවල නිරත වීම.
4 තමාට ලැබෙන දේ සම්පව ඇසුරු කරන්නන් අතර සමසේ බෙදා ගැනීම.
5. සදචාරාත්මක ජීවිතයක් ගත කිරීම.
6. නිවැරැදි ලෝක දෘෂ්ටියක් මත පිහිටා කටයුතු කිරීම.

කවර ජාතියකට අයත් වුවත්, කවර ආගමකට අයත් වුවත් සියලු දෙනාහට සතුටින් ජීවත් විය හැකි වන්නේ සාමය තිබේ නම් පමණි. කෝලාහල, යුද

ගැටුම්, බෝම්බ පිපිරීම් වැනි අවස්ථාවලට මුහුණ දෙන සියල්ලන්ට මරණ බියෙන් තැනි ගන්නාහ. ප්‍රියයන්ගෙන් වෙන් වීමෙන් දුකට පත්වන්නාහ. ජීවත් වීමේ අයිතිය සියල්ලන්ටම තිබිය යුතුය.

බුදුරජාණන් වහන්සේ අන්‍ය ආගමිකයන් සමඟ සමගිව මිත්‍රකම් පැවැත් වූ සේක. බුදු රජාණන් වහන්සේ ආගමික වශයෙන් හෝ කුල වශයෙන් හෝ උස් පහත් ලෙස කිසිම විටෙක කිසිවකු වර්ග කර නොමැති අතර, රාහුල කුමරු පැවිදි කළ ආකාරයටම සුනීත සෝපාක වැනි එකල පහත් යැයි සම්මත කුල දරුවන්ට ද පැවිද්ද ලබා දුන් සේක. උන් වහන්සේ දේශනා කළ කාලාම සූත්‍රයට අනුව නිදහස් චින්තනය සහ සහනශීලි පැවැත්මෙහි අගය දැක්වේ. මහා පරිනිබ්බාන සූත්‍රයට අනුව තම ප්‍රදේශයට පිටින් එන ශ්‍රමණ බ්‍රාහ්මණයන් තමන් ගරු කරන පූජකවරුන්ට හා සම තත්ත්වයෙහි ලා සලකා ගරු සැලකිලි දක්වන්නැයි බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේට උපදෙස් ලබා දී ඇත.

දීඝ නිකායේ පච්චන්ද වර්ගයෙහි එන උපමා කතාව තුළින් විවිධ මත වාද දෘෂ්ටි වාද ආගම් වාද සම්බන්ධයෙන් මිනිසුන් ක්‍රියා කරන ආකාරය උන් වහන්සේ පෙන්වා දෙන්නේ අලියා සහ අන්ධයාගේ උපමා තුළිනි. අලියාව අත ගා බලමින් අලියාගේ ස්වරූපය මෙසේ යැයි වැරැදියට වටහා ගැනීම ඉන් දක්වා ඇත. තවද කිසියම් සේවයක් ලබා දීමේ දී එම සේවය ලබා දෙන්නේ කුමන ජාතියක කුමන ආගමකට අයත් පුද්ගලයෙක් ද යන්න නොවැදගත් වන බව වනාරෝප සූත්‍රයෙහි දක්වා ඇත.

වසර 2500ක ට වඩා පැරැණි යුගයක සිට මනුෂ්‍යයා වෙත මෙත් කරුණාවෙන් ලබා දුන් උපදේශ හා දේශනා අදටත් වලංගුවේ මේ උතුම් මනුෂ්‍ය ජීවිය මරණය සිදුවන තෙක් සාමයෙන් සහ සහජීවනයෙන් ගත කිරීම සඳහා බුදු දහමට ජීවිතයට සමීප කර ගත යුතු වේ. වෙසක් උත්සවය යනු බුදුරජාණන් වහන්සේගේ දේශනා සිහිපත් කර ගැනීමට හොඳ ප්‍රවේශයකි.

ශ්‍රද්ධාව සහ සාමූහිකත්වය වෙසක් උත්සවය සැමරීමේ දී කැපී පෙනෙන ලක්ෂණයකි. ප්‍රතිපත්ති පූජාවල යෙදීමට කැමැති බෞද්ධයින් පන්සල්වලට ගොස් සිල් සමාදන් වී දවස පුරා භාවනාවේ යෙදීම, බණ ඇසීම, වන්දනා කිරීම් ආදී කටයුතුවල යෙදෙන අතර, ආමිෂ පූජාවල යෙදීමට කැමැති බෞද්ධයින් සිල් සමාදන් වූ අය සඳහා දානමාන කටයුතු කිරීම, ගිලන්පස ලබා දීම, පූජා කිරීම සඳහා මල් දන්සල් පැවැත්වීම ආදී කටයුතුවල යෙදෙති. බෞද්ධ නිවෙස්වල බෞද්ධ කොඩිය ප්‍රදර්ශනය කරනු ලබයි. තවද පුණ්‍ය ක්‍රියාවන් සාමූහිකව පැවැත්වේ. වෙසක් උත්සවය පැවැතෙත්දි දන්සල් පවත්වනු ලබන්නේ සාමූහිකවය. වෙසක් කූඩුවක් තැනීම සඳහා ක්‍රියාවන් ගණනාවක් සිදු කළ යුතුවේ. කූඩුවක් තැනීම සඳහා සුදුසු බට පඳුරක් සොයා ගැනීම, බට අතු කපා සුද්ධ කිරීම, නියමිත පරිමාණයට ලී පතුරු කපා ගැනීම, සැකිල්ල තනා ගැනීම, සව් කඩදාසි හෝ වෙනත් සුදුසු ද්‍රව්‍යයක් යොදා ගනිමින් එය සැරසීම යන ක්‍රියාවලිය අවසානයේ වෙසක් කූඩුව තනා නිම කෙරෙන අතර ඉන් පසුව ඉටිපන්දම් පත්තු කර එය ගසක අතුවල එල්ලීම යන ක්‍රියාවලිය පවුලක සියලුම සාමාජිකයන්ගේ එකමුතුවෙන් සිදු කරන ලදී. පන්සල් අසල මල් දන්සල්, ඔසුපැන් දන්සැල් සාමූහිකව පහන් සිතින් පැවත් වීමත් එකල දක්නට ලැබුණි.

කාලයත් සමඟම වෙසක් උත්සවය වාණිජකරණය වීමට ලක්ව ඇති බව නිදසුන් බෙහෝ දැකිය හැකිය. දුවා දරුවන් සමඟ එක් ව වෙසක් කූඩු සකස් කිරීමට දෙමාපියන්ට වේලාවක් නොමැති අතර, දරුවන්ට ද විවේක වේලාවක් නොමැත. ඒ හේතුවෙන් පාරවල් දෙපැත්තේ ගොඩගසා ඇති නිම කළ වෙසක් කූඩුවක් හෝ සැකිල්ලක් රැගෙන ගොස් බල්බයක් දමා නිවෙසේ එල්ලන අතර, එම වෙසක් කූඩුවම ඊළඟ වසරේ ද දූවිලි මකුළු දැල් පිස දමා එල්ලති. මහා ගොරහැඩි සංගීතයක් ඇසේ නම් එතැන කුමක් හෝ දන්සලකි. බත් දන්සල් නිවෙස්වල සියලු දෙනා දන්සල් අසල දිගු පෝලිම්වල සෙල්ෆි ගනිමින් තම වාරය උදා වෙන තෙක් විහිළු තහලු සාමීච්වල යෙදෙති. අන්ත අසරණ දුගී මඟී යාචකයෝ ඒ පෝලිම් අසලටවත් යා නොහැකිව බලා සිටිති. වෙසක් පොහොය මෙවැනි විප්‍රකාර විහිළු කටයුතු සිදු නොකොට හරවත් යමක් කළ හොත් ඉන් ලබන සතුට අසීමිතය. කිසිවකු නොමැති බෙහෙත් ගන්ට මුදල් නොමැති අන්ත අසරණ රෝගීන් ඕනෑ තරම් රෝහල්වල සිටිති. පහසුකම් නොමැති පොදු ස්ථාන එමට ඇත. දරිද්‍රතාවයෙන් පෙළෙන පිරිස් එමට සිටිති. ආගම් භේද කිසිත් නොමැතිව එවැනි පිරිස් වෙත දයාව මිත්‍රත්ව ලබා දීමට වෙසක් පොහොය නිමිති කර ගනිමු.

**ගීතිකා සෙනෙවිරත්න**
(බී.ඒ. කැලණිය, එම්.ඒ කොළඹ, අධ්‍යාපන ඩිප්ලෝමා ජා.අ.ආ)
කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය



# අනුරාධපුර නගරය දෙව්පුරයක් ලෙස තැනූ පණ්ඩුකාභය ගෘහ උද්‍යානය

රාජකීය උද්‍යානයක් පිළිබඳ මුල්ම චිත්තාකර්ෂණීය විස්තරය අසන්නට ලැබෙනුයේ පණ්ඩුකාභය රාජ්‍ය සබඳවය. පණ්ඩුකාභය රාජ්‍ය භාරය ඉසිලූ ප්‍රාග් බෞද්ධ ලංකාවේ කාලානුක්‍රමය හා එම වකවානුව පිළිබඳ වංශානුගත විස්තරය පුරාවිද්‍යාත්මකව හෝ ඓතිහාසිකව හෝ සනාථ කිරීම අසීරු බැවින් පණ්ඩුකාභය අවධිය පිළිබඳ වංශානුගත විස්තරය ඇතැමෙකු සැකයට බඳුන් කරයි. පණ්ඩුකාභය අවධියට සබඳව කියැවෙන ගෘහෝද්‍යානය පිළිබඳ විග්‍රහයකට සහ එම යුගය පිළිබඳ වංශානුගත ප්‍රවෘත්තීන්හි විශ්වසනීයත්වය විමසීමට පළමු පණ්ඩුකාභය රාජ්‍ය සමය පිළිබඳ වංශානුගත ප්‍රවෘත්තිය සාකච්ඡාවට බඳුන් කිරීම සුදුසුය.

පණ්ඩුකාභය අනුරාධපුරය මූලස්ථානය කොට රජයට පත් පළමු නරවරයා බැව් සඳහන්ය. එහෙත්, අනුරාධපුරයෙහි ඉතිහාසය වංශ කතාවලට අනුව ඊට පෙර සමයත් දක්වා දිවෙයි. මුලින්ම අනුරාධපුරය ජනාවාස කොට ගන්නා ලද්දේ විජයගේ ඇමැතියකු විසිනි. (මහාවංශය 7.9, දීපවංශය 9.32) මින් අනතුරුව පණ්ඩුවාසදේව රජුට මෙහෙසිය වූ භද්‍ධකත්‍යායනා කුමරිය සමග ඉන්දියාවෙන් මෙහි පැමිණි ඇයගේ සොයුරන් සත් දෙනා අතුරින් අනුරාධ නම් ඇත්තා එහි දකුණින් වැවක් කරවා ඉක්බිති මාලිගාවක් තනවා විසූ බව කියවෙයි. (මහාවංශය 9.1-12). පණ්ඩුකාභය රජු සිය මාමාවරුන් අට දෙනා සමග රාජ්‍යභාරය ගනු පිණිස දීර්ඝ කාලීන සංග්‍රාමයකට එළඹ ඉන් ජය ලැබ එකී අනුරාධ නම් සිය මුත්තණුවන් වාසය කරන තැනට ගියේය. පණ්ඩුකාභය රජුට සිය මාලිගය දුන් අනුරාධ කුමරු වාසය පිණිස අන් තැනකට ගියේය. අනතුරුව රජු විසින් මෙහි නගරයක් ඉදි කරන ලදින්, අනුරාධ නම් වූ දෙදෙනෙකුට නිවාස වූ හෙයින් ද අනුර නම් නැකතකින් පටන් ගත් බැවින් ද එය අනුරාධපුර

යැයි නම් කළේය. (මහාවංශය 10.73-77) අනුරාධපුර නගර නිර්මාණය පිළිබඳ මහාවංශ විස්තරය එසෙසින්ම භාරගන්නේ නම් එතෙක් ග්‍රාමයක්ව පැවැති මෙම ස්ථානයට නගර යන අරුතැති පුර යන යෙදුම ආදේශ වනුයේ පණ්ඩුකාභය නගර නිර්මාණයෙන් තදනන්තරව බව පිළිගැනීමට සිදු වෙයි. පණ්ඩුකාභය රජු වාස්තු විද්‍යාව දන්නන් විමසා නගරය බොහෝ නගරාංගයන්ගෙන්, ආගමික ස්ථානවලින් හා නගරවාසීන් සඳහා වූ නිවාසවලින් සම්පූර්ණ කළ බවත්, නගරයේ නඩත්තුව උදෙසා වැඩපිළිවෙළක් ස්ථාපනය කරන ලද බවත් මහාවංශ ප්‍රවෘත්තියට අනුව පෙනේ. (මහාවංශය 10.75-105, වංසත්ථප්පකාසිනි: 220) එසේ වුව ද තමා උදෙසා මාලිගාවක් තැනවූ බවක් සඳහන් නොවීමෙන් පෙනෙන්නේ අනුරාධ මුත්තණුවන් විසූ මාලිගාවම ඔහු භාවිතයට ගත් බව විය හැකිය. මාලිගය පිහිටියේ අනුරාධපුරයෙහි කවර ස්ථානයක දැයි සඳහන් නොවේ.

පණ්ඩුකාභය රජුගේ නගර නිර්මාණය පිළිබඳ වංශානුගත විස්තරය ඇදහිය හැක්කක් ද යන්නත්, එය ඇදහිය හැකි නම් පණ්ඩුකාභය රජුගේ ගෘහෝද්‍යාන පිහිටා තිබුණේ කවර ස්ථානයක ද යන්නත් විමසා බැලීම වැදගත් වෙයි. පණ්ඩුකාභය රාජ්‍ය විචාළ කාලය පිළිබඳ ඇති අවිශ්වසනීයත්වය පිළිබඳ ගයිගර් දක්වන අදහස සමග එකඟ විය හැකි නමුදු, පණ්ඩුකාභය රජු විසින් කරන ලදැයි කියවෙන නගර නිර්මාණ ක්‍රියාදාමය හා එහි අංගෝපාංග පිළිබඳ වංශානුගත විස්තර එක හෙළා බැහැර කළ නොහැකි බවට සාධක සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරින් අනාවරණය කෙරෙයි. මීට රුකුල් දෙන එක් සාධකයක් නම් පණ්ඩුකාභය විසූ මාලිගය පිහිටියේ පසු කාලයේ ද ඇතුල් නගරය ලෙස යොදාගත් බිම්කඩෙහිම බව සිතීමට පෙලෙඹෙන හේතු වංශකතාවෙහි ගැබ්ව පැවතීමයි. ඉහත වරක් ද සඳහන් කළ පරිදි පණ්ඩුකාභයගේ නගර නිර්මාණ ක්‍රියාදාමය විස්තරාත්මක ලෙස වාර්තාගත කිරීමට වංශකතාකරු පෙලඹී තිබෙයි. පණ්ඩුකාභය විසින් අනුරාධපුර නගයෙහි ඉදි කළ නන් විධ නගරාංග භූ විද්‍යානුකූල වූ දිශානුගත පිළිවෙළකට වංශකතාවේ වාර්තාගත වී තිබීම කෙරෙහි අපගේ සුවිශේෂ අවධානය යොමු විය යුතු වෙයි.

මීළඟට සඳහන් වනුයේ දොරටුව ආසන්නයේ ම වූ ස්මාරකයක් සම්බන්ධයෙනි. යක්ෂ ගෝත්‍රයෙහි උපන්නා වූ පූර්වෝපකාරී දාසිය රජු විසින් නුවර දකුණු දිග දොරෙහි වාසය කරවන ලදී. 1960 වසරෙහි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කැණීම් මගින් නගරයේ දකුණු දොරටුවත්, දොරටුවෙන් ඇරඹී ඇතුල් නුවරට විහිදෙන මාර්ග යෙන් කොටසකුත් අනාවරණය කරගන්නා ලද බැවින් මෙම යක්ෂ දෙවොල පිහිටි ස්ථානය දළ වශයෙන් තේරුම්ගත හැකිය.

අභය වැවෙහි යට භාගයෙහි චිත්‍රරාජ යකු දේවාලය තැනූ බව සඳහන් වීමත්, අභය වැවෙහි යට භාගය මෙකල නුවරට දකුණින් පිහිටා තිබීමත් අනුව පණ්ඩුකාභය නගරය පිහිටියේ අනුරාධපුර අවධිය මුළුල්ලේ ඇතුල් නුවර නමින් හැඳින්වූ බිම්කඩ තුළ බව මේ අනුව සනාථ වෙයි.

තදනන්තරව විස්තර කෙරෙනුයේ නගරයෙන් බටහිර දොර දිශා භාගයෙහි වූ ස්මාරකයයි. එහි දොරගම් සතර, අබාවැව, මහසොහොන් භූමිය, දම්ගෙඩිය වඩස්ථානය, බටහිර රැජින (දේවාලය), වෙසමුණි (දෙවොල), වැදි දෙවියා තල් (දෙවොල), සභාග වස්තුව හා ප්‍රභේද ගෙය යන ස්මාරක පිහිටියේය. මෙම ස්මාරක සියල්ලම නොවුණත් ඉන් කිහිපයක් ඇතුල් නගරයට බටහිරින් පිහිටා තිබූ බවට සාධක ලැබෙයි. අබා වැවේ පිහිටීම ආසන්න වශයෙන් ඇතුල් නුවරට බටහිර දෙසින් වූ බව මෙහි මුලදී සාකච්ඡා කෙරිණි. ඇතුල් නුවරට බටහිරින් පිහිටි ස්මාරක අතුරින් හඳුනාගත හැකි අනෙක් ස්ථානය වනුයේ මහ සොහොන් භූමියයි. මෙම සොහොන් බිම ඇතුල් නුවරට බටහිරින් බසවක්කුලම (අභය වැව) වැව ඉහත්තාවේ පිහිටි බව දැක්වීමට තුඩු දෙන සාධක දෙකක් තිබේ. එකක් නම් පාංශුකූලික භික්ෂූන්ගේ ආවාස ලෙස සැලකෙන බටහිරාරාම නමින් හැඳින්වෙන පධානඝර ගොඩනැගිලි යථෝක්ත පෙදෙසේ පිහිටා තිබීමයි. පාංශුකූලික යන්නෙහි අරුත ඇහිඳගත් රෙදි වැරැලි මසා සිවුරු සාදා පොරවා ගත් යනාර්ථයයි. මේ අනුව පාංශුකූලික භික්ෂූන් සොහොනෙන් ලබාගත් රෙදි කඩවලින් මසාගත් සිවුරු පරිහරණය කළ බැව් සිතිය හැකි බැවින් ද, උන්වහන්සේලා ජීවිතයේ අනියත බව දැඩි සේ අවධාරණය කළ පිරිසක් වූ බැවින් ද මහ සොහොන් භූමිය ඇසුරෙහි වාසය පිණිස පධානඝර

උන්වහන්සේලා උදෙසා ගොඩනගන ලද බව සිතිය හැකි වෙයි.

මීළඟට විස්තර කෙරෙනුයේ සොහොනෙන් වයඹදිග පිහිටි ගම්මාන පිළිබඳවය. එම ගම්මානයන්හි වාසය කරවන ලද්දේ නගර ශෝධක සැඩොලුන්, වර්චස් ශෝධක සැඩොලුන් හා සොහොන් ගොව් සැඩොලුන්ය. මොවුන්ගේ සොහොන නීච සුසාන නම් වූ අතර එය පිහිටියේ සැඩොල් ගමට ඊසානදිගිනි. ඒ සොහොනින් උතුරු දිග වැද්දන්ගේ නිවාස පෙළ පිහිටියේය. (මහාවංශය 10.91-95). මෙම දිශානතීන් දැක්වීම ද නගරය වටා වූ තැන් දක්ෂිණාවෘත්තව විස්තර කිරීමේ පිළිවෙතින් වෙනස් නොවෙයි. වැද්දන්ගේ නිවාස පෙළට උතුරු දිගින් නොයෙක් තවුසන්ගේ අසපු කරවන ලද අතර, එම අසපු ගැමුණු වැව දක්වා විහිද තිබූ බව වංශකතාවට අනුව පෙනේ (මහාවංශය 10.95-96).

පණ්ඩුකාභය රජු විසින් ජෝතිය නිගණ්ඨයාගේ ආරාමය කරවන ලද්දේ එම සොහොනට පෙරදිග බැව් වංශ කතාවෙහි දැක්වෙයි (මහාවංශය 10.97-98). මෙහි කියවෙන සොහොන අනුක්‍රමික විස්තරයේ අවසනට සඳහන් කරන නීච සුසානය බවට සැකයක් නැත. එසේ නම් ජෝතිය නිගණ්ඨාරාමය පිහිටා තිබිය යුතු වනුයේ එම සොහොනට පෙරදිගිනි. නීච සුසානය හා සැඩොල් ගම් බුලංකුලම නමින් මෙකල ප්‍රකට වැව ඇසුරෙහි තිබිය යුතු බැව් මින් ඉහත සඳහන් කෙරිණි. එහෙයින් ජෝතිය නිගණ්ඨාරාමය සෙවිය යුතු වනුයේ බුලංකුලම වැවට නැගෙනහිර දෙස වූ යම් කිසි තැනකය.

ලංකාරාමය පිහිටුවන ලද්දේ මින් පසුව විස්තර වන ජෝතිය නිගණ්ඨාරාමය පිහිටි බිමේ බවට වූ සාධකය ද ඇත්පොකුණ යනු නීච සුසානය පිහිටියා වූ බිමේ පිහිටි මස්තොට පොකුණ නොවූ බවට ඉදිරිපත් කළ හැකි තර්කයකි. ඇත්පොකුණ පිහිටියේ ලංකාරාමයට ඉතා නුදුරින් ඊට බටහිරිනි. වළගම්බා රජු (කි.පූ. 103 හා ක්‍රි.පූ. 89-77) ජෝතිය නිගණ්ඨාරාමය තිබූ ස්ථානයම විය හැකි ජෝතිරාමය වටා කරවූ ආවාස දොළසකින් අභයගිරි විහාරය අරඹන ලද බවට මහාවංශ ටීකාවේ එන සඳහනට අනුව (වංසත්ථප්පකාසිනී: 497) ඇති පොකුණ ඇසුරෙහි වූයේ එකී ආවාස විය යුතු බව පෙනෙයි.

ගිරි නිගණ්ඨාරාමය පිහිටියේ ජෝතිය නිගණ්ඨාරාමය පිහිටි ප්‍රදේශයේ වූ බවට වංශ කතාවේ එන සඳහන ක්‍රිස්තු පූර්ව පළමු සියවස පමණෙහි වළගම්බා රජු දවස (ක්‍රි.පූ. 103 හා ක්‍රි.පූ. 89-77) පිළිබඳ වංශානුගත පුවතකින් ද සනාථ වෙයි. ඒ අනුව වළගම්බා රජු දෙවන වර රාජ්‍යත්වයට පත් වූ ක්‍රිස්තු පූර්ව 89-77 ත් අතර කාලයෙහි අභයගිරිය විහාරය කරවන ලද්දේ ගිරි නිගණ්ඨාරාමය මත එය බිඳ හෙළීමෙනි (මහාවංශය 33.81). වලගම්බා රජු ගිරි නිගණ්ඨාරාමය බිඳ හෙලා එහි පිරිවෙන් දොළසක් ඇති කළේය යන වංශානුග ප්‍රවෘත්තියෙහි අපගේ විෂයයට ගෝචර වන තවත් වැදගත්කමක් ඇත. එනම් පණ්ඩුකාභය රාජ්‍ය සමයෙහි එන නගරාංග පිළිබඳ විස්තරය මේ අනුව තවත් වරක් ඓතිහාසික සත්‍යයක් බවට පත්වන බැවිනි. ගිරි නිගණ්ඨාරාමය රජුන් විසි එක් දෙනෙකුගේ කාලයන්හි පැවති බවට එන සඳහන මෙම ප්‍රකාශයෙහි විශ්වසනීයත්වය තව තවත් තිර කරවයි (මහාවංශය 33.44). වංශකතාවේ එන රාජ නාමාවලිය අනුව වළගම්බා පටන් පණ්ඩුකාභය රජු දක්වා විචාල රජුන්ගේ සංඛ්‍යාව වළගම්බා රජු ද සමග විසි එකකි.

පණ්ඩුකාභය නගර නිර්මාණයට ඇතුළත් වූ ඉහත විස්තර කරන ලද අංග බෞද්ධාගමනයෙන් අනතුරුව ද පැවැති බවට වූ ඓතිහාසික සාධකත්, එකී නගරාංග ඇතුල් නගරය වටා ස්ථානගත කර තිබීමත් අනුව එළඹිය හැකි වැදගත් නිගමන දෙකක් වෙයි. එකක් නම් පණ්ඩුකාභය නගර නිර්මාණය පිළිබඳව වංශකතාවේ එන විස්තරය ඓතිහාසික සත්‍යයක් බවයි. අනෙක එකී නගරාංග ඇතුල් නගරය වටා ස්ථානගතව තිබීම මත පණ්ඩුකාභය මාලිගය හා ගෘහෝද්‍යානය පිහිටා තිබුණේ එකී නගරාංගවලට මැදිව පිහිටි ඇතුල් නගර බිම්කඩේ බවයි.

පණ්ඩුකාභය රාජ්‍ය සමය හා බැඳුණු ප්‍රාග් බෞද්ධ අනුරාධපුර ජනාවාසය ඇතුල් නගරයෙහි පිහිටි බවට ඉදිරිපත් කළ හැකි පුරාවිද්‍යාත්මක සාධක පසුපස දශක දෙක තුළ සිදු කළ පුරාවිද්‍යාත්මක කැණීම් තුළින් ද එළිපෙහෙළි විය. ක්‍රිස්තු පූර්ව 8 සියවස වන විට අනුරාධපුර ඇතුල් නුවර ජනාවාස වී තිබූ බවත්, එවකට එම ජනාවාසය පරිමාවෙන් හෙක්ටයාර් 10 ක් ද ඉක්ම වූ බවත් ආචාර්ය

දැරණියගල නිගමනය කරයි. (Deraniyagala 1992:709). මෙය විජයාවතරණය සිදු වී යැයි වංශ කතාව කියන කාලයට පෙර වකවානුවකි. මෙම පුරාවිද්‍යාත්මක අනාවරණයත් සමග අනුරාධපුරය මුල් වරට ජනාවාස කරගන්නා ලද්දේ විජයගේ ඇමැතියකු වූ අනුරාධ විසින් ක්‍රිස්තු පූර්ව 6 වන සියවසේ දී බවට වූ සාම්ප්‍රදායික විශ්වාසය බැහැර කිරීමට සිදු වෙයි. විජය සිට මුටසීව දක්වා රජුන්ගේ රාජ්‍ය කාලය අභව්‍ය ලෙස යොදා ඇති අයුරු ඉහත සාකච්ඡා කෙරිණි. තව ද විජයාවතරණය සිදු වූ බැව් කියවෙන ක්‍රිස්තුපූර්ව 6 වන සියවසට සහශ්‍රයකට පසුව මහාවංශය රචනා කරන ලද්දේ වුව ද මෙහි ලා අමතක නොකළ හැකි කරුණක් වෙයි. විශේෂයෙන්ම මුටසීවට පෙර යුගය පිළිබඳ වංශානුගත ප්‍රවෘත්තීන් ජනප්‍රවාද පදනම් කරගනිමින් රචනා කිරීමට සිදු වූ බවටත්, බෞද්ධාගමනයට ආසන්න කාලයේ රජුන් ලෙස සඳහන් වන මුටසීව හා පණ්ඩුකාභය පිළිබඳ ජනප්‍රවාද කාලීන ආසන්න භාවය හේතුවෙන් වඩා විශ්වසනීය මුහුණුවරක් ගන්නට ඇති බවටත් සැකයක් නැත.

ගයිගර් පෙන්වා දෙන පරිදි මෙම අවධියේ රජුන්ගේ රාජ්‍ය කාල දැක්වීමේ අභව්‍ය බව ම ජනප්‍රවාදයන්හි රාජ වර්ෂ පිළිබඳ මතකය ඇතුළත් නොවූ බවට කදිම නිදසුනක් වෙයි. විජයාවතරණය බුදුන් වහන්සේ පිරිනිවන් පෑ දිනයේ ම සිදු වූ බවට තාර්කික නොවුත්, අභව්‍ය වුත් පුවතක් ඇතුළු කිරීමෙන් තමාගේ අරමුණ වූ ලංකාව බුදුසමය සමග තිබූ පෞරාණික ප්‍රවේණී උරුමය කියාපෑමට මහාවංශය රචකයාට අවස්ථාව උදාවූයේ ප්‍රාග් බෞද්ධ කාලයේ රාජ්‍ය කාලයන් පිළිබඳ දැනගැනීමේ කිසියම් මගක් හෝ නොතිබීමත් ඒ හේතුවෙන් තමනට රිසි පරිදි රාජ්‍ය කාල හැසිරවීමේ හා ගෙනහැර දැක්වීමේ නිදහස වංශකතාකරුට හිමිවීමත් නිසා බැව් සිතිය හැකිය.

පණ්ඩුකාභය රජුගේ මාලිගය හා ගෘහ උද්‍යානය පිහිටි නගරය ඇතුල් නගර බිමේ පිහිටා තිබූ බව නිගමනය කිරීමට තුඩු දෙන තවත් ලිඛිත සාධකයක් පූජාවලියේ ගැබ්වෙයි. පූජාවලියට අනුව පණ්ඩුකාභය රජු ශ්‍රී මහා බෝධිය පිහිටි ස්ථානයට උතුරින් අයම් විතරින් සතර ගව්වක් වුත්, පරිධිය සොළොස් ගව්වක් වුත් බිම් පරිමාවක අනුරාධපුර නගරය දෙව් පුරයක් සේ තැනීය. මෙයින් පෙනෙන්නේ නගරය නිසැකවම ශ්‍රී මහා බෝධියට උතුරින් ඇතුල් නගරය පිහිටි දෙසට වන්නට පිහිටි බවයි (පූජාවලිය : 65-66).

පණ්ඩුකාභය රාජ්‍ය සමයට තරමක් පූර්ව කාලීන විය හැකි බැව් සිතිය හැකි ක්‍රිස්තු පූර්ව 700-600 වන විට අනුරාධපුර ජනාවාසය විශාලත්වයෙන් අවම වශයෙන් හෙක්ටයාර් 50 ක් පමණ දක්වා වැඩි වර්ධනයට තිබූ බැවින් මෙය නගරයක් ලෙස සැලකිය හැකි තත්ත්වයක් වන බව දැරණියගල නිගමනය කරයි (Deraniyagala 1992:709). 'ක්‍රිස්තු පූර්ව 700-600 හි අනුරාධපුර පූර්ව ඓතිහාසික ජනාවාසය අවම තරමින් හෙක්ටයාර් 50 කට වැඩි ප්‍රමාණයක් දක්වා ව්‍යාප්තව තිබුණේය. ඒ අනුව එය නගරයක් ලෙස නම් කළ හැකි තත්ත්වයකි. මෙම ජනාවාසයේ ප්‍රමාණය ක්‍රි.පූ. 9-8 සියවස් අතර කාලයේ වැඩි වර්ධනය වීම අප දක්නා වූ පරිදි දිවයිනේ ප්‍රධාන ජනාවාසය ලෙස මෙම ස්ථානය කරා බලය විමධ්‍යගත වීම පෙන්නුම් කරන්නක් බැව් පෙනෙයි (Deraniyagala 1992:709).

දීප වංශයේ සඳහන් වන පරිදි පණ්ඩුකාභය රජු අභාවප්‍රාප්ත වූයේ ඉන්දියාවේ චන්ද්‍රගුප්ත රජුගේ අභිෂේකයෙන් වසර 32 ක් ඉක්ම වූ කාලය (දීප වංශය 11.13). මේ චන්ද්‍රගුප්ත රජු නිසැකවම මෞර්ය වංශික චන්ද්‍රගුප්ත රජු විය යුතුය. ඒ අනුව චන්ද්‍රගුප්ත මෞර්ය වංශික රජු රාජ්‍යත්වයට පත් වූ ක්‍රි.පූ. 321 වර්ෂයෙන් වසර 32 ක් ඉක්ම ගිය පසු පණ්ඩුකාභය රජුගේ අභාවය සිදු වූ සේ ගත හැකි නම්, වසර 70 ක් රාජ්‍ය විචාළ බැව් කියවෙන පණ්ඩුකාභය බලයට පත් වූ වර්ෂය විය යුත්තේ ක්‍රිස්තු පූර්ව 359 වසරයි.

**ආචාර්ය සෙනරත් දිසානායක**

2006 ජාතික සාහිත්‍ය කලා මහෝත්සව සමරු කලාපයෙන් උපුටා ගැනිණ.

# නිවන් දකින තුරුම නැවත නැවතත් උපදින මිනිස් සිරුරේ යථාර්ථය



ඔබ නින්දෙන් අවදි වන්නේ ද, දවසේ වැඩ කටයුතුවල යෙදෙන්නේ ද, රාත්‍රී නින්දට යන්නේ ද, මම යනුවෙන් තනි පුද්ගලයකු ලෙස සලකාගෙන වුවත් ඇත්තට ම ඔබ එක් අයෙක් නොව කෑලි 6 ක පොකුරකි. (සලායතන විභාගය)

එනම්, ඇස, කන, දිව, නාසය, ශරීරය සහ මේවා ක්‍රියාත්මක කරවන සිතයි.

ඔබේ ශරීරය උපන් දා සිට මරණය දක්වා ම මොහොතක් පාසාම පරණ වෙයි. එසේම යම් දවසක මේ ශරීරය තව දුරටත් ඔබේ සිත ජීවත් කරවීමට බැරිතැනට දුර්වල වේ. එවිට මේ සිත ශරීරයෙන් ඉවත් වී යනු ඇත. මේ සිදුවීම මරණය ලෙස ව්‍යවහාර කරනු ලැබේ. උදාහරණයක් ලෙස ගුවන්විදුලි යන්ත්‍රයක 'බැටරිය' ඉවත් කළා සේ.

සිත නැති ශරීරයට පැවැත්මක් නැත. එය කාලයාගේ ඇවෑමෙන් මහ පොළොවට පස් වී යයි. සිත කොහි ගියේ ද?

දියුණු කර නොගත් ඔබේ සිතට නැවත ශරීරයක් නැතිව පවතින්නට බැරිය. පුද්ගලයාගේ පින් පව් කර්ම ශක්තියට අනුව මේ සිත නැවතත් ශරීරයක් සමග එකතු වේ. මෙසේ සිතෙහි පැවැත්ම අලුත්වීම පුනර්භවය හෙවත් නැවත උපතයි.

දැන් ඔබ කෑලි 6 ක පොකුරක් මිස 'මම' නම් වූ තනි පුද්ගලයකු නොවන බව දන්නා බැවින් ඔබ තුළ තනි පුද්ගල දෘෂ්ටිය හෙවත් සක්කාය දිට්ඨිය ඉවත්ව ගොස් ඇත. එනම් ඔබ පෘතග්ජන බවින් මිදී ආර්ය ශ්‍රාවකයකු බවට පත් වී ඇත. ඔබ දැන් සෝවාන් මාර්ගස්ථයෙකි.

මේ කරුණ මුලින්ම අවබෝධ කළේ බුදුරජාණන් වහන්සේ බව දැන් ඔබට වැටහිය යුතුය.

ඔබේ අතීත සසරේ සෑම උපතක් ම මම නමින් ජීවත් වූ ඇඟ හිත දෙකෙහි එකතුවක් බවත්, මේ ජීවිතයේ දී ද බුදු දහම අසන්නට නොලැබුණා නම් මම යනුවෙන් එක් පුද්ගලයෙකු ලෙසම මේ ජීවිතයත්

ගෙවා දමන්නට සිදුවන බවත් ඔබට වැටහෙනවා ඇත.

අපේ අතීත සසර ජීවිතය පටන් ගැනුමක් පෙන්විය නොහැකි දිග දම්වැලක් සේය. එම දිග දම්වැලට අලුතින් පුරුක් අමුණන්නා පරිදිය. එක් ජීවිතයක මරණයෙන් සමුගන්නා සත්වයකු නැවත උපතකින් ජීවිතයක් ලබනුයේ.

ඔබ ගත කරන මේ ජීවිතය එම දම්වැලෙහි අලුත්ම පුරුක යැයි ඔබට පිළිගත හැකිද ?

මේ සෑම ඉපදී මරණයට පත්වූ අතීත ජීවිතයකදීමත්, මේ ජීවිතයේ දී ඔබ අත්විඳින ලෙඩවීම, වයසට යාම, මරණයට පත් වීම අත්වින්දා නේද? එසේම තමන් අකැමැති අය සමග එක්වීමෙන්, කැමැති අයගෙන් වෙන්වීමෙන් බලාපොරොත්තු කඩා වැටීමෙන් ඇතිවන සිත් වේදනාත් අත්වින්දා නේද?

මේ අනුව දිගින් දිගට ම සසරේ ගමන් කිරීමට වීම දිගින් දිගට ම දුක් විඳීමක් මිස සැප විඳීමක් නොවන බව ඔබට දැන් තේරුම් යනවා ඇත. මේ අන් කිසිවක් නොව, බුදුරජාණන් වහන්සේ වදාළ 'දුක්ඛ ආර්ය සත්‍යයයි.'

ඔබ මේ ගත කරන ජීවිතයේ ඇසින් බලා, කනින් අසා, නාසයෙන් සුවඳ බලා, දිවෙන් රස බලා, ශරීරයෙන් පහස ලබා සතුටු වෙනවා නේද? ඔබ පමණක් නොව, මිහිමත සියලු සතුන් මේ සතුටට කැමැති බව ඒ ගැන සිතා බලන ඔබට වැටහෙනවා ඇත. මේ වින්දනයට ඇති කැමැත්තයි. කාමච්ඡන්දය, කාමරාගය කාම තණ්හා ලෙස ධර්මයේ විස්තර කොට ඇත්තේ.

නිතර මේ සැප විඳීමටත්, විඳින සැපයට වඩා වැඩි සැපක් ලබා ගැනීමටත්ය. කවුරුත් බලාපොරොත්තු වන්නේ. එහෙත් ඇසීමෙන්, දැකීමෙන්, විඳීමෙන් ලබන සැපය විඳින මොහොතට පමණි. සුළු මොහොතකින් නැති වී යයි. මේ බව තේරුම් ගන්නා නුවණැති පුද්ගලයා ජීවිත පැවැත්ම සඳහා පමණක් ඉන්ද්‍රිය මෙහෙයවයි. ඔහු වින්දනයට වහලෙකු බවට පත් නොවේ.

ඔබ දානාදී පින්කම් සිදු කොට සසර සැප බලාපොරොත්තු වෙයි. දෙවියන් අතර ඉපදීමට, වත්පොහොසත්කම්, සැප සම්පත් ඇති මිනිස් ජීවිත සසර උපදින ඉදිරි ආත්ම භවවල දී ලැබීමට ප්‍රාර්ථනා කරයි. ඔබ ගත කරන මේ ජීවිතයට වඩා සැපවත් ජීවිතයක් ලැබීමට ඒ පින්කම් ඔබට උපකාරී වුවත්, ඉපදුණු කෙනෙකු විදියට විඳිය යුතු වන වයසට යෑම, ලෙඩවීම, මරණයට පත්වීම, බලාපොරොත්තු කඩවීම්, ආදී අමිහිරි අත්දැකීම්වලින් මිදීමක් නොලැබෙන නිසා නැවත උපතක් පිළිබඳ ඔබේ මේ ප්‍රාර්ථනා නිවන් දැකීමට බාධාවකි. භව තණ්හා ලෙස ධර්මයෙහි මෙය හඳුන්වා ඇත. එබැවින් මේ ජීවිතයේ දීම සසර ගමන නවතාලීමට හැකිනම් ඔබ ඊට සතුටු විය යුතුය.

ඔබ එසේ කල්පනා කිරීමෙන් නැවත නැවත උපතට ඇති කැමැත්ත හෙවත් භව තණ්හාව දුරුකර ගත හැකි නේද?

මෙකල බොහෝ දෙනෙක් නැවත නැවත ඉපදීම ගෙන දෙන සසර ගමනක් ඇතැයි පිළිනොගෙන වර්තමාන ජීවිතයේ සැපවත් බව පමණක් විඳීමට යොමු වේ. පව් පින් විශ්වාස නොකරයි. සතුන් මරයි. සොරකම් කරයි. වැරැදි කම්සැප සොයයි. බොරු කේලාම් කියයි. වෙරිමතින් මත්ව පහත් සතුටත් ලබයි.

මේ ජීවිතයේ දි අඬදබර, කල කෝලාහල, පවුල් අවුල් ඇති කරගෙන, සසර බය නැතිව, ජීවත් වීමට යොමුවන මොවුන් බුදු දහමට අනුව මරණයෙන් පසු තිරිසන් ජීවිත, ප්‍රේත ජීවිත ලබති. නැවත මිනිස් ජීවිතයක් නම් ලබා ගැනීමට කලකට බැරිය. එබැවින් පවට බය නැති, අතීත අනාගත සසර පැවැත්මක් විශ්වාස නොකරන වර්තමාන ජීවිතය පමණක් පිළිගෙන කටයුතු කරන්නාට නිවන් අවබෝධ කළ නොහැකිය. විභව තණ්හාව ලෙස ධර්මයෙහි විස්තර වන්නේ මේ ආකාරයේ වැරැදි දැකීමෙන් යුතුව ජීවත් වීමයි. ඔබත් එවැනි හැසිරීම් අදහස් ඇති අයෙකු දැයි ඔබම සිතා බලන්න. තෙරුවන් සරණ ගොස් පන්සිල් පද රැකීමට සැලකිලිමත් වීම ඔබේ වර්තමාන ජීවිතය වඩාත් සාර්ථකව ගත කිරීමටත් මේ ගෞතම බුදු සසුනේදීම නිවන් දැකීමටත් හේතුවන බව දැන් ඔබට වැටහිය යුතුය.

බුදුරදුන් පෙන්වා දුන් 'නිවන' පියවර හතරකි.

## 1. සෝවාන් ඵලය

සෑම පුද්ගලයෙකුම එක් අයෙක් ලෙස 'මම යනුවෙන් ක්‍රියාත්මක වන බව තමා තුළින් දැක තමන් ඇතුළු සියලු සත්ත්වයා සිත හා ඇඟ දෙකෙහි ක්‍රියාකාරිත්වයක් මිස සත්ත්වයෙක් පුද්ගලයෙක් නැති බව වටහාගෙන බුද්ධාදී අට තැන්හි සැක දුරු කොට බෞද්ධ ප්‍රතිපදාව පිළිගැනීම සෝවාන් ඵලයයි.

මේ දැනීම ඇතිව ජීවත්වන්නකුට නැවත උපරිම සසර ගමන හත් වතාවකි. අටවැනි ජීවිතයක් නැත.

## 2. සකෘදාගාමී ඵලය

තමන්ගේ ජීවිත පහසුව වෙනුවෙන් තවත් අයකුට හානි පැමිණවීමේ අදහස පටිඝයයි. කරුණාව හා මෛත්‍රිය තම සිතෙහි වඩවා ගැනීමෙන් මිනිස් තිරිසන් කිසිදු සත්ත්වයෙකුගේ ජීවත් වීමට, ජීවන කටයුතුවලට බාධා නොකරන සිතක් තමා තුළ ඇති කරගත් තැනැත්තා සකෘදාගාමී ඵල ලාභියායි.

පටිඝය දුරු කරගත් ඔහු සසර ගමන උපරිම තුන් වතාවකට සීමා කරගත්තෙකි කාම ලෝකයෙහි උපදින්නේ එක් වතාවකි.

## 3. අනාගාමී ඵලය

පටිඝයට අමතරව ඉන්ද්‍රිය තෘප්තිය ඇති කැමැත්ත හෙවත් කාමච්ඡන්දය දුරින් දුරු කළ සිතක් ඇති කරගත් තැනැත්තා අනාගාමී ඵලයෙහි පිහිටියෙකි. මොහු ඉන්ද්‍රිය මෙහෙයවනුයේ ජීවත්වීම සඳහා පමණි.

නැවත එක් උපතක් පමණක් මොහු අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, අකනිට්ඨක යන පංච සුද්ධාවාසවලින් එකක ඉපිද එහිදී රහත් ඵලයෙන් නිවන් දකී.

## 4. රහතන් වහන්සේ

තණ්හාව ඉතිරි නැතිව අත්හළ චතුරාර්ය සත්‍යය අවබෝධ කළ, නිවන සඳහා වූ සියලු කටයුතු අවසන් කළ, නැවත උපතක් බලාපොරොත්තු නොවන උත්තමයා රහතන් වහන්සේයි. පින් පව් රැස්වීමක් උන්වහන්සේට නැත. මේ ජීවිතයේ පිරිනිවන් පෑමත් සමග විඤ්ඤාණය නිරුද්ධ වේ.

## නිවනට මාර්ගය නම් මෙයයි.

**1. සම්මා දිට්ඨි** - නිවැරැදි වැටහීමට පැමිණීම සම්මා දිට්ඨි නමින් හැඳින්වීමෙන්, මම ආයතන සයක ක්‍රියාකාරිත්වයක්ය. තවත් අතකින් ස්කන්ධ පහක ක්‍රියාකාරිත්වයක්ය. තනි පුද්ගලයකු ලෙස මම පෙනී සිටීම හැඟීමක් පමණක් බව, මේ බැව් සිහියට ගෙන දිග සසරක ගමන් කරන්නෙක් බව පිළිගෙන, සසර ගමන සෝවාන් ආදි මාර්ග ඵල පිළිවෙළින් චතුරාර්ය සත්‍ය අවබෝධයෙන් නිවන් දැකිය යුතු බව පිළිගැනීම සම්මා දිට්ඨියයි.

සෝවාන් ඵලයෙහි පිහිටීමත් දෙකක් නොව එකක් ම බව ඔබට වැටහෙනවා ඇත.

**2. සම්මා සංකප්ප** - නෙක්ඛම්ම, අව්‍යාපාද, අවිහිංසා යනුවෙන් පිළිවෙළින් ඉන්ද්‍රිය දමනය, මෛත්‍රිය හා කරුණාව ප්‍රගුණ කිරීමෙන් කාම රාග හා පටිඝය දුරු කිරීම පිණිස එනම් ආසාව සහ තරහ දුරු කිරීම පිණිස ඔබේ සිත මෙහෙයවීමට කැමැත්ත ඇති කරගැනීමයි.

**3. සම්මා වාචා** - බොරු කේලාම්, ඵරුස වචන, කතා කිරීමෙන් වෙන්වී ඇත්ත කීම, අනුන් සමගි කරවීම, ප්‍රිය වචනයෙන් කතා කිරීම සහ දියුණුවක් අභිවෘද්ධියක් ගෙන දෙන කතාවක්ම ප්‍රකාශ කිරීමට ඔබ යොමුවීම මෙයින් අපේක්ෂා කරයි.

**4. සම්මා කම්මන්ත** - ප්‍රාණඝාතයෙන්, සොරකමින් වෙන්වීමත්, කම්සැප සෙවීමේදී තම ස්වාමි පුරුෂයා හා බිරිඳ ඉක්මවා නොයාම ඔබෙන් අපේක්ෂා කරයි.

**5. සම්මා ආජීව** - ඔබේ ජීවනෝපාය හෙවත් ආදායම් මාර්ගය ධාර්මික විය යුතුය. නිවැරැදිව කිරීම, මැනීම කළ යුතුය. විෂ සහිත දේ නොවිකිණිය යුතුය. ජීවිත හානිය පිණිස ආයුධ නොවිකිණිය යුතුය. මේ කරුණුවලින් වැළකිය යුතුය. අවංකයෙන්ම තමන් තමන් ගැන සිතා සතුටු විය හැකි සිතක් හදා නොගත් කිසිවෙකුට නිවන් සැප අත්දැකිය නොහැකිය. ඔබේ ජීවනෝපාය ධාර්මික දැයි ඔබවම තීරණය කරන්න.

**6. සම්මා වායාම** - මමත් සසරින් එතෙර විය යුතු යැයි ඉලක්කයක සිත පිහිටුවා ගැනීමෙන් අනතුරුව මෙතෙක් ඔබ පුරුදු පුහුණු කළ ගුණධර්ම, සංවරශීලී හැසිරීම් රටාව තව දුරටත් වැඩිදියුණු කිරීමටත්, අලුතින් ගුණධර්ම තමා තුළ ඇති කර ගැනීමටත් වෙහෙසිය යුතුය.



එසේම මෙතෙක් ගත කළ ජීවිතයේ වැරැදි පුරුදු, ඇබ්බැහිවීම්, නොමග යෑම් ඇත්නම් ඒවා දුරුකර ගැනීමටත් ඉදිරියේදී එවැනි යොමුවීමකට කිසිසේත් යොමු නොවීමටත් වග බලාගත යුතු බව මෙහිදී ඔබ සිතින් අපේක්ෂා කරන බව වැටහිය යුතුය.

**7. සම්මා සති** - ශරීරයේ ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වය සිදුවන ආකාරයත්, මොහොතක් පාසාම වෙනස්වන, පරණ වන, ස්වභාවයෙන් යුක්ත බවත්, තද ගතිය, තෙත් ගති, උණුසුම් සහ වායු යන සතර මහා ධාතුන්ගෙන් සකස් වී ඇති එකක් බවත් නුවණින් දැක, ශරීරයෙන් ගනු ලබන පෙනීම, ඇසීම, ගඳ සුවඳ දැනීම, රස විඳීම තුළින් අප විසින් විටෙක සතුටුදායක වින්දනයක් ද, විටෙක කනගාටුදායක වින්දනයක් ද, විටෙක මධ්‍යස්ථ වින්දනයක් ද වශයෙන් අත්දකින දැනීම් පිළිබඳව සිතින් විමසා බැලීමටත් සැපයට කැමැත්තත්, දුකට අකැමැත්තත් වශයෙන් සිත ක්‍රියාත්මක වන බවත් නුවණින් විමසා තමා තුළින් තේරුම් ගත යුතු බව ඔබට වැටහිය යුතුය.

**8. සම්මා සමාධි** - සිතින් විමසා බලා සිතෙහි ක්‍රියාකාරිත්වය නුවණින් දැක ඇලීම්, ගැටීම්වලින් තොරව සිත ඒකඟත්වයකට පත්කර ගැනීම සම්මා සමාධිය බව ඔබට වැටහෙනවා ඇත. දැකීම, දැකීම් මාත්‍රයක් පමණක් ලෙසත්, ඇසීම, ඇසීම් මාත්‍රයක් පමණක් ලෙසත්, රස සුවඳ පහස විඳීම් මාත්‍රයක් පමණක් ලෙසත් සලකා මේ ජීවිතය අවසන් වන තෙක් පමණක් දිවි ගෙවන දුක් සැප දෙකින්ම නිදහස් වූ භික්ෂුව රහතන් වහන්සේ බව දැන් ඔබට වැටහෙනවා ඇත.

## සසර පැවැත්මක සංයුතිය

බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ නුවණින් දැන ලෝකයාට දේශනා කළ, සත්ත්වයා තම සසර ගමනේ පින් පව්, කුසල් අකුසල් කර්ම ශක්තියට අනුව උපත ලබන සත්ත්ව ජීවිත මට්ටම්ය.

සිත දියුණු කළ අය රූප ලෝකයෙහි උපදී. පින්සිදු කොට සිත සතුටු කළ අය කාම ලෝකයට අයත් දිව්‍ය ලෝක හයෙහි සහ මනුෂ්‍ය ලෝකයෙහි උපදී.

පන්සිල් කඩමින්, පව්කම් අපරාධ සිදු කරමින් මේ ජීවිතය ගත කරන අය මරණයෙන් පසු මෙහි පහතින්ම ඇති සතර අපායන්හි ඉපදී අප්‍රමාණ

දුක් විඳිති. ඔබ ලබා ඇති මේ මනුෂ්‍ය ජීවිතය බුදු, පසේබුදු, මහ රහතන් වහන්සේලා සසර දුක් කෙළවර කොට නිවන් දුටු, සෝවාන් ආදී මාර්ග ඵල ලැබිය හැකි වටිනාම ආත්මභාවය බව ඇත්තදැයි ඔබම සිතා බලන්න.

නේවසඤ්ඤා නාසඤ්ඤායතන
ආකිංචඤ්ඤායතන — අරූප ලෝකය
විඤ්ඤාණංචායතන
ආකාසානංචායතන

අකනිට්ඨක
සුදස්සී — පංච සුද්ධාවාස
සුදස්ස
අතප්ප
අවිහ

අසඤ්ඤසත්තය
වේහප්ඵල — පංචම ධ්‍යාන ලැබුවෝ

සුභ කින්හක
අප්පමාන ශුභ — චතුර්ථ ධ්‍යාන භූමි
පරිත්ත ශුභ

අභස්සර
අප්පමානභ — ද්වීතීය තතීය ධ්‍යාන භූමි
පරිත්තාභ
මහා බ්‍රහ්ම — පඨම ධ්‍යානය

පරනිම්මිත වසවත්ති දෙව්ලොව
නිර්මාණ රතී දෙව්ලොව
තුසිත දෙව්ලොව — දිව්‍ය ලෝක 6
යාම දෙව්ලොව
තාවතිංස දෙව්ලොව
චාතුර් මහාරාජික දෙව්ලොව

මනුෂ්‍ය භවය — කාම ලෝකය
අසුර නිකාය
ප්‍රේත ලෝකය — අපාය 4
තිරිසන් අපාය
නරකය

සිතන්න.

ඔබ තනි පුද්ගලයකු නොව, කොටස් එකතුවක ක්‍රියාකාරිත්වයකි. ශක්ති ප්‍රවාහයකි. මෙතෙක් කල් ඔබේ සිතේ ජීවත් වූ මම නමින් පෙනී සිටි තනි පුද්ගල හැඟීම ඉවත් වූ නිසා ඔබ තුළ සක්කාය දිට්ඨිය ඉවත්ව ගොස් ඇත.

බුදුරජාණන් වහන්සේ විසින් මේ බව මුලින්ම දැන වදාළ බවත්, උන්වහන්ස් වැඩ සිටිය අයකු බවත් ඔබට පැහැදිලි වී ඇත.

වෙනත් අයකු විසින් නොදැනගත් දහමක් තමන් විසින් දැනගෙන එම දහම අන් අයට ද දැනගැනීම පිණිස දෙසූ බව ඔබට පිළිගත හැකිය.

එදත් අදත් හෙටත් ඒ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේලා සෝවාන් ආදී මාර්ගඵලවලට පත්වෙති.

නිවන් දැකීමට බලාපොරොත්තු වන්නකු ලෙස ඔබ තුළ සීල සංවරය ඇති කරගත යුතුය. සිල්පද අවශ්‍ය වන්නේ ඒ සඳහා මිස ඔබ අපහසුතාවට පත් කිරීමට නොවේ.


ඔබට ප්‍රමාණ කළ නොහැකි සසර (අතීත) ජීවිතයක් ඇත. සසර නමැති දම්වැලෙහි අලුත්ම පුරුක මේ ගෙවන ජීවිතය විය හැකිය.

නිවන් දක්නා තුරුම නැවත නැවතත් උපදින්නට සිදු වේ. අතීත සසර මෙන්ම අනාගත සසර යන දෙක ම පිළිබඳ දැන් ඔබට සැක නැත. චතුරාර්ය සත්‍යය අවබෝධ නොවීමෙන් පින් පව් රැස් කිරීමත්, ඒනිසා නැවත නැවතත් කම්සැපට ඇති කැමැත්ත අත්හරින තෙක්ම සසර පවත්නා බව හෙවත් පටිච්ච සමුප්පාදය නිවැරැදි බව ඔබට වැටහේ.

ඔබට සම්මා සම්බුදු සරණයි!

**ශාස්ත්‍රපති පූජ්‍ය දුනුකේවෙල ධම්මවීර හිමියන්ගේ දේශනයක් ඇසුරින් සකස් කළේ,**

**ඉන්දික ලියන්දෙනිය**



# සාරිපුත්‍ර ස්ථවිර මාතෘ ප්‍රේත වස්තුව

අප ගෞතම සම්මා සම්බුද්ධ රාජෝත්තමයාණන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු මහා උපාසකතුමා ගොඩ නඟා දුන් මහා විහාරස්ථානයේ වැඩ වසන සමයේ ඉහත සඳහන් ප්‍රේතවස්තු ධර්ම දේශනාව භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා කියන සිව්වනක් පිරිස වෙනුවෙන් මේ ධර්ම දේශනාව වදාළ සේක.

ඒ කෙසේද යත් එක් දවසක් ආයුස්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ද, මහා මුගලන් ස්ථවිරයන් වහන්සේ ද අනුරුද්ධ මහා ස්ථවිරයන් වහන්සේ ද, කප්පිත මහා රහතන් වහන්සේ ද රජ ගහ නුවරට නුදුරු එක්තරා වනයක වෙසෙත්. ඒ අවට වෙසෙන මහා දානපති බමුණෙකුට මේ ගැන දැන ගන්නට ලැබී වහා එතැනට පැමිණ උන්වහන්සේලාට වැඳ

නමස්කාර කොට පහසුවෙන් වැඩ සිටීම සඳහා වෙන වෙනම සියලු සැප පහසුකම් සහිත කුටි හතරක් තනා පූජාකොට මෙසේ ප්‍රකාශ කළේය. මගේ ජීවිතයට මෙවැනි පින්කමක් යළිත් උදා නොවන බව පවසා ඔබ වහන්සේලාට සිව්පසයෙන් සංග්‍රහ කිරීමට මම පොරොන්දු වෙමිය පවසා එය ඉටු කරයි.

මේ බමුණාගේ බිරිඳ සිය විවාහයෙන් කලකිරී සිටින්නේ මෙසේ සිතයි. මම විවාහ වුණේ හැමදාම මේ බමුණාගේ කුස්සියට වැදී බත් උයන්නද? දරුණු කලකිරීමකි. මෙසේ කාලය ගෙවී යන්නේ එක් දවසක් බමුණාට ඈත ගමක රාජකාරියක් සඳහා යන්නට සිදු වී තම ස්වාමි දියණියට මෙසේ කියයි. මම හෙට නිවසින් බැහැර යමි. එබැවින් මේ දාන ශාලා තුනේ වැඩටික සේවකයන් හරියට කරනවා දැයි සෝදිසියෙන් ඉන්න. මේ දාන ශාලා එකක් බුදු හිමියන් ප්‍රමුඛ මහා සංඝරත්නයට, දෙවැන්න හතරවටින් පැමිණෙන දිළිඳු මිනිසුන්ට, තෙවැන්න සතා සිවුපාවුන්ට.

බිරිඳ බලා සිටි අවස්ථාව ලැබීම ගැන සතුටට පත්ව දන්සලේ තිබුණ මෝල් ගහක් ගෙන ප්‍රථමයෙන් හිමිදිරියේ වඩින සංඝයා ළඟට ගොස් තොපි මගේ අසූචි කාපියව් මගේ ලේ බීපියව් යන පරුෂ බසින් බැණ උන්වහන්සේලා එළවා දමා මුළු දන්සල මෝල් ගසින් ගසා සුනු විසුනු කළාහ. ඊළඟට ඉතිරි දන්සැල් දෙකට ගිය ඇය ඔවුන් සියල්ල පන්නා දමා ඒවාද කඩා කුඩු පට්ටම් කළාය. ටික කලෙකින් ඇය මැරී ගොස් කරපු බරපතල කර්මය නිසා දුක් පිපාසික ප්‍රේතියක්ව නිරයේ උපන්නීය.

එහෙත්, මැය සංසාරයේ බොහෝ පින් කළ තැනැත්තියක් වූ නිසා ප්‍රේතියක් වුවත් ඇයට පුබ්බේ නිවාසානුස්සති නුවණ හා ඍද්ධිවිද නුවණ පහළ විය. මේ නුවණ මෙහෙයවා පෙර විසූ කඳ පිළිවළ බලන්නී මෙතැන් සිට ආත්ම පහක් උඩදී සැරියුත් මහ රහතන් වහන්සේගේ මව වී සිටිය බව පෙනී ගියේය. ඒ අවස්ථාවේදීම ජේතවනාරාමයට ගොස් මෙතන යම් දෙවි දේවතා කොටසක් වේ නම් මේ දොරවල් ඇරේවායි පැතීය. ඒ පැතුම ඉටු වී ටික දුරක් යන විට සැරියුත් හිමියෝ භාවනාවේ යෙදී සිටිනු දැක උන්වහන්සේ ඉදිරියේ මැය පෙනී සිටියාය. ඒ හිමියන්ට මැය දැක කරුණා පහළ වී මෙසේ ප්‍රකාශ කළහ.

ඇගේ කිසිම වස්ත්‍රයක් නැතිව නහර වැල් එතුණ ඇට සැකිල්ලකින් යුතුව පළාතම ගඳ ගස්වමින් ඉන්නා තා කවරෙක්දැයි විචාළහ. මම කෑමට යමක් සොයමින් ජීවත් වෙමි. මම ආහාරයට ගන්නේ සෙම්, සොටු, කෙළ, ලේ වැදූ මවු වරුන්ගේ ගැබ් මල, මළමිනීයෙන් පිටවන සාරය වන දෑය.

හොඳයි ඔබට මෙම ආත්මයෙන් ගැලවෙන්නට මා කළයුතු දේ කුමක්ද? මම දැන් පරදත්තූපජීවී කොට්ඨාසයට පැමිණ ඇති බැවින් ඔබ වහන්සේ පිඬු සිඟා වැඩ ඒ ගෙනා දානය මහා සඟනට වළඳවා ඇගේ නම සඳහන් කර පින් දුන් විට ඇය එය අනුමෝදන්ව ප්‍රේත ආත්මයෙන් මිදී තව්තිසා දිව්‍ය ලෝකයේ උපන්නාය.

**පූජ්‍ය මිල්ලෑවේ උපසේන හිමි**



# මතක භක්ත ජාතකය

තව ද එක් සමයක්හි බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් මතක භක්තකයක් අරභයා මේ ජාතකය වදාළ සේක. එකල්හි මනුෂ්‍යයෝ එළුවන් ආදී වූ බොහෝ සත්වයන් මරා කාලක්‍රියා කළා වූ තමන්ගේ නෑයන් උදෙසා මතක භක්ත නම් වූ පරිත්‍යාගයක් කෙරෙති. භික්ෂූහු ඒ මනුෂ්‍යයන් මෙපරිද්දෙන් කරන්නාවුන් දැක සර්වඥයන් වහන්සේ අතින් “ස්වාමීනි දැන් මනුෂ්‍යයෝ බොහෝ ප්‍රාණීන් ජීවිතක්ෂයට පමුණුවා මතක භක්ත නම් වූ දෙයක් දෙති. ස්වාමීනි මෙහි වැඩක් ඇත්දැයි” විචාළ සේක. සර්වඥයන් වහන්සේ ‘මහණෙනි, මතක භක්ත දෙම්හයි කියා කරන ලද ප්‍රාණඝාතයෙහි කිසිත් වැඩෙක් නම් නැත. පෙරත් නුවණැත්තෝ ආකාශයෙහි හිඳ ධර්ම දේශනා කොට මේ මතක භක්තයෙහි ආදීනව කියා සියලු ජම්බුදීපවාසී සත්ත්වයන් මේ ක්‍රියාවෙන් ඇරවූහ. දැන් වනාහි භවසංක්ෂේප හෙයින් නැවත පහළ වී යයි’ වදාරා අතීත කතාව ගෙන හැර දැක් වූ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍ය කරන සමයෙහි වේදත්‍රයාගේ පාරප්‍රාප්ත වූ දිසා ප්‍රධාන වූ එක් ආචාර්ය බ්‍රාහ්මණයෙක් මතක භක්තයත් දෙමැයි එළුවකු අල්වාගෙන තමාගේ අතවැසියන්ට “සගයෙනි, මේ එළුවා ගඟට ගෙන ගොස් නාවා කර මල් වඩම් බැඳ පසඟුල් දී සරසා ගෙනෙව”යි විධාන කළේය. ඒ මනුෂ්‍යයෝ ද ‘යහපතැ’යි බමුණාට ප්‍රතිඥා දී එළුවා ඇරගෙන ගඟට ගොස් නාවා කී සැටියේ සරසා ගංතෙර සිටවූහ. ඒ එළු තමා පූර්වයෙහි කරන ලද අකුශල කර්මය ජාති ස්මර ඥානයෙන් දැක මෙබඳු වූ දුක්ඛයෙන් අද දවස් මිදෙමියි සොම්නසට පැමිණියේ කළයක් බිඳින කලක් පරිද්දෙන් මහත් කොට සිනා සී නැවත මේ බමුණා මා මරා මා විසින් මෙතෙක් කල් මුළුල්ලේහි විඳි දුක් ලබන්නේ යැයි බමුණා කෙරෙහි කරුණා උපදවා මහත් වූ ශබ්දයෙන් හැඬුවේය. ඉකිබිත්තෙන් ඒ තරුණ පුරුෂයෝ ඔහු අතින් ‘සබඳ එළුවාණෙනි, තොපි මහත් කොට සිනාසී ඇඬුවාහු වුව. කවර කාරණයකින් ඇඬුවාහුදැයි’ විචාළාහුය. තෙපි ඇම මේ කාරණය තොපගේ ආචාරීන් සමීපයේදී මා අතින් විචාරවයි කීවේය.

මනුෂ්‍යයෝ ඒ එළුවා ඇරගෙන ගොස් මේ කාරණය ආචාර්ය බ්‍රාහ්මණයාට කීහ. ඒ ආචාර්යා ද මනුෂ්‍යයන් කී බස් අසා එළුවා අතින් “එළුවාණෙනි, තෙපි කවර කාරණයකින් සිනාසුණද? කවර කාරණයකින් හැඬුදැයි විචාළෙයි. ඒ එළුවා ද

තමා පූර්වයෙහි කළ අකුශල කර්මය ජාති ස්මර ඥානයෙන් සිහි කොට බමුණාට කීය.

"බ්‍රාහ්මණයාණෙනි, මම පූර්වයෙහි තොප සේම වේත්‍රය හදාළා වූ බමුණුව ඉපිද මතක භක්තයක් දෙමියි එළුවකු මරා දිනිමි. හේ මම ඒ එළුවා මැරූ අකුශල කර්මයෙන් එකකින් අනූ පන්සියයක් ජාතියෙහි ඉස්කැපීම් දුක්ඛයට පැමිණියෙමි. මේ තෙම මට කෝටිප්‍රාප්ත වූ පිරුණු පන්සියයක් ජාති ඇති ආත්ම භාවයයි. හේ මම අද දවස් මෙබඳු වූ දුක්ඛයෙන් මිදෙමියි සොම්නසට පැමිණියෙමි. මේ ජාති පන්සියයක් මුළුල්ලෙහි ඉස්කැපීම් දුක්ඛයට පැමිණ අද ඒ දුක්ඛයෙන් මිදෙමි. මේ බමුණා ද මා මරා මා සේම පන්සියයක් ජාතියෙහි ඉස් කැපීම් දුක්ඛය ලබන්නේ යැයි තොප කෙරෙහි කරුණාවෙන් ඇඬීමියි" කීය. "එළුවාණෙනි, නොබව මම තොප නොමරමියි" කීය. "බමුණාණෙනි. කුමක් කියව්ද තොප නොමැරුවත් මා විසින් අද මරණින් මිදෙන්නට නොපිළිවනැයි" කීය. "එළුවාණෙනි, තොප නොබව මම තොපව රැකවල් ගෙන තොප හා සමඟ ඇවිදිමියි කීය. "බමුණාණෙනි, තොපගේ ආරක්ෂාව ඉතා ස්වල්පය. මා විසින් කරන ලද අකුශල කර්මය මහත් බලවතැයි කීය. බමුණාණෝ එළුවාණන් මුදා මේ එළුවා කවර කෙනෙකුන් විසිනුත් මැරිය නොදෙම්හයි කියා තමාගේ අතවැස්සන් ඇරගෙන ගොස් බමුණාණෝ එළුවාණන් හා එක්වම ඇවිදිනාහ.


එළුවා බැම්මෙන් හරන ලද්දේ එක් ගලතලයක් පිට අට ගත් තණ කැලයක්හි කර ඔසවා කොළ කන්ට යැයි පටන් ගත්තේය. එකෙණෙහි ම ගලතල පිට සෙනක් ගැසීය. ඉන් ගල් ලෑල්ලක් ඉපිරගෙන ගොස් එළුවා දික් කළා වූ ග්‍රීවයෙහි හී හිස කැපුණේය. ඉකිබිත්තේ මහජනයා ද එතැනට රැස්වූහ. එකල්හි මහා බෝධිසත්වයෝ ඒ ස්ථානයෙහි වෘක්ෂ දේවතාව උපන්හ. ඒ බෝධිසත්වයෝ ද මහා ජනයා බල බලා සිටියදීම දේවතානුභාවයෙන් නිරාලම්භ වූ ආකාශයෙහි ඌරුබද්ධාසනයෙන් උපලක්ෂිතව හිඳ "මේ සත්වයෝ මෙපරිද්දෙන් අකුශලයෙහි විපාක දැක ප්‍රාණඝාත නොකළෝ නම් යෙහෙකැයි මියුරු වූ කටහඬින් යුක්තව ධර්ම දේශනා කරන්නාහු මෙසේ කියති "ඒ භවයෙහි සත්වයාගේ උප්පත්තියත් ජරා, ව්‍යාධි, මරණ පැමිණීමත් දුක්වන්නේ යයි මෙසේ ලෝකයෙහි සත්වයෝ දන්නාහු වී නම් සත්වයෙක් සත්වයෙකු නොමරන්නේය. ප්‍රාණඝාත කළා වූ පුද්ගලයා වනාහි අටමහ නරකයෙහි සොළොස් ඔසුපත් නරකයෙහිත්, අනේක ප්‍රාකාර වූ තිරිසන් යෝනියෙහිත් ප්‍රේතලායෙහිත් ඉපිද මහ දක් අනුභව කෙරෙමින් බොහෝ කලක් සෝක කරන්නේය. මෝහයෙන් මුඪ වූ සත්වයෝ අවිජ්ජාවෙන් අන්ධ ව මේ ආදීනව නොදැක ප්‍රාණඝාත කරන්නාහු යැයි" මෙසේ මහ බෝසතාණෝ නරක භයින් තැති ගන්වා ධර්ම දේශනා කළෝය. මනුෂ්‍යයෝ ධර්ම දේශනාව අසා නරක භයින් භය පත්ව ප්‍රාණ ඝාතයෙන් වැළැක්කාහුය. බෝධිසත්වයෝ ධර්මදේශනා කොට මහජනයා ශීලයෙහි පිහිටුවා කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය. මහජනයාත් බෝධිසත්වයන්ගේ අවවාදයෙහි පිහිටා දානාදී වූ පින්කම් කොට දිව්‍ය ලෝකයෙහි උපන්නාහුය. ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ මතක භක්ත ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි වෘක්ෂදේවතාව ඉපද ධර්ම දේශනා කළෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැයි" තමන් වහන්සේ දක්වා වදාළ සේක.

අවවාදය : දැන දැන කිසිම සත්වයෙක් ප්‍රාණයෙන් තොර නොකරන්න. එසේ කළහොත් එය ආත්ම ගණනක් පසු පසින් පැමිණ දුක් විපාක ලබා දෙන්නේය.

**පූජ්‍ය මකුල්දල උපරතන හිමි**

බෞද්ධාලෝකය



# වෙසක් පහන් කූඩුවේ ඉතිහාසය, විකාශනය, පැවැතීම සොයා යෑම

සෑම වසරකම අපගේ ශාන්තිනායක අමාමෑණී බුදුරජාණන් වහන්සේ විසින් දේශිත ශ්‍රී සද්ධර්මයේ සඳහන් ආමිස, ප්‍රතිපත්ති පූජා ආදියෙන් උන්වහන්සේට පූජා පවත්වමින් වෙසක් මංගල්‍යය පවත්වමු.

මෙහිදී දාන, ශීල, භාවනා ආදී කටයුතුවලට ප්‍රමුඛස්ථානයක් ලබා දෙයි. වෙසක් දින සිට සතියක පමණ රාත්‍රි කාලයක් විවිධ ජාතක කතා සහිත වෙසක් තොරණ, වෙසක් පහන් කූඩු රාශියක් මග දෙපස ප්‍රදර්ශනය කෙරේ මෙම කාර්යය සිංහල බෞද්ධයා විසින් අනාදිමත් කාලයක සිට නොකඩවා රැකගෙන ආ බව නොදන්නවා නොවේ. නමුත්, වර්තමානයේ දී මෙම කටයුත්ත හුදෙක් වාණිජකරණය වීම හරහා වෙසක් උත්සවය කිසියම් ආකාරයකට විකාර ස්වරූපී ස්වභාවයක් ගෙන ඇත.

වෙසක් පහන් කූඩුව සෑම නිවසකම පුරාතනයේ පටන් සාදා එල්ලා තැබීමේ සිරිතක් පැවැතුනි, එසේ කළ නොහැකි වූ ගැමි නිවසක අඩුම තරමින් මැටි පහනක් හෝ දැල්වීම සිදුවිය. මෙහි දී බහුලව භාවිත

කළ අටපට්ටම් කූඩුව දේශීය කලාකරුවාගේ මහඟු නිර්මාණයකි. මෙම පහන් කූඩුවේ උඩ සහ යට ත්‍රිකෝණ හැඩැති පට්ටම් අටකි. එයින් කලාකරුවා නිරූපණය කිරීමට උත්සාහ දැරූයේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරන සත්ත්වයාගේ අවසාන නැවතුම වන්නේ නිවන් මාර්ග යයි. “අටපට්ටම් කූඩුව” සෑදීමේ දී පහන් කූඩුවේ ගැට ගසන සෑම මුල්ලකටම බට කෝටු හතරත් (04) ක් එකතු වේ. එය චතුරාර්ය සත්‍යයයි. එනම් දුක, දුකට හේතුව, දුක නැති කිරීම, දුක නැති කිරීමේ මාර්ග යයි. මෙම අර්ථයෙන් ම අටපට්ටම් පහන් කූඩුව හෙළ කලාකරුවා විසින් නිර්මාණය කරනු ලැබුවේ එය දකින වාරයක් වාරයක් පාසා මෙම සසරින් එතෙරවීමේ සංඥාවක් එමගින් ලැබෙන නිසාය.

අටපට්ටම් පහන් කූඩුව සිංහල කලාකරුවාට ආවේණික නිර්මාණයකි. වෙනත් විදේශ රටක දී අටපට්ටම් කූඩුව දකින්නට ලැබේ නම් එය පිටුපස අනිවාර්යයෙන් සිංහල බෞද්ධයෙකු සිටිය යුතුමය. අටපට්ටම් කූඩුව ජාතික පුෂ්පය වූ, නිල් මහනෙල් මල සේම ශ්‍රී ලංකාවට ආවේණික වූ දෙයක් වන්නේ මේ නිසාය. මෙම නිර්මාණයේ ඇති ගැඹුරු ගම්භීර වූ තේරුම අප පාසල් දූ දරුවන්ට නැවත කියා දීමේ කාලය පැමිණ තිබේ. මෙම අගනා නිර්මාණයට ජාතික වැදගත්කමක් ලබා දීමේ කාලය ද පැමිණ තිබේ. එය මෙවර (UN-Wesak) එක්සත් ජාතීන්ගේ වෙසක් දිනයේ දී මුළු මහත් ලෝකයටම වැදගත් වන්නා වූ පණිවිඩයක් වශයෙන් ලබා දීමේ වැදගත්කම මෙලෙස පෙන්වා දෙමු. එම නිසා සෑම බෞද්ධයෙකුගේම නිවසේ අටපට්ටම් පහන් කූඩුවක් දැල්වීමට මෙවර වෙසක් උත්සවයේ දී කළ හැකි නම් එය වටිනා කාර්යයකි.

මෙතෙක් අටපට්ටම් පහන් කූඩුව පිළිබඳ ගැඹුරින් විමර්ශනය කළ අප වෙසක් පහන් කූඩුවේ ඉතිහාසය පිළිබඳව ආපසු හැරී බලමු. මුලින්ම වෙසක් උත්සවය - උත්සවශ්‍රීයෙන් සමරනු ලැබුවේ දුටුගැමුණු රජතුමන් විසින් බව ඉතිහාසය කියවන අපට දක්නට ලැබේ. එම කාලයේ මැටි පහන් දැල්වීම සිදු කර ඇත. එම පහන් හිස මට්ටමින් රැඳවීම සඳහා ආධාරක මත සවිකළ බවට සාධක පවතී. පහන වටා කූඩුවක් නිර්මාණය වන්නට ඇත. නමුත්, පහන් කූඩුවක් සම්පූර්ණ වශයෙන් නිර්මාණය වූ සාක්ෂියක් අපට තිබේ. ඒ දුටුගැමුණු රජතුමා අවසන් හුස්ම හෙළූ අවස්ථාවයි. එතුමා ඉදිකිරීම ආරම්භ කළ රුවන්වැලි මහ සෑයේ අත්තිවාරම නමවරක් පොළොවේ ගිලී ගිය බව අපි අසා ඇත්තෙමු.

රන්වන් පැහැති වැල්ලක් සහිත භූමියක එය ඉදිකළ බවට පවතින මතය අනුව එය එසේ වූවා විය හැකිය. මෙම චෛත්‍යය ඉදි කිරීමේ දී එහි ශක්තිමත් භාවයෙන් ගොඩ නැගූ නිසා එය ඉදිකර ගැනීමට දුටුගැමුණු රජතුමාට එතුමාගේ රාජ්‍ය අවසානය දක්වාම නොහැකි විය. අවසානයේ ධාතුගර්භයෙන් ඉහළට සතරැස් කොටුව දක්වා නිමකළ කොටසට ඉහළින් ඇති සියලුම කොටස් ඉතිහාසයේ සඳහන් අන්දමට වේවැල්, උණබට ආදිය යොදා සැකිල්ලක් ලෙස සැදීමටත්, එය සේද සළු යොදා ආවරණය කිරීමටත් අභ්‍යන්තරයේ පහන් දල්වා ආලෝකවත් කිරීමටත් සද්ධාතිස්ස කුමාරයාට සිදු විය.

මෙම ක්‍රියාදාමය අපට නූතන වෙසක් පහන් කූඩුවේ උප්පත්තිය ලෙස පිළිගැනීමට සිදු වේ. මෙය තැනට සුදුසු නුවණ අනුව සිදු වූවකි. එදා හෙළ කලාකරුවාගේ අති සියුම් නිර්මාණකරණයට පින් සිදුවන්නට දුටුගැමුණු රජතුමාට සැනසිලි සිතින් අවසන් හුස්ම හෙළීමට හැකි විය.

එදා සිට අද දක්වා ගොක් කොළ, නාවා පට්ට ආදිය යොදාගෙන සාදන ලද අටපට්ටම, නෙළුම් මල අදවන විට යන්ත්‍රානුසාරයෙන් භ්‍රමණය වන පරිවාර කූඩු සහිත පහන්කූඩුවක් බවට පත් වී ඇත. මෙම පහන් කූඩු නිර්මාණය සඳහා දේශීය අමුද්‍රව්‍ය මෙන්ම විදේශීය අමුද්‍රව්‍ය වන තෙල් කඩදාසි, සව්කඩදාසි ආදිය යොදාගත් අතර, “ප්‍රීති වෙසක්” පාඨය රැගත් බකට් පහන් දක්වා වූ සැරසිලිත් අටපට්ටම් කූඩුත් අද වෙසක් උත්සවය සඳහා පැමිණ තිබේ. මීට වසර සියයකට පමණ පෙර වෙසක් උත්සවය සැමරූ ආකාරය පැරැණි පුවත්පත් ආදියෙන් සොයා බලන විට අදට වඩා විශාල ආධ්‍යාත්මික ගුණයක් තිබී ඇති බව හෙළි වී තිබේ. එම නිසා එම ගුණ ධර්මවලින් පෝෂණය වූ සැබෑ අරුත් බර පහන් කූඩුව නැවත කලඑළි කිරීම අප සෑම දෙනාගේම වගකීම වන්නේය.

**ඉන්දික රුවන් හේවගේ**
**සාම විනිසුරු**
**(බෞද්ධාලෝක වෙසක් පහන් කූඩු නිර්මාණ ශිල්පී)**



# වෙසක් පෝය දින සිදුවූ ත්‍රිවිධ මංගල්‍ය

සියලුම බෝධිසත්වයන් වහන්සේලා මනුෂ්‍යයෝය. මනුෂ්‍යයකුට මිස වෙනත් සත්වයකුට බුදුබව ලබා ගැනීමට නොහැකිය. බෝධිසත්වවරුන් උපත ලබන්නේ දඹදිව මධ්‍ය මණ්ඩලයේය. අප මහබෝධිසත්වයන් උපන්නේත් මධ්‍ය මණ්ඩලයේය. ඈත අතීතේ දඹදිව රාජ්‍ය කළ වෙස්සන්තර රජතුමා මිය පරලොව ගොස් තුසිත දෙව්ලොව සන්තුසිත නමැති දෙවියෙක්ව උපන්හ.

## දේවාරාධනාව

බුදුබව පතාගෙන තුසිත දෙව්ලොව ඉපදී සිටි සන්තුසිත හෙවත් ශ්වේතකේතු දෙවියන්ට මනුෂ්‍ය ලෝකෙ උපත ලබන්න අවුරුදු දාහක් තිබියදී බ්‍රහ්මයෝ හා දෙවිවරු බුදුවන බෝධිසත්වයන් සිටින්නේ කෙබඳු තැනකදැයි සොයා බැලූහ. තුසිත දෙව්ලොව ඉපිද සිටින බව දුටුවහ. ඒ දෙවිවරු බෝසත් දෙවියන් වෙත පැමිණ නිදුකාණනි, මිනිස් ලොව මවකගේ කුසෙහි පිළිසිඳ ගන්නැයි මෙසේ ආරාධනා කළහ.

“මහා වීරයන් වහන්ස, දෙව්වරුන් සහිත ලෝක වාසීන්ට අමෘතපදය (නිවන) අවබෝධ කිරීමට ඔබ තුමාට මේ සුදුසු කාලයයි.”

දේවාරාධනාව පිළිගත් සන්තුසිත බෝධිසත්ත්වයෝ තමාට මනුලොව උපදින්න සුදුසු කාලයයි සිතා පස්මහ බැලුම් බැලූහ. ඒවානම් කාලය, දීපය, දේශය, කුලය, මව යන කරුණු පහ ගැන බලා බෝසත්වරු මවුවරුන්ගේ කුස තුළ පිළිසිඳ ගනිති.

## කාලය

මනුෂ්‍ය ලෝකේ මනුෂ්‍යයකුගේ ආයු කාලය අවුරුදු ලක්ෂයකට වඩා වැඩි නම් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිවිධ ලක්ෂණ ගැන දැන ගැන්න අපහසු නිසා එකල බෝසත්වරු ලොව පහළ නොවෙති. පරමායුෂ අවුරුදු සීයකට අඩු කාලවල මනුෂ්‍යයින් තුළ රාග, ද්වේෂ, මෝහ, යන අකුසල මූල (කෙලෙස්) බහුල (වැඩි) නිසා එකල බෝසත්වරු බුදුරජාණන් වහන්සේලා ලොව පහළ නොවෙති.

ක්‍රි.පූ. 6 වැනි සියවසේ මනුෂ්‍යයින්ගේ ආයුෂ අවුරුදු 120 පමණ වූ නිසාත් අවුරුදු 100 ට අඩු නොවූ නිසාත් ඒ කාලය තුළ ලොව පහළ වීමට සුදුසු කාලය යැයි බෝසත් දෙවියෝ සිතූහ.

## දීපය

දඹදිව මධ්‍ය මණ්ඩලයේ උපදින්න බෝසත් දෙවියෝ සිතූහ.

## දේශය

දඹදිව කිඹුල්වත් නුවර ඉපදීමට සුදුසු දේශය සිතූහ.

### කුලය

එකල දඹදිව උසස්ම කුලය ක්ෂත්‍රිය කුලය ලෙස පිළිගැනිණ. ඒ කුලයේ උපදින්න හිතාගත්හ.

### මව

ගුණවත්, නොකැලැල් චරිතයක් ඇති සිල්වත් මහාමායා දේවියගේ කුස තුළ පිළිසිඳ ගැනීමට බෝසත් දෙවියෝ සිතා ගත්හ.

### ඇසළ උත්සවය

එකල දඹදිව ඇසළ උත්සවයක් පැවැත්විණ. ඒ උත්සවයට සියලුම අය සහභාගි වූහ. මහාමායා දේවිය උදේ රැයින් අවදිවී ජලස්නානය කර ඒ උත්සවයට සහභාගී නොවී උයනට ගොස් සිල් සමාදන්වී අසිත තාපසයාගෙන් බණ අසා භවනා කළාය. අනතුරුව මාළිගයට පැමිණ මෛත්‍රී භාවනාව කරමින් සිට රෑ වූ පසු යහනට ගොස් නින්ද යන තුරු තමා විසින් කරන ලද කුසල් ගැන මෙනෙහි කරමින් සිටින විට රාත්‍රී පශ්චිම යාමයෙහි සිහිනයක් දුටුවාය.

ඒ හීනය,

හතරවරම් දෙවිවරු සෘද්ධියෙන් මාලිගයට ඇවිත් දේවිය නිදාගෙන සිටි යහන ඔසොවාගෙන ගොස් හිමාල වනයේ රත්ගල්තලාවක් අසල සල්ග හක් මුල තැබූහ. අනතුරුව දෙවඟනෝ ඇවිත් දේවිය අනෝතප්ත විලට එක්කර ගෙන ගොස් ජල ස්ථානය කරන්න සලස්වා දිවසළු අන්දවා ඒ අසල රිදී පර්වතයක රන් මාළිගාවකට එක්කරගෙන ගියහ. දෙවඟනෝ එහි යහනක දේවිය නිදිකරවූහ. ඒ අතර සුදු ඇත් පැටවෙක් සුදු නෙළුම් මලක් හොඬෙන් ගෙන දේවිය සැතපෙන යහනාව වටේ තුන් විටක් පැදකුණු කර දේවියගේ කුසතුළට ඇතුළු විය. ඇය හීනෙන් දුටුවේ බෝසතාණන් දෙව්ලොවින් චුතව තම කුස තුළ පිළිසිඳ ගැනීමයි.

(බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහනායක ස්වාමීන් වහන්සේගේ ගෞතම බුද්ධ චරිතය ඇසුරෙන්)

පසුදින උදේ දේවිය ශුද්ධෝදන රජතුමාට තමා දුටු හීනය ගැන කීවාය. රජතුමා වේදාංග ගැන දන්න බ්‍රාහ්මණයින් අට දෙනෙකු මාළිගයට ගෙන්වා ඔවුන්ට දේවිය විසින් දුටු හීනය ගැන කීහ. රජතුමනි, ඔබතුමාගේ දේවිය විසින් දකින ලද හීන නපුරු, නරක එකක් නොවේ යයි ඔවුහු කීහ. රජතුමනි, දේවියගේ කුසේ පින්වත් කුමරෙක් පිළිසිඳගෙන සිටියි. එකුමරු බිහිවූ පසු තරුණ වයසෙදී චක්‍රවර්ති රජවෙයි. නැත්නම් බුදුවන්නේ යයි කීහ. කුමරු මවගේ කුස තුළ දේවාරක්ෂාව ඇතිව වැඩුණේය.

කුමරුන් ලැබෙන්න ආසන්න වූ විට දරු ප්‍රසූතිය සඳහා තම මවුපියන් වෙත යන්න ඕනෑයි මහාමායා දේවිය ශුද්ධෝදන රජතුමාට කීවාය. දෙව්දහ නුවර සුප්පබුද්ධ රජුට ඒ පුවත ශුද්ධෝදන රජතුමා පණිවුඩ කරුවකු මගින් දැන්වූහ. මහාමායා දේවිය ගමට යන්න සූදානම් වී රජතුමාට එය කීවාය. රජතුමා දේවිය දෝලාවක නන්වා පරිවාර ස්ත්‍රීන් හා ඇමතිවරුන් සමග දෙව්දහ නුවරට යැවූහ. ඒ අය කිඹුල්වත් නුවරින් පිටත් වී රෝහිණී නදිය තරණය කර ලුම්බිනී සල්උයන අසලට ගියහ. දෙව්දහනුවර සිට ඥාතීහු ඇතුළු පිරිස දේවිය පිළිගැනීමට එහි පැමිණියහ. මහාමායා දේවිය උයන්සිරි නැරඹීමට එහි ගියාය. එහිමුල සිට අතුවල මල් පිපී තිබුණු සල්ගසක් දැක එහි බිමට නැමී තිබුණ අත්තක් අල්ලා ගත්තාය. ඒ අවස්ථාවේ ඇයට විළිරුදාව ඇතිවිය. එය දැනගත් ඥාති ස්ත්‍රීහු ඒ ගස වටේට තිරයක් ඇද ආවරණය කළහ. ටික වේලාවකින් දේවිය පුතෙකු ප්‍රසූත කළාය. සහම්පති මහා බ්‍රහ්මයා කුමරුන් රන් දැලකින් පිළිගත්තේය. බ්‍රහ්මයා අතින් බිමට බැස්ස කුඩා කුමරු පියුම් 7 ක් පිටින් පියවර 7 ක් ගමන් කර,

"අග්ගෝ හමස්මි ලෝකස්ස
ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස
සෙට්ඨෝ හමස්මි ලෝකස්ස
අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්බවෝ"

මම ලෝකවාසීන්ට අග්‍රයා වෙමි, මම ලෝකවාසීන්ට (ගේ) ප්‍රධානියා වෙමි. මම ලෝකයාට ශ්‍රේෂ්ඨයා වෙමි. මේ මගේ අන්තිම ආත්මයයි. (ඉපදීමයි) මින් පසු නැවත ඉපදීමක් නැතැ"යි කියා උදන් ඇනූහ.

කුමරුන් උපන් දිනම යශෝධරා දේවිය, කාළුදායි, ඡන්න, ඇතු, අශ්වයා උපන්නේය.

(ගෞතම බුද්ධ චරිතයේ 261 වැනි පිටුව ඇසුරින්)

කුමරුට නමක් තැබීම සඳහා ශුද්ධෝදන රජතුමා නැකැත් ශාස්ත්‍රය දන්න බ්‍රාහ්මණයින් මාළිග

යට ගෙන්වා සංග්‍රහ කර පුතාට නමක් තබන්නැයි ඔවුන්ට කීහ. ඒ අය කුමරුගේ අංගලක්ෂණ බලා "මේ කුමරු ගිහිගෙයි සිටියොත් චක්‍රවර්ති රජවෙයි නැතිනම් ගිහිගෙයින් නික්ම ගොස් පැවිදි වී බුදුවන්නේයැයි බ්‍රාහ්මණයින් තිදෙනෙක් කීහ. මේ කුමරුන් නික්මගොස් පැවිදී වී ඒකාන්තයෙන්ම බුදුවන්නේ යයි පස් දෙනෙක් කීහ. ඔවහු කුමරුට සිද්ධාර්ථ කියා නම තැබූහ.

### මහමායා දේවියගේ අභාවය

කුමරුන් ඉපදී දින හතකින් මහාමායා දේවිය මිය පරලොව ගොස් මාතෘදිව්‍යපුත්‍රයෙක්ව තුසිත දෙව්ලොව උපන්නාය.

ශුද්ධෝදන රජතුමා කුමරුට කිරී පෙවීමට කිරිමවුවරුන් පත්කළහ. ටික දිනකින් මහා ප්‍රජාපති ගෝතමීය පුතෙකු ප්‍රසූත කළාය. ඒ කුමරුට නන්ද කියා නමක් මවුපියවරු තැබූහ. මහාප්‍රජාපති ගෝතමිය තම පුතුට කිරි දීම කිරිමවුවරුන්ට භාරදී, තමාගේ කිරි සිදුහත් කුමරුට පොවමින් පෝෂණය කළාය.

### සරණ මංගල්‍යය

කුමරුන් ශිල්ප ශාස්ත්‍ර ගෙන ගෙන ශිල්ප දැක්වූ පසු පියරජතුමා ඔහුට විවාහයක් කරගන්නැයි කීහ. පියරජතුමනි, මා කුමරියක් සරණගන්නේ නම් ඇය ලජ්ජා බිය ඇති, සාර ධර්ම, චරියාධර්මවලින් යුත්, තම ස්වාමියාට මවකමෙන් සලකන කම්මැළි නැත්තියක් විය යුතුයයි කුමරු කීහ.

කුමරු දැක්වූ ශිල්ප දැක සතුටට පත් ව සිටි සුප්පබුද්ධ රජ තම දුව සිදුහත් කුමරු සරණකර දීමට කැමැති විය.

ටික දිනකින් ඒ දෙදෙනාගේ සරණ මංගල්‍යය සිදු විය. ඒ දෙදෙනා ඉතාමත් සතුටින් කල් ගත කළහ. සිදුහත් කුමරුට අවුරුදු 28 ක් වනතුරුත් ඔහුට දාව යශෝදරා දේවිය දරුවකු ප්‍රසූත නොකළාය.

දිනක් ඒකාකාරි දිවිපෙවෙතින් වෙන්ව සිටීමට සිතූ කුමරු විවේක ගැනීමට උයනට යන්න උවමනා බව පිය රජතුමාට කීය. ලබන බක්මස පුර අටවක පෝය දින සිදුහත් කුමරුන් උයනට යන බව නුවර වැසියන්ට දැන් වූ ශුද්ධෝදන රජතුමා ඔවුන්ට මග හා මග දෙපස ශුද්ධ පවිත්‍ර කරන්නැයි නියම කළහ. ඔවුහු රජු කී අයුරින් කටයුතු කළහ. මහල්ලෙකු, ලෙඩෙකු, මැරුණු අයකු, පැවිද්දෙකු (සන්නාසියකු) කුමරු ට දකින්න නොසලස්වන්නැයි රාජපුරුෂයින්ට රජතුමා නියම කළේය.

රජතුමා කුමරුට උයනට යන්නට අවසර දුන්නේය. කුමරු අස්රියක නැගී ඡන්න හා පිරිවර සමග උයනට යන විට හැරමිටි වාරුවෙන් ගමන් කරන මහල්ලෙකු දුටුවේය. "ඡන්න අර කවරෙක් ද? කුමරුනි ඒ මහල්ලෙකි. ඡන්න අපටත් එවැනි තත්වයක් උදාවෙයිද? ස්වාමීනි අපත් එවැනි තත්වයට පත්වන්නේයි ඔහු කීය. එසේ නම් උයනට ගොස් විනෝදවීමෙන් වැඩක් නැතැයි කී කුමරු පිරිවර සමග ආපසු මාළිගයට ගියේය.

නැවත වෙසක් පෝය දින උයනට යන විට ලෙඩෙකුත්, පොසොන් පෝය දින මළමිනියකුත් දුටු කුමරු පෙරසේම සසර කලකිරී ඡන්න හා පිරිවර සමග ආපසු මාළිගයට ගියේය. ඇසළ පෝය දින කුමරු ඡන්න හා පිරිවර සමග උයනට යන විට පැවිද්දෙකු (සන්නාසියෙකු) දකින්න ලැබී ඡන්න අර කවරෙක්ද? කුමරුනි, ඒ සසර කලකිරී සසර දුකින් මිදීමට ගිහිගෙයින් නික්ම කැලයට ගොස් භාවනා කරන තවුසෙකැයි ඡන්න කීය. කුමරු පැවිදිවෙන්න හිතාගෙන උයනට ගොස් එහි සිරි නරඹමින් සිටියේය. මාළිගයේ සිට පැමිණි පණිවිඩ කරුවෙක් දේවිය පුතකු ප්‍රසූත කළායයි කුමරුට කීය. එය ඇසූ කුමරු "රාහුලෝ ජාතෝ බන්ධනං ජාතෝ" රාහුලයෙක් උපන්නේය, බැඳීමක් ඇතිවූයේය"කීය.

සවස ඉන් නික්ම ඡන්න ඇතුළු පිරිස සමග කුමරු මාළිගයට ගියේය. සිදුහත් කුමරු යහනට වී ජාති, ජරා, මරණ, සෝක, පරිදේව ආදාය ගැන සිතමින් සිටියේය. සිදුහත් කුමරුන් ගිහිගෙයින් නික්ම යෑම ගැන බුදුරජාණන් වහන්සේ අරියපරියේසන සූත්‍රයෙන් මෙසේ දේශනා කළහ. මම ජාති, ජරා, මරණාදිය ගැන සිතුවෙමි. ඒවා සුන්කර (නැතිකර) නිවන ලබාගැනීමට ඇත්නම් හොඳයයි සිතුවෙමි. එසේ සිතූ මම "මහණෙනි, මම පසුකාලෙ තරුණයෙක්ව කළු කෙස් ඇති ප්‍රථම වයසෙදිම ගිහිගෙය හැර යන්න හිතා ගන්නෙමි. මම ඒ බව පියාට, සුළු මවට, යශෝදරාවට කිව්වෙමි. ඒ අය එයට අකැමැතිව කඳුළු පිරි දෙනෙතින් යුතුව අඬමින් සිටියහ. මම අසුපිට නැගී චන්න සමග නේරංජන ගඟින් එගොඩ වී එහි සුදුවැලි කලාවත ඉඳගෙන කෙස්, රැවුල් කපා කහපාට රෙදි ඇඳ පොරවාගෙන සෘෂි ප්‍රව්‍රජාවෙන් පැවිදිවුණෙමි.

මහණෙනි, මම නිවන සොයාගෙන යන අතර ආලාරකාලාම තවුසා වෙත ගියෙමි. ඔහු දැන ගෙන සිටි ධර්මය මට කියා දුන්නේය. ඉන් සසර විමුක්තිය ලබා ගත නොහැකි නිසා ඉන් නික්ම උද්දකරාමපුත්‍ර වෙත ගියෙමි. ඒ තවුසා දත් ධර්මය මට කියා දුන්නේය. ඉන් සසර විමුක්තිය ලබාගත නොහැකි නිසා මම ඉන් නික්ම නේරංජන අසල ඇති සේනානි ගමට ගියෙමි. ඒ අසල ඇති කැලයේ සිරුරට දැඩි දුක් වේදනා දෙමින් අවුරුදු 6 ක් දුෂ්කර ක්‍රියා කළෙමි. පවත්තඵල භෝගීව ජීවත් වුනෙමි."

මේ අයුරින් ශරීරයට දැඩි දුක් දෙමින් බෝධිසත්වයෝ සාවුරුද්දක් දුෂ්කර ක්‍රියා කළත් සම්බෝධිය (නිවන) ලබා ගැනීමට නොහැකි වූ නිසා ආහාර අනුභව කරන්න පටන් ගත්හ. ඉන් පසු සිරුර හොඳින් වැඩී ලක්ෂණ විය.

වෙසක් පෝය දින භාවනා කරමින් සිටි බෝධිසත්වයෝ රාත්‍රී නිදාගත්හ. පසු දින අවදි වී මුවකට සෝදාගෙන ඇසටු ගස මුලට ගියහ. එහිදී සුජාතා සිටු දුව උන්වහන්සේට කිරිබත් තලියක් පිළිගැන්වූවාය. එය ගත් බෝධිසත්ත්වයන් වහන්සේ නේරංජන ගඟ ළඟට ගොස් ඒ කිරිබත් අනුභව කර "මා බුදුවන්නේනම් මේ තලිය උඩුගම් බලා පා වේවා යි හිතාගෙන එය දිය මත තැබූහ. තලිය උඩුගම් බලා පාවී ගොස් ගඟ මැද දී ගිලිණි.

ගෞතම බුද්ධ චරිතය ඇසුරින්

බෝධි සත්ත්වයෝ නේරංජන නදිය අසලින් නික්ම යන විට කුසතණ ගෙනයමින් සිටි සොත්ථිය බමුණා එතුමාට කුසතණ අට මිටක් දුන්නේය. ඒවා අරගෙන ඇසටු ගස මුලට ගොස් ඒවා බිම අතුරා ඒ මත ඉඳගෙන "මම බුදුවී මිස මෙතනින් නැගිටින්නේ නැතැයි" හිතාගෙන බෝධිසත්වයෝ ඇසටු ගසට පිට තියා ගෙන වජ්‍රාසනයේ වැඩ සිටියහ. ඒ අවස්ථාවේ වසවර්ති මාරයා දසබිම්බරක් මාර සේනාව සමග අවිගෙන බෝසතාණන් වෙත යෑමට බෝ මැඩට ඇතුළුවීමට නොහැකිව පිටත සිටයේය. ඔහුගේ පැමිණීම බෝධිසත්වයෝ ගණන් නොගත්හ. මාරයා බෝධිසත්වයන්ට ගර්හා කර නව විධ වර්ෂාවක් වැස්සවීය. ඉන් කම්පා නොවූ බෝධිසත්වයෝ "මාරය, මා දානාදි පාරමිතා පිරූකෙනෙකැයි කියා මහපොළවට අත දික් කළහ. එවිට එය බියකරු හඬක් නගමින් කම්පා විය. ඒ හඬ අසා බිය වූ මාරයා සේනාව සමග පලා ගියේය. මාර පරාජය කළ බෝධිසත්වයෝ භාවනා කර පසුදින අලුයම ආශ්‍රව ක්ෂයකර ලොව්තුරා බුද්ධත්වයට පත් වූහ.

## බුද්ධ පරිනිර්වාණය

බුදුරජාණන් වහන්සේ වයස 80 දී ආයු සංස්කාරය හැර විශාලා මහනුවර කූටාගාර ශාලාවට වැඩ එහි වැඩ සිටියහ. බුද්ධ නියමයෙන් එහි උපස්ථාන ශාලාවේ රැස්ව සිටි භික්ෂූන් වහන්සේලාට

"මහණෙනි, මම ඔබ වහන්සේලාට කරුණක් කියමි. සියලු සංස්කාර නැසෙනසුලුය. එළඹුණු සිහියෙන් යුතුව ගුණ ධර්ම වඩව්. ළඟදීම තථාගතයන් වහන්සේ පිරිනිවන් පාන්නාහයි" දේශනා කළහ.

ඉන් නික්ම බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා සමග පාවා නුවරට වැඩියහ. එහි චුන්දකර්මාර පුත්‍රගේ අඹ උයනේ වැඩ සිටියහ. ඔහු එහි ගොස් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා සමග වඩින්නැයි බුදුරජාණන් වහන්සේට ආරාධනා කර ගියේය. පසුදින බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා සමග ඔහුගේ නිවසට වැඩ පනවන ලද ආසනවල වැඩ සිටියහ. කර්මාර පුත්‍ර ඇතුළු පිරිස උන්වහන්සේලාට දන් පිළිගැන්වූහ. දන් වැළඳූ බුදුරජාණන් වහන්සේ ඒ පිරිසට භුක්තානුමෝදනාව කර විහාරයට වැඩියහ.

උන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේ හා භික්ෂූන් වහන්ස්ලා සමග කුසිනාරානුවර මල්ලරජදරුවන්ගේ උපවර්තන නම් සල් උයනට වැඩ එහි සල්ගස් දෙකක් අතර පනවා තිබුණ ආසනයක සැතපුණහ. "ආනන්ද, ආමිස පූජාවෙන් පමණක් බුදුරජාණන් වහන්සේට කරන පූජා නිසි ගරු බුහුමන් නොවේ. සිව්වනක් පිරිස ධර්මානුකූලව ජීවත්වන්නේ නම් ඒ අය විසින් නිසි අයුරින් තථාගතයන් වහන්සේට පූජා පවත්වන අයවලුන් බව දේශනා කළහ.

බුදුරජාණන් පිරිනිවන් පෑ පසු උන්වහන්සේගේ ශ්‍රී දේහයට කෙසේ පිළිපැදිය යුතුදැයි ආනන්ද හාමුදුරුවෝ ඇසූහ. චක්‍රවර්ති රජ කෙනෙක්ගේ දේහයට පිළිපැදිය යුතු අයුරින් යයි දේශනා කළහ.

බුදුරජාණන් වහන්සේ තමා එදින රාත්‍රී පිරිනිවන් පාන බව ආනන්ද ස්වාමීන් වහන්සේට දේශනා කළහ. උන්වහන්සේ ආනන්ද හිමියන් අමතා තමාගෙන් පසු ධර්ම, විනය දෙක ගුරුවරයා වශයෙන් සලකන්නැයි (තබාගන්නැයි) කීහ. බුදුරජාණන් වහන්සේ එදින රාත්‍රියේ අලුයම නිරුපදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑ සේක.

**ඇන්.ඇල්. මාතෘදාස ලියනගේ**

ශාසන දීපන, ශාස්ත්‍රවේදී, සාම විනිසුරු



# වෙසක්

වැදුමව කරහොවා තරණය කර සයුර
බුදුබව මව් මුවින් පැතු සවනත මිහිර
තුන්ලොව තිලක බුදු පදවිය වෙත නැඹුර
අභිතව පාරමී පිරුවා දුක් සසර

බුදුබව ලැබීමට පිරිපුන් බෝ සතුට
දෙව්ලොව තුසිතයේ වැඩ වෙසෙනා කලට
පෙළඹුව ඇරැයුමෙන් වැඩුමට මනු ලොවට
සැළකුව සුදුසුකම් පස සුසැදුනි යසට

සුදොවුන් රජුට ද මහමයා කුසට
වීයෙන් දෙව් ලොවින් බෝසත් පෙර පිනට
දෙවියන් සාදු නද සක්වල එකළුකොට
කුමරුන් බිහිවුනා වෙසගේ පෝ දිනට

කම්සැප උපරිමෙන් විඳ රජ මාලිගයෙන්
ඉන් දුක මිසක් සැපයක් නැතිබව තරයෙන්
සිතුමක එලය හරයක් සෙව්මට තිරයෙන්
පැතුමක බලය සමුගති ගිහි ජීවිතයෙන්

සසරෙන් මිදීමට හරි මග සොයන්නට
වසරින් සයක් ගතවුනි දුක් විඳින්නට
සැපතින් දුකින් තොරවී ජය ලබන්නට
මැදකින් ගමන් යා යුතු විය දැනෙන්නට

බැස යන දියේ තැබු තම පත උඩු ගමට
සුසැදි ගියේ පැතුමක් තතු හරි මගට
මරුවට බයේ නෙසෙළුනු බෝසත් හිමිට
වෙසඟක රැයේ වැටහුනි බුදු ඤාන සිතට

බුදු පදවිය දරා පන් සාලිස් වසර
බෙදු දම කම් දනවී කිසිවක් අත නොහැර
රුදු මුදු සතුන් වෙත වී කළණෝන් මිතුර
සිදු කළ මෙහෙය සත ගැලවූ දුක් සසර

පෙන්වා ගමන මැද මාවත යා යුතුය
බෙදුවා දහම චතු අරිසත් දත යුතුය
මුදවා සියල් සත දෙසු දම බලගතුය
සොඳවා මුනිදු වැඩි මග ගරු කටයුතුය

සිදුහත් කුමරු බිහිවීමයි බුදුවීම
මැදහත් ගමන හෙලි කළ බුදු පිරිනිවීම
වැදගත් තුන් මඟුල් වෙසඟේ සිදුවීම
හරවී දහම් මග යෑමයි ඇගැයීම

**කලාභූෂණ ජයසිරි අල්විස්**
සහකාර අධ්‍යක්ෂ (විශ්‍රාමික)
ශ්‍රී ලංකා පදනම් ආයතනය

## බෞද්ධාලෝක පුවත්







### සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ 92 වන වාර්ෂික මහා සභා රැස්වීම

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ 92 වන වාර්ෂික මහා සභා රැස්වීම මැයි මස 04 වන සෙනසුරාදා සම්මේලනයේ ගරු සභාපති ජගත් සුමතිපාල මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මෙම රැස්වීමේ මුලසන හොබවන ලද්දේ කොළඹ නව කෝරලයේ අධිකරණ සංඝනායක සද්ධර්ම කීර්ති ශ්‍රී ත්‍රිපිටකාචාර්ය පූජ්‍ය දිවියාගහ යසස්සි නායක ස්වාමීන් වහන්සේ විසිනි. මෙම අවස්ථාවට හිටපු සභාපති ආචාර්ය කලාසූරි ප්‍රණීත් අභයසුන්දර මහතා ඇතුළු සමමේලනයේ සාමාජිකයන් විශාල පිරිසක් සහභාගි වූහ.






### අන්තර් ආගමික සංසදයේ විශේෂ මාධ්‍ය හමුව

අප්‍රේල් 21 වන පාස්කු ඉරිදා දින ඉස්ලාමීය අන්තවාදීන් ත්‍රස්ත කල්ලියක් විසින් එල්ල කළ ම්ලේච්ඡ ප්‍රහාරය සම්බන්ධව අන්තර් ආගමික සංසදයේ විශේෂ මාධ්‍ය හමුවක් පසුගිය 28 වන දින සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේදි පැවැත්විණ.

## බෞද්ධාලෝක පුවත්













### සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ වාර්ෂික බක්මහ උළෙල

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ජාතික ළමා රක්ෂක මණ්ඩලය මගින් පාලනය වන ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හි දරු දැරියන්ගේ සහභාගිත්වයෙන් සිංහල අවුරුදු චාරිත්‍ර හා ජනක්‍රීඩා පවත්වමින් ඒ පිළිබඳව අවබෝධයක් ලබා දීම සඳහා බක්මහ උළෙල 2019 අප්‍රේල් 10 වන දින සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලන භූමියේදී පවත්වන ලදී.

# බෞද්ධාලෝක පුවත්














**රත්නපුර සහ අටකලම්පන්න ප්‍රදේශයේ පිහිටා ඇති ඉඩකඩම් පරීක්ෂා කිරීම**

රත්නපුර අටකලම්පන්න ප්‍රදේශයේ පිහිටා ඇති ඉඩකඩම් නිරීක්ෂණය සඳහා අප්‍රේල් 09 දින ගරු සභාපතිතුමන් ඇතුළු නිලධාරි මණ්ඩලය සහභාගිවිය. රත්නපුර සී සමරතුංග ජ්‍යෙෂ්ඨ පුරවැසි කාන්තා නිවාසයේ නිරීක්ෂණ චාරිකාවට ද සහභාගි විය.

# බෞද්ධාලෝක පුවත්

## බෞද්ධ හිමිකම් කොමිෂන් සභාවේ සාක්ෂි විමසීම






රත්නපුර බෞද්ධ මන්දිරයේදී බෞද්ධ හිමිකම් කොමිෂන් සභාවේ සාක්ෂි විමසීම සිදු කළ අවස්ථාව










ඇඹිලිපිටිය ශ්‍රී බෝධිරාජාරාමයේ දී පැවැති බෞද්ධ හිමිකම් කොමිෂන් සභාවේ සාක්ෂි විමසීමක දී දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝ නායක ආචාර්ය පූජ්‍ය ඕමල්පේ සෝභිත හිමියන් ඇතුළු බොහෝ දෙනෙක් සාක්ෂි ලබාදීම සිදු කළ අවස්ථා

## සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයේ

# යාවජීව සාමාජිකත්වය හෝ සමිති සඳහා සාමාජිකත්වය ලබාගැනීමට...

- සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයෙහි යාවජීව සාමාජිකත්වය අවුරුදු 18 සම්පූර්ණ කළ ශ්‍රී ලාංකික බෞද්ධ පුරවැසියන්ට අයදුම් කළ හැකිය.
- ඔබගේ ප්‍රදේශයේ හෝ විහාරස්ථානයට අනුබද්ධව පවත්වාගෙන යන බෞද්ධ සමිති සඳහා ද සාමාජිකත්වය අයදුම් කළ හැකිය.
- සෙ. මී. 22 x 10 (අඟල් 9 x 4) ප්‍රමාණයේ දිග ලිපි කවරයක ඔබගේ නම ලිපිනය සඳහන් කර ඇති රු. 15 ක් වටිනා මුද්දර අලවා එම ලිපි කවරයේ උඩ කෙළවර නව අයදුම්පතක්" යනුවෙන් ද යාවජීව සාමාජිකත්වය හෝ 'සමිති සාමාජික' යන පදය ද සුදුසු පරිදි සඳහන් කර අප වෙත යොමු කිරීමෙන් අයදුම් පත් ගෙන්වා ගත හැක.

**ලේකම්**

**සාමාජික හා සමිති සංවර්ධනය පිළිබඳ ජාතික මණ්ඩලය**
**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
**380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**
**දුරකථන - 0112688517 / 0112691695**
**වෙබ් අඩවිය www.acbc.lk**

අයදුම්පත් පැමිණ හෝ අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබාගත හැකිය.

## සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ

# ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස සහ ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා දායකත්වයන් ලබාගැනීම

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මගින් පාලනය කරනු ලබන භික්ෂු විවේකාශ්‍රම ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස සහ ළමා සංවර්ධන මධ්‍යස්ථාන 27 ක් ඇත.

එම ආයතන සඳහා ඔබගේ දායකත්වයන් ලබාදීමට කැමැත්තක් දක්වන්නේ නම් අප වෙත යොමුවන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

**වැඩි විස්තර**
**www.acbc.lk වෙබ් අඩවිය**
**වෙත පිවිසීමෙන් ලබාගත හැකිය.**

*නැතිනම් පහත දුරකතන අංකවලින් විමසන්න.*

**දුරකථන : 0112 669017, 0112691695**

# සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානය

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මගින් බෞද්ධයනට එරෙහි ක්‍රියාවන් හා අන්‍යාගමිකකරණය පිළිබඳ තොරතුරු ඇතුළු තොරතුරු සොයා බලා කටයුතු කිරීම සඳහා 'බෞද්ධ තොරතුරු' මධ්‍යස්ථානය ස්ථාපිතව ඇත.**

වැඩි විස්තර

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**

380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
දුරකථනය : 0112 665047
ෆැක්ස් : 0112 665048
ජංගම දුරකථනය : 071 8645554

# සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
# ALL CEYLON BUDDHIST CONGRESS

## බෞද්ධ හිමිකම් කොමිෂන් සභාව
## BUDDHIST RIGHTS COMMISSION

1995 අංක 34 දරණ සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය නීතිගත කිරීමේ පනතේ 3 වැනි වගන්තියෙන් ප්‍රකාශිත සම්බුද්ධ ශාසනයේ හා බෞද්ධයින්ගේ අභිවෘද්ධිය සැලසීම, බෞද්ධයින්ගේ ගෞරවය සහ අයිතිවාසිකම් රැකගැනීම ආදි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, ශ්‍රී බුද්ධ වර්ෂ 24562 ක් වූ පොසොන් මස පුරා පසළොස්වක පොහෝ දින (2018 ජුනි මස 27 වන දින) ඓතිහාසික මිහින්තලාවේ ඉපැරණි ධාතු මන්දිර මළුවේදී, මහා සංඝරත්නයේ ආශිර්වාදයෙන් බෞද්ධ හිමිකම් කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී.

මෙම කොමිෂන් සභාව වෙත බෞද්ධ හිමිකම් සම්බන්ධව ගරුතර මහා සංඝරත්නයට, මහජනතාවට, බෞද්ධ සංවිධානවලට, වෙනත් සංවිධාන සහ සමිති සමාගම්වලට තම අදහස්, යෝජනා, පැමිණිලි හා සාක්‍ෂ්‍ය ලබාදීමට අපේක්‍ෂා කරන්නේ නම් එම සාක්ෂ්‍යය සැකෙවින් ලිඛිතව ඉදිරිපත් කළ යුතුවෙයි.

සාක්‍ෂ්‍ය ලබාදීමේදී ඔබේ අනන්‍යතාවය හා තොරතුරුවල රහස්‍යභාවය රැකගත යුතු බව සඳහන් කරන්නේ නම් කොමිෂන් සභාව එය තහවුරු කරනු ඇත.


**බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානය :**

**දුරකථනය : 011-2665047 ෆැක්ස් : 011-2665048 ජංගම : 0718645554**

**E-mail :** buddhistinfo380@gmail.com **Web :** www.acbc.lk

**අංක 380, බෞද්ධාලෝක මාවත, කොළඹ - 07.**



# බෞද්ධාලෝකය ~ බෞද්ධ සඟරාව ධර්ම දානයක් සේ පූජා කරන්න.



**ධර්ම ශ්‍රද්ධානය ලබාදීම අටමහා කුසල් අතරට අයත්ය. එහෙයින් පෝදා සිල් සමාදන්වන උපාසක උපාසිකාවන්ට ධර්මදානයක් ලෙසින් බෞද්ධාලෝකය සඟරාව පූජා කරන්න.**

සඟරා 50 ට
වඩා මිලදී ගැනීමේදී
15% සිට වට්ටම්

සඟරා 50 - 100 - 200 හෝ ඊට වැඩි වශයෙන් මිලදී ගෙන පූජා කිරීමට පුළුවන.

වෙනත් පිංකම්වලදීත් පූජා තිළිණයක් ලෙසින්, මෙම සඟරාව පූජා කරන්න.

සඟරා 800 වඩා මිලදී ගැනීමේදී ඔබේ පින් ප්‍රාර්ථනාවන් සඳහා එක් පිටුවක් වෙන් කෙරේ. ඒ සඳහා මුද්‍රණයට සති දෙකකට පෙර ඇණවුම යොමු කරන්න.

විස්තර
070 4422688

# වෙසක් පොසොන් සමයේ සිත නිවාගන්න දහම් දැනුම

• ලේඛකයන්, දාර්ශනිකයන්, බෞද්ධ, හින්දු, කතෝලික, මුස්ලිම්, ක්‍රිස්තියානි, මෙන්ම ලොව අපරාධකරුවන්, මතට ගොදුරු වූවන්, හොරුන්, කපටින් ඇතුළු ලොව සියලු දෙනා සිතන්නේ සිතිනි. මතක් කරගන්නේ මතක් වන්නේ මනසෙනි. ක්‍රියාවන් කරන්නේ කයිනි. වචනයන් පවසන්නේ මුවෙනි. ඒවා හොඳ හෝ නරක දේ වේ. ඒවා කරන අයට කිසිම ජාති, ආගම් භේදයකින් හා තරාතිරමකින් තොරව හොඳ දේට හොඳ විපාකත්, නරක දේට නරක විපාකත් කර්ම නියාම අනුව ලැබෙනු ඇත.

• ලොව සැමදෙනා සිතන්නේ සිතිනි. සිතන හොඳ සිතිවිලි කුසල්. නරක සිතිවිලි අකුසල්.

• කයින් වචනින් කරන හොඳ ක්‍රියා පින්. කයින් වචනින් කරන නරක ක්‍රියා පව්.

• ලොව සැමදෙනා මතක් කර ගන්නේ (මෙනෙහි කරන්නේ) මනසෙනි. ලොව සැමදෙනාටම මතක් වන්නේ (මෙනෙහි වන්නේ) මනසෙනි. හොඳ ඒවා කුසල්, නරක ඒවා අකුසල්.

## බුදුරජාණන් වහන්සේ දේශනා කළ සිතේ ඇතිවන හොඳ සිතිවිලි කුසල් වේ. (තම තමන් එකනෙහිම අත්විදින්නකි)

එනම් අලෝභ, අදෝෂ, අමෝහ. කරුණාව, මෛත්‍රිය, මුදිතාව, ඒවා සිතේ ඇතිවන විට ජාති ආගම් භේදයකින් තොරව එම සැමගේම එවලේ ම සිතේ සතුට, ප්‍රීතිය, ඇති වීමෙන් **ලේ පිරිසිදු වේ, ආතතිය දුරුවේ. මුහුණ පැහැපත් වේ.** සිතේ සතුට ඇති වන විට වෛද්‍ය විද්‍යාවට අනුව ශරීරයේ එන්ඩොෆින් නැමති හෝමෝනය වැඩියෙන් ස්‍රාවය වේ. එම හෝමෝනය මගින් ශරීරයේ ප්‍රධාන අවයවවල සහ පද්ධතිවල මනා ක්‍රියාකාරීත්වයක් ඇති කරවයි. එයින් **මානසික ආතතිය සංසිඳුවන අතර වේදනාව, දුක, කනගාටුව දුරු කරයි. ලේ පිරිසිදු වේ. නිරෝගී වේ. මුහුණ පැහැපත් වේ.**

## බුදුරජාණන් වහන්සේ දේශනා කළ සිතේ ඇතිවන නරක සිතිවිලි අකුසල් වේ. (තම තමන් එකනෙහිම අත්විදින්නකි)

එනම් ලෝභ, ද්වේෂ, මෝහ, තරහ, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, වෛර මේවා සිතේ ඇතිවන විට ජාති, ආගම් භේදයකින් තොරව එම සැමගේම සිතේ දුක, කනගාටුව, ආතතිය ඇති වී **ලේ අපිරිසිදු වේ. මුහුණ අවපැහැගැන් වේ.** සිතේ හටගන්නා කෝපය අකුසලයකි. **තද කෝපයක දී රුධිර සංසරණ වේගය වැඩිවේ.** අධික වේගය හේතු කොටගෙන පෙණහලු මගින් රුධිරයට ලැබෙන ඔක්සිජන් අවශ්‍ය ප්‍රමාණය උරා ගැනීමට ඉඩක් නොලැබේ. එවිට රුධිරයේ ඔක්සිජන් ප්‍රමාණය අඩු වී කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය වැඩිවේ. වැඩි කාබන්ඩයොක්සයිඩ් රෝම කූප මගින් පිට කිරීමේ දී කැසීම ඇතිවේ. කැසීමේ දී ඇතිවන තුවාල මත කාබන්ඩයොක්සයිඩ් තැවරීමෙන් දද, කුෂ්ඨ මෙන්ම පිළිකා ඇති වීමට හේතු වේ. අධික වේගයකින් රුධිරය ගලායාමේදී රුධිර නාළ පළල් වීමේදී ඒ දෙපස ඇති **සෙල තෙරපී හිසකැක්කුම, වෙව්ලීම වේදනා ඇතිවේ. ආහාර දිරවීමට අවශ්‍ය යුෂ නිපදවීමට රුධිරය නොලැබීම හේතු කොට ආහාර අජීර්ණ, උදරාබාධ, මල බද්ධය හේතු වේ.**

## චතුරාර්ය සත්‍යය යනු

දුක, දුකට හේතුව, දුක නැතිකිරීම, දුක නැති කිරීමේ මාර්ගයයි. මෙම හතර ගැන දැන ගැනීම, අවබෝධය ලැබීම සම්මා දිට්ඨිය ඇතිවීම.

• බුදු දහමේ චතුරාර්ය සත්‍යයේ පින් හතක් හා පව් හතක් පෙන්වා ඇත.

• බුදුරජාණන් වහන්සේ දෙසූ චතුරාර්ය සත්‍යය අනුව එහි පැහැදිලි කර ඇති ලෙසට මුවින් පවසන හොඳ වචන වන සම්මා වාචා මගින් සිදුවන පින් හතරකි. නරක වචන වන මිථ්‍යාවාචා මගින් සිදුවන පව් හතරකි.

• කයෙන් කරන හොඳ ක්‍රියා තුනකි. එනම් සම්මා කම්මන්ත මගින් කයින් කරන පින් තුනකි.

• කයෙන් කරන නරක ක්‍රියා තුනකි. එනම් මිථ්‍යා කම්මන්ත මගින් කයින් කරන පව් තුනකි.

• බුදු දහමේ සිතින් කෙරෙන කුසල් ඇත්තේ තුනකි. එසේම අකුසල් තුනකි. අපිරිසිදු සිතින් කරන ක්‍රියාවන් නිසා අකුසල් ඇතිවේ. එයින් මිදී පිරිසිදු සිතින් කරන ක්‍රියා නිසා කුසල් හට ගනී.


• දස කුසලයේ දී අනභිජ්ඣාව, අව්‍යාපාද, සම්‍යක්දෘෂ්ටි හා කුසල කර්ම පථ හත දස කුසල් වේ.

• දස අකුසලයේ දී අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි හා අකුසල කර්ම පථ හත දස අකුසල් වේ.

• කය හා වචනින් කරන්නේ පින් හා පව්. පින්වලින් යහපත් කර්ම ඇති වේ. පව් වලින් අයහපත් කර්ම ඇතිවේ. මේවා ජාති ආගම් භේදයකින් තොරව පින් කරන අයට පින් වලින් දිව්‍යසැප ස්වර්ග සම්පත් ලැබෙන අතර ජාති ආගම් භේදයකින් තොරව පව් කල අයට දුගතිය, අපාය දුක කනගාටුව ඇති වේ.

• සිදුහත් කුමරු උපදින්නටත් පෙර සිට ලොව තිබූ අකාලික සනාතන දහමේ කුසල් අකුසල් අද වගේම එදා ලෝ ජනතාව එදා අත්දැක්කත් ඒ ගැන ඔවුන්ට අවබෝධයක් තිබුණේ නැත. බුදුරජාණන් වහන්සේ බුදු වී ස්වයංභූඥානයෙන් ලොව අතුරුදහන්ව තිබූ සනාතන දහම අවබෝධ කර ගෙන ලෝක සත්වයාහට කරුණාවෙන් දේශනා කර ඇතත් පසුව වළගම්බා රජුගේ කාලයෙන් පසු රහතන්වහන්සේලා නැතිවූ දා සිට දහම වනගත වීමත්, දේශනා කරන හා අවබෝධ වූ භික්ෂූන් නුවර යුගය වනවිට නොමැති වීමත් නිසා **අද ලෝක ජනතාවගෙන් බොහෝ දෙනෙක් කුසල් අකුසල් ගැන දන්නේ නැත. එසේම කුසල් අකුසල්වල විපාක දන්නේ ද නැත. කුසල් අකුසල්වල විපාක එවලේම අත්විඳින බව දන්නේ ද නැත. බුදුරජාණන් වහන්සේ සර්වඥතා ඥානයෙන් අවබෝධ කරගත්, කවදත් ලොව තිබුණු, තිබෙන සනාතන දහම් දේශනා ධම්ම පදයේ ඇත. ඒවා විශ්වාසය නිසාවත් භක්තිය නිසාවත් පිළිගන්නා දේ නොව එදිනෙදා අත් විඳින දේවල් වේ. බුදු දහම තම තම නැණ පමණින් අවබෝධ වන්නකි. ඉහළ මට්ටමට නුවණ දියුණු කළ අයට ධර්මය ප්‍රත්‍යක්ෂ ලෙස අවබෝධ කළ හැකිය.**

**එකෙණෙහිම අත්විඳින කුසල් අකුසල්වල විපාක විස්තර දැන ගැනීමට බලාපොරොත්තුවන්නේ නම් ඒ සඳහා පහත සඳහන් පොත් බලා ඒවා දැනගන්න**

























**සීමාසහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

**පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10. දුරකතන: (011) 2685369, 2686925**